# SINHALESE GRAMMAR

## FOR USE IN SCHOOLS.

COMPILED BY

**Don Eustakius Johannes,**

Head Master of the Vernacular Branch of the Government Training College, Colombo, and author of a Physical Geography, &c.

---

# සිංහල ව්‍යාකරණ

පාඨශාලාවන්හි අභ්‍යාසය සඳහා

කොළඹ ගුරුවරුන් පුහුණුකරණ ශාස්ත්‍රශාලාවේ
සිංහල පඞ්ක්තියේ ප්‍රධානාචාර්‍ය්‍යවූද, ස්වාභාවික
භූගොල ශාස්ත්‍රාදි පොත් කළාවූද

**දොන් එවුස්තාකිවුස් ජොහන්නැස්**

විසින්

සඞ්ග්‍රහ කරණලදී.

ද්විතීය සංස්කරණය.

1906.

මිල ශත 50.

# SINHALESE GRAMMAR

## FOR USE IN SCHOOLS.

COMPILED BY

**Don Eustakius Johannes.**

Head Master of the Vernacular Branch of the Government Training College, Colombo, and author of a Physical Geography, &c.

# සිංහල ව්‍යාකරණය

[illegible]

[illegible]

[illegible]

1906.

# PREFACE.

THE Sinhalese Grammar called the 'Sidatsangara' was compiled by a learned Buddhist Priest, who presided over the Patiraja-Pirivena, a Buddhist college, some six hundred years ago. It has been taught by Sinhalese teachers to their pupils with respect and devotion ever since its compilation. Although the 'Sidatsangara' can be highly commended for the nice arrangement of its rules (sûtras) and examples, yet the language in which it is written is beyond the comprehension of beginners in grammar. I have therefore attempted in this work to provide those, who are as yet not acquainted with 'Elu' the ancient language of Ceylon, with a grammar written in language more familiar to them. This book consists of all the useful and important rules given in the 'Sidatsangara' as well as othre information essential to a knowledge of modern Sinhalese. Most of the grammars of Oriental languages give roots, genders &c. at the beginning of the book, but in this work I have given them in the latter part of it, as I consider such matter too difficult for beginners. The easier portions are placed at the beginning and the pupil is gradually led into the more difficu lt.

If grammatical terms, permutation, or any other portion is required to be taught first by the

Education Department, the selection of such portions can be easily made and taught.

I mention with thanks the kind help given me by The Reverend Thero H. Devamitto, Vice-Principal of the Vidyódaya College, Colombo, in examining the last proofs of this book while it was going through the press.

D. E. J.

TRAINING SCHOOL,
KANDY,
*20th July, 1902.*

Table of

# CONTENTS.


| CHAPTER. | | PAGE. |
|---|---|---|
| I. | THE ALPHABET ... ... | 1 |
| | Vowels and Consonants ... | 2 |
| | Their Classification ... | 3 |
| | Seats of their utterance &c. | 4 |
| | How words are divided into vowels and consonants | 5 |
| II. | PARTS OF SPEECH ... .. | 6 |
| III. | NOUN :— ... ... ... | 7 |
| | Classifications ... ... | ,, |
| | Gender ... ... ... | 8 |
| | Number ... ... | ,, |
| | Case :— ... ... | 9 |
| | 1 Nominative ... ... | ,, |
| | 2 Accusative ... ... | 10 |
| | 3 Instrumental... ... | 11 |
| | 4 Auxiliary ... ... | ,, |
| | 5 Dative ... ... | 12 |
| | 6 Ablative ... ... | ,, |
| | 7 Genitive ... ... | 13 |
| | 8 Locative ... ... | 14 |
| | 9 Vocative ... ... | ,, |
| | Declension ... ... | 15 |
| | Verbal Noun ... ... | 21 |
| | Adjective ... ... | 24 |
| | Pronoun ... ... | 25 |
| IV. | VERB. ... ... ... | 29 |
| | Person ... ... | ,, |
| | Tense... ... ... | 30 |
| | Transitive and Intransitive | ,, |

| Chapter. | | Page. |
|---|---|---|
| | Active Voice .— | |
| | Indicative Mood... ... | 32 |
| | Optative Mood ... ... | 35 |
| | Imperative Mood ... | 36 |
| | Causal Mood ... ... | 37 |
| | Conditional Mood ... | 38 |
| | Past Participle ... ... | 39 |
| | Present Participle ... | ,, |
| | Passive Voice ... ... | ,, |
| | Conjugation ... ... | 41 |
| | Auxiliary Verbs ... ... | 48 |
| | Participial Nouns... ... | ,, |
| | Nominal Verbs ... ... | 49 |
| V. | Relation between Verb & Karakas | 50 |
| VI. | Relation between Verb & Subject | 51 |
| VII. | Relation between Subject and Attributes. ... | 52 |
| VIII. | Indeclinables :— ... ... | 55 |
| | Particles ... ... | ,, |
| | Prepositions or Prefixes of Verbs | 57 |
| | Table of parsing ... ... | 59 B. |
| IX | Elision of Letters ... ... | 59 |
| | Substitution ... ... | ,, |
| | Form of the preceding letter | 60 |
| | Form of the following letter | ,, |
| | Augmentation ... ... | 61 |
| | Reduplication ... ... | ,, |
| | Metathesis ... ... | 62 |
| | Elongation ... ... | 65 |
| | Abbreviation ... ... | 66 |
| X. | Permutation ... ... | 67 |

| CHAPTER. | | PAGE. |
|---|---|---|
| XI. | COMPOUNDS :— | |
| | i. Determinative ... | 77 |
| | ii. Appositional & Numeral | 82 |
| | iii. Copulative ... ... | 83 |
| | iv. Relative ... ... | 84 |
| | v. Adverbial & other Compounds having indeclinable as the first member ... ... | 86 |
| XII. | ROOTS ... ... ... | 89 |
| XIII. | DERIVATIVES :— ... ... | 96 |
| | Derivatives from verbs ... | ,, |
| | Derivatives from nouns ... | 105 |
| XIV. | GENDER ... ... ... | 109 |
| | Masculine Nouns derived from Masculine Nouns ... ... | 110 |
| | Feminine Nouns derived from Feminine Nouns ... ... | ,, |
| | Masculine Nouns derived from Neuter Nouns ... ... | 111 |
| | Feminine Forms made from Verbal Nouns and Adjectives ... | 112 |
| | Feminine Forms made from Masculine Nouns ... ... | ,, |
| | Other Feminine Forms .. | 113 |
| | Feminine Forms made by Composition | 114 |
| | Examples illustrative of the use of Masculine and Feminine Nouns denoting inanimate objects ... | 116 |
| XV. | Mutable and Immutable Forms | 118 |
| | Exceptional Forms ... | 119 |
| XVI. | THE USE OF THE LETTER 'ಹ' (H) | 121 |
| XVII. | THE PROPER USE OF NASALS, LINGUALS &c. ... ... | 124 |

---

| | |
|---|---|
| Parsing in detail ... ... | 131 |
| Table of Parsing ... .. | 138 |
| Appendix (Grammatical Terms) | 139 |

B

# විඥප්තිය.

අවුරුදු හසියයකට පමණ පෙර විසූ පතිරජ පිරිවෙන් මාහිමි වියත් මහ තෙරුන්වහන්සේ කෙණෙකුන් විසින් සඞ්ග්‍රහ කරණලද 'සිදත්සඟරා' නම් සිංහල ව්‍යාකරණය එකල් පටන් අද දක්වා සෛංහලික ආචාර්ය්‍යයන් විසින් ගෞරවාදරයෙන් පිළිගෙණ ආධුනිකයන්ට පුහුණුකරවනු ලැබේ. ඒ ග්‍රන්ථය සූත්‍රොදාහරණාදිය සකාශේ යොදා ප්‍රශංසනීයාකාරයෙන් තනන ලද්දේවී නමුත් එහි භාෂාව මේ කාලයෙහි සිංහල බාලයන්ට සුඛාවබොධ නොවන හෙයින් ප්‍රථමකොට ඉගැන්වීම අපහසුයි. එලුව පුහුණුවෙන්ට පෙර බාලයන්ට ව්‍යාකරණ විධි ඉගැන්වීම අවශ්‍ය බැවින් ඒ 'සිදත්සඟරාවේ' දක්වනලද මාහැඟි උපදෙශ හා ව්‍යවහාර භාෂාවෙහි පවත්නා වෙනත් උපදෙස්ද පිළිවෙළින් සඞ්ග්‍රහකොට පහසුවූ භාෂාවෙන් මේ පොත ලියන ලද්දේය. බාලයන්ගේ අවබොධය පරමාර්ථකොට පොත සඞ්ග්‍රහකළ හෙයින් පහසු උපදෙස්වලින් පටන්ගෙණ ක්‍රමයෙන් අමාරුවිධි උගන්වනු ලැබේ. පෙරදිග භාෂාවන්ම ලියනලද බොහෝ ව්‍යාකරණ ග්‍රන්ථයන්හි පූර්වභාගයෙහි ප්‍රකාශිත ප්‍රකෘති ලිඞ්ගාදිය මෙහි අවසාන භාගයෙහි යොදනලද්දේ ව්‍යාකරණ උගන්නා බාලයන්ට පටන්ගැන්මේදී එහි විභාග අවබොධකරවීම අපහසු බැවිනි. සංඥා නාම හෝ සන්ධි විධිය හෝ වෙනයම් කොටසක් පළමුකොට පඨකාර්ථියකට උගන්වන්ට ඉගැන්වීමේ දෙපාර්තමේන්තුවෙන් නියමකරණලද්දේ නම් මේ පොතෙහි ඒ පරිච්ඡේද තෝරගෙණ පළමුවෙන් ඉගැන්වීමට කිසි අපහසුවක් නොවේ.

කොළඹ විද්‍යෝදය පිරිවෙණෙහි උප ප්‍රධාන තැන්පත් ආචාර්ය්‍ය හෙයියන්තුඩුවේ දේවමිත්ත ද්විතීය නායක ස්ථවිරයන්වහන්සේ කරුණාවෙන් මෙහි අවසාන ශුද්ධිපත්‍රාවලොකනය කොට ශුද්ධකර දුන් බැව් ස්තුති පෙරදැරිව සඳහන්කරමි.

දේ. ඒ. ජේ.

වර්ෂ 1902 ක්වූ ජූලිමස 20 වෙනි
දින සෙංකඩගල ගුරුවරුන් පුහු
ණු කරණ ශාස්ත්‍රශාලාවේදීය.

---

## ශු ද්ධි ප ත්‍ර ය.

| පිට. | පෙළ. | වරද. | නිවරද. |
|---|---|---|---|
| 31 | 21 | කැපී | කැපි |
| ,, | 22 | ගිලී | ගිලි |
| 48 | 27 | ලිඩගස | ලිඩගය |
| 58 | 6 | වීලස් | විලස් |
| 75 | 4 | පාපිවිශ්වර | පෘපිවීශ්වර |
| ,, | 20 | ඓශ්වය්‍ය | ඓශ්චය්‍ය |
| ,, | 28 | අථ—විභක්ත්‍යථ | අර්ථ—විභක්ත්‍යර්ථ |
| 76 | 6 | තත්වඩනී | තත්වඥනී |
| 79 | 15 | ධානාක්ෂථ | ධානාක්ෂර්ථ |
| 98 | 7 | අථයෙනි | අර්ථයෙහි |
| ,, | 26 | ප්‍රත්‍යයාට | ප්‍රත්‍යයාර්ථ |
| ,, | 30 | සනා | ඝනා |
| 123 | 18 | හසල | හසළ |
| 127 | 11 | ප්‍රාණ | ප්‍රාණ |
| 132 | 12 | වනිජ් | වණිජ් |
| 138 B. | 10නිරු. | පිවිසදු | පිවිසඳු |
| ,, | 16නිරු. | විශෙෂණස | විශෙෂණයි |

# සූචිපත්‍රය.


| පරිච්ඡේදය. | | පිට. |
|---|---|---|
| I. | හෝඩිය | 1 |
| | ස්වර හා ව්‍යඤ්ජන | 2 |
| | ඒවායේ බෙදුම් | 3 |
| | ඒවායේ උත්පත්තිස්ථාන ආදිය | 4 |
| | ගතකුරු පණකුරු වෙන්කරණ පරිදි | 5 |
| II. | පද | 6 |
| III. | නාම:— | 7 |
| | එහි ප්‍රභේද | ,, |
| | ලිඞ්ගභේදය | 8 |
| | සඞ්ඛ්‍යාභේදය | ,, |
| | විභක්ති:— | 9 |
| | 1 ප්‍රථමා | ,, |
| | 2 කර්ම | 10 |
| | 3 කර්තෘ | 11 |
| | 4 කරණ | ,, |
| | 5 සම්ප්‍රදාන | 12 |
| | 6 අවධි | ,, |
| | 7 සම්බන්ධ | 13 |
| | 8 ආධාර | 14 |
| | 9 ආලපන | ,, |
| | වරනැගිලි | 15 |
| | ක්‍රියා ශබ්ද | 21 |
| | ගුණ ශබ්ද | 24 |
| | සර්වනාම | 25 |
| IV. | ක්‍රියා. | 29 |
| | පුරුෂය | ,, |
| | කාලය | 30 |

| පරිච්ඡේදය. | | පිට. |
|---|---|---|
| | සකර්මක හා අකර්මක භේදය | 30 |
| | කර්තෘකාරක ක්‍රියා (ත්‍රෛකාලික) | 32 |
| | ආශිර්වාද ක්‍රියා .. ... | 35 |
| | විධි ක්‍රියා ... .. | 36 |
| | ප්‍රයෝජ්‍ය ක්‍රියා .. .. | 37 |
| | අසම්භාවනීය ක්‍රියා .. .. | 38 |
| | පූර්වක්‍රියා .. .. | 39 |
| | මිශ්‍ර ක්‍රියා .. .. | ,, |
| | කර්මකාරක ක්‍රියා .. .. | ,, |
| | වරනැඟිලි .. .. | 41 |
| | උපකාර ක්‍රියා .. .. | 48 |
| | අර්ථ ක්‍රියා .. .. | ,, |
| | නාමධාතුක ක්‍රියා .. .. | 49 |
| V. | ක්‍රියාකාරක සම්බන්ධය .. ... | 50 |
| VI. | උක්තානුක්ත විධිය ... ... | 51 |
| VII. | විශේෂණ විශේෂ්‍ය සම්බන්ධය ... | 52 |
| VIII. | අව්‍යය ශබ්ද:— ... ... | 55 |
| | නිපාත ... .. | ,, |
| | උපසර්ග ... ... | 57 |
| | වාක්‍යයක පදයන්ගේ ව්‍යාකරණ විභාග දක්වන ක්‍රමය | 59B |
| IX. | ලෝප විධිය ... ... | 59 |
| | ආදේශ විධිය ... ... | ,, |
| | පූර්වරූප විධිය ... ... | 60 |
| | පරරූප විධිය ... ... | ,, |
| | ආගම විධිය ... ... | 61 |
| | ද්විත්වරූප විධිය ... ... | ,, |
| | විපර්යාසය ... ... | 62 |
| | වෘද්ධිය ... ... | 65 |
| | හානිය ... ... | 66 |
| X. | සන්ධි ... .. | 67 |
| XI. | සමාස:— .. .. | 77 |
| | 1 විභක්ති සමාස .. .. | ,, |
| | අලුප්ත සමාස .. .. | 81 |

| පරිච්ඡේදය. | | පිට. |
| --- | --- | --- |
| | II විශෙෂණ සමාස ... ... | 82 |
| | III දකාරාර්ථ සමාස — ... | 83 |
| | IV අන්‍යාර්ථ සමාස ... ... | 84 |
| | V අව්‍යය සමාස ... . | 86 |
| XII. | ප්‍රකෘති ... ... | 89 |
| XIII. | ප්‍රත්‍යයාර්ථ ශබ්ද ... ... | 96 |
| | කෘදන්ත ... ... | ,, |
| | තද්ධිත ... ... | 106 |
| XIV. | ලිඞ්ග ... ... | 109 |
| | පුරුෂවාචී ශබ්දයන්ගෙන් භින්නවූ .. පුරුෂවාචී ශබ්ද .. .. | 110 |
| | ස්ත්‍රීවාචී ශබ්දයන්ගෙන් භින්නවූ ස්ත්‍රී වාචී ශබ්ද .. .. | ,, |
| | නපුංසකවාචී ශබ්දයන්ගෙන් භින්නවූ පුංලිංගික ශබ්ද .. .. | 111 |
| | අර්ථ ක්‍රියා ශබ්දයන්ගෙන් හා ගුණශබ්ද යන්ගෙන් සෑදූ ස්ත්‍රීවාචී ශබ්ද .. | 112 |
| | පුංලිංගික ශබ්දයන්ගෙන් සෑදූ ස්ත්‍රීවාචී ශබ්ද .. .. .. | ,, |
| | වෙනත් ස්ත්‍රීවාචී ශබ්ද .. ... | 113 |
| | සමාස කිරීමෙන් සෑදූ ස්ත්‍රීවාචී ශබ්ද | 114 |
| | අප්‍රාණි ද්‍රව්‍යවාචීවූ පුංලිංගික ශබ්ද හා ස්ත්‍රීලිංගික ශබ්දයන්ගේ ව්‍යවහාරයට නිදර්ශන .. .. | . 116 |
| XV. | නියම අනියම විධි ... ... | 118 |
| | අවිද්‍යමාන විධි .. ... | 119 |
| XVI. | 'හ'කාර ව්‍යවහාරය . .. | 121 |
| XVII. | අනුනාසික මූර්ධජාදි අක්ෂරයන්ගේ යොග්‍ය ව්‍යවහාරය ... | 124 |
| | වාක්‍යයක පද සම්බන්ධය හා පදසිද්ධිය ... අන්වය ක්‍රමය ... ... | 131 |
| | කවියක් පදච්ඡේදකොට පද විභාගාදිය දැක්වීම ... ... | 138 |
| | උපග්‍රන්ථය (සංඥා නාම) ... ... | 139 |

# SINHALESE GRAMMAR.

# සිංහල ව්‍යාකරණ.

ව්‍යාකරණ නම් භාෂාවක යහපත් ශබ්ද අයහපත් ශබ්දයන්ගෙන් වෙන්කොට ඒ ශබ්දයන්ගේ මනා ව්‍යවහාරය ප්‍රකාශකරන්නාවූ නොහොත් භාෂාවක් යොග්‍ය පරිද්දෙන් ලියන්ට කියන්ට උගන්වන්නාවූ ශාස්ත්‍රයයි. මෙපරිද්දෙන් සිංහල භාෂා ව්‍යවහාරය උගන්වන ශාස්ත්‍රය සිංහල ව්‍යාකරණ නම් වේ.

## I.

## THE ALPHABET.

## හෝඩිය.

සිතෙහි හටගත් අර්ථයක් අප විසින් කියනලද්දූවූ හෝ ලියනලද්දූවූ වාක්‍යයෙකින් අන්‍යයන්ට ප්‍රකාශ කරණුලැබේ. වාක්‍යයක් නානාපදයන්ගෙන් යුක්ත වේ. එක එක පදයක් අප විසින් නගන්නාවූ එක ශබ්දයෙකින් හෝ ශබ්ද කීපයක් එක්වීමෙන් සෑදෙයි. අපගේ අභිප්‍රාය ලිවීමෙන් දක්වන්ට වුවමනා කල්හි අප විසින් නගන්නාවූ විවිධශබ්ද විවිධාකාර රූපවලින් හඟවනු ලැබෙත්. මේ රූපයෝ අක්ෂර හෙවත් වර්ණ නම් වෙත්. මේ වර්ණයන් හඳුන්වන පිළිවෙළ හෝඩියයි කියනුලැබේ.

## ව්‍යවහාර සිංහල හෝඩිය මෙසේය.

**අ ආ ඉ ඊ උ ඌ ඍ ඎ ඏ ඐ එ ඓ ඔ ඖ (අ)ං (අ)ඃ**

**ක ඛ ග ඝ ඞ ච ඡ ජ ඣ ඤ ට ඨ ඩ ඪ ණ ත ථ ද ධ න**

**ප ඵ බ භ ම ය ර ල ව ශ ෂ ස හ ළ.***

මෙහි අයන්න පටන් ඖයන්න කෙළවරකොට ඇති අක්ෂරයෝ ස්වර නොහොත් ප්‍රාණාක්ෂර (පණකුරු) නම් වෙති. කයන්න පටන් ළයන්න කෙළවරකොට ඇති අක්ෂරයෝද අනුස්වාර නම්වූ බින්දුව (ං) ද විසර්ජනීය නම්වූ බින්දුදෙක (ඃ) ද ව්‍යඤ්ජන නොහොත් ගාත්‍රාක්ෂර (ගතකුරු) නම් වෙති.

ක ඛ ආදියෙහි යහපත් සෙයින් කියවෙන පිණිස නිතරම අකාරයක් ඇතැයි සැලකියයුතු, ඒ ස්වරය පහකළ ගාත්‍රාක්ෂර 'හල්' † අකුරුයයි ව්‍යවහාරයි.

යම් හල් අකුරක් හෙවත් ස්වර රහිත ව්‍යඤ්ජනයක් අන්‍ය ව්‍යඤ්ජනයකට පූර්වයෙන් සිටිකල ඊට

---

* මේ හෝඩිය අප රට ව්‍යවහාරවූ සංස්කෘත හෝඩියයි. එලුවෙස් හෙවත් ශුද්ධ සිංහල හෝඩියෙහි අක්ෂරයෝ නම්:

අ ආ ඉ ඊ උ ඌ එ ඒ ඔ ඕ, ක ග ජ ට ඩ ණ ත ද න ප බ ම ය ර ල ව ස හ ළ (අ)ං යන මොහුයි.

සංස්කෘත භාෂාවෙහි දැනට ව්‍යවහාර හෝඩිය අප රට ව්‍යවහාර හෝඩියෙන් මදක් වෙනස් හෙයින් එයද මෙහි දක්වනුලැබේ.

එනම්: අ ආ ඉ ඊ උ ඌ ඍ ඎ ඏ ඐ එ ඓ ඔ ඖ.

ක ඛ ග ඝ ඞ ච ඡ ජ ඣ ඤ ට ඨ ඩ ඪ ණ ත ථ ද ධ න ප ඵ බ භ ම ය ර ල ව ශ ෂ ස හ ං ඃ.

සංස්කෘත හෝඩියෙහි ඇති ඍ ඎ ඏ ඐ ඓ ඖ ශ ෂ ඃ යන අකුරු පමණක් පාලි නොහොත් මාගධී හෝඩියෙහි නැත්තාහ. ළ කාරය එහි තිබේ.

† ඇතැම්විටෙක සමහරු ඊට 'අල්' අකුරුයයි කියතත් එය සුදුසුනොවේ.

‘සංයොග’ යන නම කියනුලැබේ. අඞ්ග යන්නෙහි හල් නායන්නද, භිත්ති යන්නෙහි හල් තායන්නද මෙනි.

## ස්වර විභාග.

යටකී ස්වරයෝ හ්‍රස්ව දීර්ඝ නොහොත් ලඝු ගුරු යයි ද්විවිධ වෙත්.

අ ඉ උ ඍ ඏ යන මොහු හ්‍රස්වයෝය, ආ ඊ ඌ ඎ ඐ ඒ * ඓ ඕ ඖ යන මොහු දීර්ඝයෝය.

## ව්‍යඤ්ජන විභාග.

ගාත්‍රාක්ෂර ක වර්ග, ච වර්ග, ට වර්ග, ත වර්ග, ප වර්ග යයි වර්ග පසකටද සෙස්සෝ අන්තඃස්ථ, ඌෂ්ම යන දෙකොටසකටද බෙදනලද්දෝය.

ක ඛ ග ඝ ඞ යන පස ක වර්ග නම් වේ.
ච ඡ ජ ඣ ඤ ... ... ච වර්ග නම් වේ.
ට ඨ ඩ ඪ ණ ... ... ට වර්ග නම් වේ.
ත ථ ද ධ න ... ... ත වර්ග නම් වේ.
ප ඵ බ භ ම ... ... ප වර්ග නම් වේ.
ය ර ල ව යන සතර අන්තඃස්ථ නම් වෙත්.
ශ ෂ ස හ ... ඌෂ්මාක්ෂරයෝ නම් වෙත්.

ඛ ඝ ඡ ඣ ඨ ඪ ථ ධ ඵ භ ශ ෂ ස හ මොහු මහා ප්‍රාණ නම් වෙත්. සෙස්සෝ අල්ප ප්‍රාණ නම් වෙත්.

ගාත්‍රාක්ෂරයෝ ඝෝෂාඝෝෂයයි දෙකොටසකටද බෙදනලදහ. එනම් වර්ගයන්ගේ පළමුවන දෙවන අකුරුද ශ ෂ ස යන තුණද විසර්ජනීයද අඝෝෂාක්ෂරයෝ වෙති. සෙස්සෝ ඝෝෂාක්ෂරයෝ වෙති.

---

* එළුවෙහි එයන්න සහ ඔයන්න හ්‍රස්ව සහ දීර්ඝවශයෙන් සතරකි. ඒ දෙක හ්‍රස්වවූ කල එ, ඔ යන ලක්ෂණයෙන්ද දීර්ඝවූ කල ඒ ඕ යන ලක්ෂණයෙන්ද ලියනුලැබේ. සංස්කෘත භාෂාවෙහි හ්‍රස්ව එ ඔ නැති බැවින් දීර්ඝ බැව් හඟවන ලකුණ නැතිවද ඒ දෙක දීර්ඝ කොටම ගනිති.

## අකුරු උපදින තැන්.

අක්ෂරයෝ නානා ස්ථානවලින් උපදිත්. එනම්:

ක වර්ගයද අ ආ හ (අ)ඃ යන හතරද උගුරෙහි උපදිති. එබැවින් ඔහු කණ්ඨජ නම් වෙත්.*

ච වර්ගයද ඉ ඊ ය ශ යන හතරද තල්ලෙහි උපදිති. ඔහු තාලුජ නම් වෙත්.

ට වර්ගයද ඍ ඎ ර ෂ ළ යන පහද මූදුනෙහි උපදිත්, ඔව්හු මූර්ධජ නම් වෙත්.

ත වර්ගයද ඏ ඐ ල ස යන හතරද දත්වල උපදිත්, ඔව්හු දන්තජ නම් වෙත්.

ප වර්ගයද උ ඌ යන දෙකද තොල්වල උපදිත්, ඔව්හු ඔෂ්ඨජ නම් වෙත්.

එ ඓ දෙක උගුරෙහිද තල්ලෙහිද උපදිත්, ඔහු කණ්ඨතාලුජ නම් වෙත්.

ඔ ඖ දෙක උගුරෙහිද තොල්වලද උපදිත්, ඔහු කණ්ඨෞෂ්ඨජ නාම් වෙත්.

ව යන්න දත්හිද තොල්හිද උපදී, එය දන්තෝෂ්ඨජ නම් වේ.

ඞ ඤ ණ න ම යන වර්ගාන්ත පස ගටකී සවකීය ස්ථානවලද නාසිකාවෙහිද උපදින හෙයින් අනුනාසිකාක්ෂරයයි † කියනුලැබෙත්.

අනුස්වාර නම් (ං) බින්දුවද ‡ නාසිකාවෙහි උපදී, ඊට අනුස්වාර නම් වූයේ එය නිතරම ස්වරයකට පසුව සිටිනා බැවිනි.

---

* සිද්ධි ව්‍යාකරණ පොතක මොවුන්ගෙන් අ ආ හ පමණක් කණ්ඨාක්ෂරයන් කොටද ක වර්ගය ජිහ්වාමූලීයාක්ෂරයන් කොටද කියනලදහ. විසර්ගය අශ්‍රයස්ථානභාගී යයි කියනු ලැබේ.

† සමහරවිට සානුනාසිකාක්ෂරයයිද කියති.

‡ අනුස්වාරයට මාගධී ව්‍යාකරණයෙහි නිග්ගහීතයයිද කියනුලැබේ.

අකුරු උපදීමට කාරණ නොහොත් උපකාරවන තැන්.

ඉ ඊ ච ඡ ජ ඣ ඤ ය ශ යන තල්ලේ උපදින අකුරුවලට දිව මැද කාරණයි.

ඍ ඎ ට ඨ ඩ ඪ ණ ර ෂ ළ යන මුදුනේ උපදින අකුරුවලට දිවඅගලඟ කාරණයි.

ඏ ඐ ත ථ ද ධ න ල ස යන දත්වල උපදින අකුරුවලට දිවඅග කාරණයි.

ඉතිරි සියලු අකුරුවලට ඒ ඒ අකුරු උපදින තැන්ම කාරණයි.

මාගධ සංස්කෘතාදි භාෂාවන්හි නැති ඇ ඈ නම් ස්වර දෙකක් සහ අඞී බින්දුවක්ද සිංහලෙහි ව්‍යවහාරයි. අඞී බින්දුව ග, ඩ, ද, බ යන අක්ෂරයන්ට පූර්වයෙන් සිටි, එය ගයන්නට පූර්වයෙන් සිටි කල අනුස්වාර අඞීයයි කියාද ඩයන්නට පූර්වයෙන් සිටි කල ණකාරයාගේ අඞියෙකැයි කියාද දයන්නට පූර්වයෙන් සිටිකල නකාරයාගේ අඞියෙකැයි කියාද සලකනුලැබේ. මේ බින්දු අඞීය බකාරයාට පූර්වයෙන් එනකාල එහි රූපය වෙනස්කොට මකාරයාගේ පූර්වාර්ධය බකාරයාට සම්බන්ධකොට ලියනුලැබේ. උදාහරණ: ගඟ, දඬු, කඳු, අඹ ආදියෙහි මෙනි.

### පදවල ගතකුරු පණකුරු වෙන්කොට දක්වන පරිදි.

| | |
|---|---|
| දුක්පත් —ද්උක්ප්අත් | වැදෑරුම් —ව්ඇද්ඈර්උම් |
| ත්‍යාග —ත්ය්ආග්අ | ප්‍රත්‍යුත්තර =ප්ර්අත්ය්උ[illegible]ර්අ |
| ස්ත්‍රී —ස්ත්ර්ඊ | පූර්ණ —ප්ඌර්ණ්ණ්අ |
| තෘෂ්ණා—ත්ඍෂ්ණ්ආ | සංවේග —ස්අංව්ඒග්අ |
| කෞමද— ක්ඖම්අද්අ | පියානෝ=ප්ඉය්ආන්ඕ |

# II.

# PARTS OF SPEECH.

## පද.

වාක්‍ය සෑදෙන පද චතුර්විධයි. එනම් නාම, ක්‍රියා නොහොත් ආඛ්‍යාත, නිපාත සහ උපසර්ග යන මොහුයි.

නාම පද නම් ප්‍රාණ ඇති හෝ නැති හෝ යම් දෙයක් හැඳිනගැන්ම පිණිස ව්‍යවහාරකාරණ නාමයි. උදාහරණ: රජ, බල්ලා, අඹ, ගෙල, ලිඳ ආදියයි.

ක්‍රියාපද නම් කිරීම, විදීම, වීම, ආදිය හඟවන පදයි. උදාහරණ: දිවිමි, ඇඬයි, කරන්නෙහි, බලව යනාදියයි.

නිපාතපද නම් නාමපදයක් ක්‍රියාපදයක් නොවන්නාවූ වාක්‍ය සම්පූර්ණ කිරීමාදිය පිණිස එහි මුලට අගට අතරට දමන විචිත්‍රාර්ථ ඇති පදයි. උදාහරණ: සහ, හෝ, පිණිස, ආදියයි.

උපසර්ගපද නම්, යම් ධාතුවක * අර්ථය අලඞ්කාර කිරීමට හෝ බාධාකිරීමාදියට එහි මුලට දමන අකුරුයි. උදාහරණ: '**දු**'සිරි, '**පැර**'දෙන්නෙ, '**සන්**'තොෂ '**අව**'වාද ආදියයි.

---

* ධාතුව නම් ක්‍රියාපදයක මූලස්වභාවය. කරන්නේ යන ක්‍රියාවෙහි 'කර' යනුද, යමි යන ක්‍රියාවෙහි 'යා' යනුද, 'දුන්නෙහි යන ක්‍රියාවෙහි 'දු' යනුද ධාතූහු වෙත්.

# III.

# NOUN.

# නාම.

### FIVE CLASSES OF NOUNS.

### පඤ්චවිධ ශබ්ද.

ශබ්දයෝ † ජාතිශබ්දය ද්‍රව්‍යශබ්දය ගුණශබ්දය සංඥාශබ්දය ක්‍රියාශබ්දයයි පඤ්චවිධ වෙත්.

ඉපදීමෙන් ලැබෙන නාමය ජාති නාම් වේ. උදාහරණ: මිනිස්, ගව, කුකුළු ආදියයි.

ගුණ ආදියට ආධාරවූයේ ද්‍රව්‍ය නාම්වේ. උදාහරණ: පොත්, පුටු, පහන්, ආදියයි.

ද්‍රව්‍යයක් ආශ්‍රයකොට පෙරළෙන ස්වභාව ඇත්තේ ගුණ නාම් වේ. උදාහරණ: සුදු, මහත්, මොළොක් ආදියයි.

යමෙක් හෝ යමක් ඒ සමානවූ අනික් වස්තූන්ගෙන් වෙන්කරගැණීම පිණිස පණවනලද නාමය සංඥා නාම් වේ. උදාහරණ: අන්තෝනි, ලපයා, ගාල්ල යනාදියයි.

ක්‍රියාශබ්ද විවිධ වේ. යම් ක්‍රියාවකින් ක්‍රියාව කරන්නා හෝ කරණලබන දෙය හැඟේනම් එය අපීක්‍රියා නාම් වේ. උදාහරණ: දුවන්නා, විකුණන්නා, බැඳුනේ, සෙවුනී ආදියයි.

යම් ක්‍රියාවකින් ක්‍රියා මාත්‍රය පමණක් හැඟේ නම් එය භාවක්‍රියා නාම් වේ. උදාහරණ: හැඬුම්, නැටිලි, කරණු ආදියයි.

### THREE DIVISIONS OF NOUNS.

### ශබ්දයන්ගේ ත්‍රිභේදය.

සියලු නාමයෝ අනාවර්ජීය, ඇරුඪිය, අනුකරණයයි නැවත තුන් කොටසකට බෙදනු ලැබෙත්.

---

† විභක්තීන් වසින් ආශ්‍රයකරණු ලබන්ට පෙර, නාමයන්ට ශබ්දයයි කියනුලැබේ.

අර්ථයක් ආරම්භකොට උපන් නාමය අන්වර්ථ නාම වේ. උදාහරණ: දිව්යුරු (දිවාලංකාරණ හෙයින් ස්ත්‍රියාට නාම.)

අර්ථය නොසලකා හෝ අර්ථයට විරුද්ධව ව්‍යවහාර කරණුලබන නාමය ආරූඪ නාම වේ. උදාහරණය: මගුල් (අශුභවූ අඟහරු නාම ග්‍රහයාටනාම.)

ඇහෙන්නාවූ හඬබලා දෙන නාමය අනුකරණ නාම වේ. උදාහරණය: කිකිණි (කිඞ්කිණි) (කිණි යන හඬ නගින හෙයින් රසුවලට නාම වේ.

## GENDER.

## ලිඞ්ගභේදය.

යම් නාමයෙකින් පුරුෂයෙක් හඟවන කල්හි එය පුරුෂවාචක ශබ්දය නොහොත් පුංලිඞ්ගික ශබ්දයයි කියනුලැබේ. උදාහරණ: පියා, දසයා, කුකුළා.

යම් නාමයකින් ස්ත්‍රියක් හඟවන කල්හි එය ස්ත්‍රීවාචක ශබ්දය නොහොත් ස්ත්‍රීලිඞ්ගික ශබ්දයයි කියනුලැබේ. උදාහරණ: මව්, දසී, කිකිළි.

ස්ත්‍රීලිඞ්ගික පද හැඳිනගැන්මට එබදු පදනාත යෙහි බොහෝවිට ඉකාර හෝ ඊකාර සම්භවේ.

## NUMBER.

## සඞ්ඛ්‍යාභේදය.

යම් පදයෙකින් එක දෙයක් හෝ එක්කෙණෙක් හඟවන කල්හි ඊට එකාර්ථ හෙවත් එක වචනයයි කියනුලැබේ. උදාහරණ: ගොනා, දරුවා, කෙත.

යම් පදයෙකින් එක දෙයකට හෝ එක්කෙණෙකුට වැඩි ගණනක් හඟවා නම් ඊට බහ්වර්ථ

හෙවත් බහු වචනයයි කියනුලැබේ. උදහරණ: ගොන්නු, දරුවෝ, කෙත්.

වී, වැලි, දිය ආදි සමහර පදයන්ට සංඛ්‍යාභෙද යක් නොපෙණේ.

CASE.

## විභක්ති.

නාමයක අගින් සිට එහි අර්ථය නොයෙක් අනට හරවන්නේ නොහොත් බෙදන්නේ විභක්ති නම් වේ.

සිංහල භාෂාවේ එබඳු විභක්ති නවයක් ඇත් තේය. එනම්:

| | | |
|---|---|---|
| 1 | ප්‍රථමා විභක්තිය හෙවත් එලුබසින් | පෙරවිබත් |
| 2 | කර්ම විභක්තිය ... ... ... | කම්විබත් |
| 3 | කර්තෘ විභක්තිය ... ... ... | කතුවිබත් |
| 4 | කරණ විභක්තිය ... ... ... | කරණවිබත් |
| 5 | සම්ප්‍රදාන විභක්තිය ... ... ... | සපදන්විබත් |
| 6 | අවධි විභක්තිය ... ... ... | අවදිවිබත් |
| 7 | සම්බන්ධ විභක්තිය ... ... ... | සබදවිබත් |
| 8 | ආධාර විභක්තිය ... ... ... | අදරවිබත් |
| 9 | ආලපන විභක්තිය ... ... ... | අලප්විබත් |

1. NOMINATIVE CASE.

## ප්‍රථමා විභක්තිය.

පදාර්ථයක් උක්තවන කල්හිද ලිඞ්ගාර්ථයෙහිද ප්‍රථමා විභක්ති වේ. එහි ඒ,ආ, දෙක ඒකවචන හඳුන්වන විභක්තිරූපයෝ වෙත්. ඕ, හු දෙක බහුවචන හඳුන්වන විභක්තිරූපයෝයි.

උක්තාර්ථයෙහි ඒක වචනයේ උදහරණය: **වඩුවා** පුටුවක් තනී. බහුවචනයේ උදහරණය: **ගොවියෝ** කුඹුර වපුරති.

ක්‍රියා සම්බන්ධයක් නැති ලිඞ්ගාර්ථයෙහි ප්‍රථමාවට උදාහරණ: රජ, මව්, පොත්, ගේ ආදියයි.

## 2. ACCUSATIVE CASE.

## කර්ම විභක්තිය.

කර්තෘහු විසින් කරණ ක්‍රියාව හා යුක්තවූ පදාර්ථය කර්ම නම් වේ. එහි ඒකවචනයේ විභක්ති රූප: අ, උ, ආ, හු, ට, වෙත්.

බහුවචනයේ විභක්තිරූප: උන්, න, ආන, අන්, නට, න්, නන් වෙත්.

ඒකවචනයේ උදාහරණය: මිතුර **ගොනා** ගෙණවේය.

බහුවචනයේ උදාහරණය: බළල්ලු **මීයන්** අල්ලංකති.

මම සත් අවුරුද්දක් ඉංග්‍රීසි උගතිමි, කොදුවා සැතැප්මක් දිවී, යන වාක්‍යවල 'සත් අවුරුද්දක්' යන කාලයද 'සැතැප්මක්' යන මාර්ගයද ක්‍රියාවගේ පැවැත්ම හා නිරතුරු සම්බන්ධවූ බැවින් අත්‍යන්ත සංයොගයෙහි (අසන්යෝගි) කර්ම විභක්තියයි * කියනුලැබේ.

විනා, මිස, ආදි නිපාත හා යෙදෙන නාමපද බොහෝවිට කර්මවිභක්ති ගණීත්. උදාහරණ: රජෙකු නැස්මට තවත් **රජෙකු** විනා කවුරු පොහොසත් ද? මගේම **පොත** මිස අනිකක් නොගණිමි.†

---

* ගුණ හා ද්‍රව්‍යයන්ගෙන්වූ සම්බන්ධයෙහිද ඇතැම් තැනක අත්‍යන්ත සංයොගයෙහි කර්ම විභක්ති වේ. උදාහරණ: ගඟ සැතැප්මක් වනී. කොටුව බඹ පණහක් දිගයි. පාර ගව්වක් කන්දයි.

### 3. INSTRUMENTAL CASE.

### කර්තෘ විභක්තිය.

නියොගයක් ලබා හෝ නොලබා ක්‍රියාවක් කරන්නේ කර්තෘ නම් වේ.

එහි එකවචනයේ විභක්ති රූප: අ, උ, ආ, ඉ වෙත්. බහුවචනයේ විභක්ති රූප: උන්, න, ආන, අන්, න්, නන්, වෙත්.

එකවචනයේ උදාහරණ: **රජ්ජු** විසින් දුන් අණ වැසියෝ පිළිපදිත්. ස්වාමියා **වැඩකරුවා** ලවා තමාගේ වැඩ කරවනුලැබේ.

බහුවචනයේ උදාහරණ: **දරුවන්** කරණ වරද **දෙමව්පියන්** විසින් වැලැක්විය යුතු.

හා, සමග ආදි නිපාත හා යෙදෙන නාමපද සමහරවිට කර්තෘ විභක්ති ගණී. උදාහරණ: මම මාගේ **දරුවන්** හා මෙරට ඉතා අමාරුවෙන් ජීවත් වෙමි. නුඹ **ඔහු** සමග ගෙදර යන්නෙහිද?

### 4. AUXILIARY CASE.

### කරණ විභක්තිය.

ක්‍රියාවක් කිරීමට කර්තෘහට උපකාර වන්නේ කරණ නම් වේ. එහි සාමාන්‍යයෙන් එක වචන බහු වචන රූප භෙදයක් නොවේ. ඒ දෙකටම වෙනස් නැතිව ඉන්, එන්, ගෙන්, ඉනි, එනි, ගෙනි, කි * යන රූප වෙත්.

---

† විනා ආදි නිපාතයන් සමග කර්ම විභක්ති හැර කිසිවක අන්‍ය විභක්තිද යොදනු ලැබේ. උදාහරණ: උදුනෙහි මිස අන් කිසිතැනක ආහාර නොපිසිය හැකි.

* සමහරවිට කරණ විබත් බහු වචනත් ව්‍යවහාරයි. එය සාදන්නේ ශබ්දයට වල් යන බහු වචන ප්‍රත්‍යය එකතුකොට ඊටම ඉන් යන කරණ විභක්ති රූප එකතුකිරීමෙන්ය. උදාහරණය: ළමයා ගල්වලින් ගසා අඹ හුහක් කැඩී.

උදාහරණ: ශූරවීරවූ යුධසේනාවක් විසින් තම සතුරන් පහසුවෙන් **කඩුවෙන්ද ඊයෙන්ද** නැසිය හැක්කේය.

රජ්ජුරුවෝ මහපෙළහරින් නුවරට පැමුණුනාහ, මිත්‍රයා යසසින් බොහෝ කලක් ජීවත්වන්, යන වාක්‍යවල 'පෙළහරින්' 'යසසින්' යන පද ක්‍රියා සම්පාදනයෙහි කර්තෘහට යම් උපකාරයක් නුවූයේද උපලක්ෂණයෙන් කරණ විභක්ති ගණි.

### 5. DATIVE CASE.

### සම්ප්‍රදාන විභක්තිය.

දානාදිය ලබන්නේද පිණිස යන නිපාත පදය යෙදීමට නිසිවූයේද සම්ප්‍රදාන නාම් වේ.

එහි එක වචනයේ විභක්ති රූප: අට, ආට, උට, හට, හුට, ට, වෙත්.

බහු වචනයේ විභක්ති රූප: අන්ට, අන්හට, අනට, ඈනට, උන්ට, උන්හට, න්ට, න්හට, නට, නන්ට, විලට වෙත්.

එකවචනයේ උදාහරණය: **දූශියාට** උපකාර කටයුතු. බහු වචනයේ උදාහරණය: **සිගන්නන්ට** දන්දෙමු.

පිණිස * යන නිපාතය නිසි තැනට යටකිවූ 'අට' යන විභක්තිරූපය ව්‍යවහාරයි. උදාහරණ: ඒ මනුෂ්‍යයා **ගමනට** මාගෝපකරණ සපයයි. වැඩි **කුලියට** කොයි වැඩකරුවත් කැමතියි.

### 6. ABLATIVE CASE.

### අවධි විභක්තිය.

කිසිදෙයක පැවැත්මට සීමාවන්නේ අවධි නාම් වේ. එහි එක වචනයේ විභක්ති රූප: ඉන්, ඉනි,

* වස් යන නිපාතයද [illegible] යන නිපාතය වෙනුවට කිපවිටක් ව්‍යවහාර වේ.

එන්, එනි, නෙන්, නෙනි, අගෙන්, ආගෙන්, උගෙන්, හුගෙන්, වෙත්.

බහු වචනයේ විභක්තිරූප: අන්ගෙන්, ආනගෙන්, උන්ගෙන්, න්ගෙන්, නගෙන්, නන්ගෙන්, නෙන්, වලින් වෙත්.

එක වචනයේ උදාහරණය: **ගසින්** වැටි මිනිහෙක් මෙළේය.

බහු වචනයේ උදාහරණය: බොහෝ **නුවරවලින්** මිනිස්සු මෙහි පැමිණෙති.

මේ දක්වූ විභක්ති රූප නොයෙදී තෙක්, දක්වා, ආදි නිපාත පදයන් ඇශ්‍රයකොටද අවධි අර්ථය ප්‍රකාශකරණ පද ඇත්තේය. උදාහරණය: කැලණිගඟ **සමනල** පටන් **කොළඹ** දක්වා ගලයි.

නිර්ධාරණාර්ථයෙහිද අවධි විභක්ති ව්‍යවහාරයි. නිර්ධාරණය නම් ජාති ලක්ෂණයකින් හෝ ගුණ ලක්ෂණයකින් හෝ ක්‍රියා ලක්ෂණයකින් සමූහයකින් එකක් වෙන්කිරීමයි. උදාහරණ: **මිනිසුන්ගෙන්** ක්ෂත්‍රියයා උතුමයි. **මාණික්‍යයන්ගෙන්** රත්න මාණික්‍යය ඉතා අගය ඇත්තේය. **සිගන්නන්ගෙන්** හඩන්නා යන්ට හරිණු.

### 7. GENITIVE CASE.

### සම්බන්ධ විභක්තිය.

යම් තෙනෙකුට හෝ යම් ද්‍රව්‍යයකට කිසිවක් සම්බන්ධ බව එක්කෝ අයිතිකම හඟවන කල්හි ඒ සම්බන්ධ නම් වේ.

එහි එකවචනයට විභක්ති රූප: අගේ, ආගේ, උගේ, හුගේ: අ, ආ, උ, හු, ට; අට, ආට, උට, හට, හුට, වෙත්.

බහු වචනයට විභක්ති රූප: අන්ගේ, ආනගේ, උන්ගේ, න්ගේ, නගේ, [illegible]

න්, න, නන්; අන්ට, අන්හට, අනට, ඈනට, උන්ට, උන්හට, න්ට, න්හට, නට, නන්ට, වලට, වෙත්.

එක වචනයේ උදාහරණය: **රජහුගේ** ඇමතියෝ ඔහුට අසීති නොයෙක් රටවල සිටිති.

බහු වචනයේ උදාහරණය: **දෙගුරුන්** සිත නොතැළීම **දරුවන්ගේ** යුතුකමකි.

කිසි තැන්හි අවධි අර්ථයෙහි සම්බන්ධ විභක්තිද ව්‍යවහාරයි. එනම්: අපගේ ගම තිබෙන්නේ නුවරට දකුණුදිගින්ය, මීගමුව කොළඹට සැතැප්ම විසිතුණකට ඈතින් පිහිටියේය, යන වාක්‍ය දෙකෙහි 'නුවරින්' 'කොළඹින්' කියයුතු තැන්හි 'නුවරට' 'කොළඹට' යයි සම්බන්ධ විභක්ති පෙණේ.

## 8. LOCATIVE CASE.

## ආධාර විභක්තිය.

ක්‍රියාවක් සිඩවීමේදී කර්තෘහට හෝ කර්මයට ආධාර වශයෙන් පවත්නේ ආධාර නම් වේ.

එහි එක වචනයට විභක්ති රූප: අ, එහි, ඒ, ඇ, හි වෙත්.

බහු වචනයට විභක්ති රූප: අන්හි, වල, වලෙහි, වෙත්.

එක වචනයේ උදාහරණය: ළමයා **පුටුවේ** හිඳී.

බහු වචනයේ උදාහරණ: මේ **භාජනයන්හි** කුමක් පිසනුලැබේද? මේ **ඇඳන්හි** කවරහු නිදත්ද?

## 9. VOCATIVE CASE.

## ආලපන විභක්තිය.

කිසිවෙකු අභිමුඛයට කැඳවීමෙහි යොදන නාමය ආලපන විභක්තිය සෙවනය කෙරේ.

එක වචනයේ විභක්තිරූප: අ, ඈ, ඇ, ඒ, වෙත්.

බහු වචනයේ විභක්තිරූප: ඉන්, එන්, නෙන්, ඉනි, එනි, නෙනි, නි, වෙත්.

එක වචනයට උදාහරණය: **මිතුර** මා කිවා අසන්නොහිද?

බහු වචනයට උදාහරණය: **දරුවෙනි** මව්පියන්ට කීකරුවව්.

## DECLENSIONS.

නාමයක් පිළිවෙළින් මේ කියනලද විභක්තීන්ට නාගා දක්වීම **වරනැගීම**යැයි ව්‍යවහාරයි.

මිතුරු ශබ්දයාගේ වරනැගීම.

| විබත්. | එකබස. | බහුබස. |
|---|---|---|
| පෙරවිබත් | මිතුරා | මිතුරෝ |
| කම්විබත් | මිතුරා | මිතුරන් |
| කතුවිබත් | මිතුරා (විසින්) | මිතුරන් (විසින්) |
| කරණවිබත් | මිතුරා (කරණකොටගෙණ) | මිතුරන් (කරණකොටගෙණ) |
| සපදන්විබත් | මිතුරාට | මිතුරන්ට |
| අවදිවිබත් | මිතුරාගෙන් | මිතුරන්ගෙන් |
| සබඳ විබත් | මිතුරාගේ | මිතුරන්ගේ |
| අදරවිබත් | මිතුරා(කෙරෙහි) | මිතුරන්(කෙරෙහි) |
| අලප්විබත් | මිතුර | මිතුරෙනි |

සතුරු කවුඩු ආදි ශබ්ද මෙපරිද්දෙන් වරනැගේ.

ප්‍රාණ සහිත සත්වයන්ගේ නාමයන් කරණවිභක්තියෙහිද ආධාර විභක්තියෙහිද සාමාන්‍යයෙන් නොයොදනා බැවින් කරණ විභක්තියෙහිදී කර්ම විභක්තියටම 'කරණකොටගෙණ' යන වාක්‍ය කැබෙල්ලක්ද ආධාර විභක්තියෙහිදී 'කෙරෙහි' යන අන්‍ය පදයක්ද * එක්කොට ඒ ඒ විභක්තීන්ගේ අර්ථ හඟවනුලැබේ.

---

* කෙරෙහි, කරා, වෙත, ආදිය එකතුකරණු ලබන පද සම්බන්ධ විභක්තියෙහියයි සැලකියයුතු.

ගොන්.

| | | |
|---|---|---|
| පෙර: | ගොනා | ගොන්නු * |
| කම්: | ගොනා, ගොනු | ගොනුන් |
| කතෘ: | ගොනා (විසින්) | ගොනුන් (විසින්) |
| කරණ: | ගොනා (කරණ කොටගෙණ) | ගොනුන් (කරණ කොටගෙණ) |
| සපදන්: | ගොනාට | ගොනුන්ට |
| අවදි; | ගොනාගෙන් | ගොනුන්ගෙන් |
| සබඳ: | ගොනාගේ | ගොනුන්ගේ |
| අදර: | ගොනා (කෙරෙහි) | ගොනුන් (කෙරෙහි) |
| අලප්: | ගොනා | ගොනුනි |

යක් ඇත් ආදි ශබ්ද මෙපරිද්දෙන් වරනැගේ.

වතු.

| | | |
|---|---|---|
| පෙර: | වත්ත | වතු |
| කම්: | වත්ත | වතු |
| කතෘ: | වත්ත (විසින්) | වතු (විසින්) |
| කරණ: | වත්තෙන් | වතුවලින් |
| සපදන්: | වත්තට | වතුවලට |
| අවදි: | වත්තෙන් | වතුවලින් |
| සබඳ: | වත්තේ | වතුවල |
| අදර: | වත්තේ | වතුවල |
| අලප්: † | වත්ත | වතුනි |

අතු කැනි ආදි ශබ්ද මෙසේ වරනැගේ.

අප්‍රාණී ද්‍රව්‍යයන් කියන ශබ්දයන් ප්‍රථමා විභක්ති ඒකවචනයෙහි යොදන කල්හි යට දැක්වූ විභක්ති රූපයන් හැර 'අ' යන විභක්ති රූපයක් බොහෝ විට ගන්නා බැව් පෙණේ. බහුවචනයට ප්‍රකෘති

---

* ගොන්නු යන තන්හි කෙළවර නු යන්න නු යන්න වෙනුවට වූ ආදෙශයකි.

† ප්‍රාණීන් මෙන් සලකන ලද කලෙක්හි විනා අප්‍රාණීන්ට ආමන්ත්‍රණ කිරීමක් නැත.

යම † පෙණේ. එබඳු ශබ්දයන්ගේ කර්මවිභක්ති යද බොහෝකොට ප්‍රථමා විභක්තිය හා සමානවේ.

කඩු.

| | | |
|---|---|---|
| පෙර: | කඩුව | කඩු |
| කම්: | කඩුව | කඩු |
| කතු: | කඩුව (විසින්) | කඩු (විසින්) |
| කරණ: | කඩුවෙන් | කඩුවලින් |
| සපදන්: | කඩුවට | කඩුවලට |
| අවදි: | කඩුවෙන් | කඩුවලින් |
| සබඳ: | කඩුවේ | කඩුවල |
| අඳර: | කඩුවෙහි | කඩුවල |

පුටු බඩු ආදි ශබ්ද මෙසේ වරනැගේ.

ගේ.

| | | |
|---|---|---|
| පෙර: | ගේ, ගෙය | ගෙවල් |
| කම්: | ගෙය | ගෙවල් |
| කතු: | ගෙය (විසින්) | ගෙවල් (විසින්) |
| කරණ: | ගෙයින් | ගෙවලින් |
| සපදන්: | ගෙට, ගෙයට | ගෙවලට |
| අවදි: | ගෙයින් | ගෙවලින් |
| සබඳ: | ගේහි, ගෙයි | ගෙවල |
| අඳර: | ගෙහි, ගෙයි | ගෙවල |

අප්‍රාණී සමහර ද්‍රව්‍යයන්ගේ නාමයන්ට 'වල්' යන්නක් එකතුකිරීමෙන් බහු වචන සාදනු ලැබේ. ඒ නාමයන් කතුවිබතටද සබඳවිබතටද අලප් විබතටද නගා භාෂාවෙහි වැඩි ව්‍යවහාරයෙක් නැත. කර්තෘ අර්ථයෙහිදී කරණවිභක්තියද සම්බන්ධ අර්ථයෙහිදී ආධාර විභක්තියද ඒ වෙනුවට ව්‍යවහාරවේ.

---

† ප්‍රකෘතිය නම් ශබ්ද පදයක මුල ස්වභාවය. උදාහරණ: මිනිස්සු යන පදයෙහි 'මිනිස්' යන්නද ගස යන පදයෙහි 'ගස්' යන්නද ප්‍රකෘතිවෙත්. වැඩි විස්තර මතු පරිච්ඡේදයක දක්වනු ලැබේ.

උදාහරණ: 'වැවෙන්' ගොවිපල රැකෙයි. 'වතුරෙන්' ගොයම වැසෙයි. වැවේ ඉන්න; වතුරේ පාට. ශුද්ධ සිංහලෙහි සමහර ශබ්දයක් බොහෝ විභක්ති රූප නොගෙණද සමහර ශබ්දයක් කොයිම විභක්ති රූපයක්වත් නොගෙණද සිටි. සිදුහත් යන ශබ්දය මෙනි.

කඳු.

| | | |
|---|---|---|
| පෙර: | කන්ද | කඳු |
| කම්: | කන්ද | කඳු |
| කතු: / කරණ: | කන්දෙන් | කඳුවලින් |
| සපදන්: | කන්දට | කඳුවලට |
| අවදි: | කන්දෙන් | කඳුවලින් |
| සබඳ: / අදර: | කන්දේ | කඳුවල |

බත්.

මීට සම්බන්ධ භේදයක් නොපෙණේ:

| | |
|---|---|
| පෙර: | බත, බත් |
| කම් | බත, බත් |
| කතු: / කර: | බතින්, බතෙන් |
| සපදන්: | බතට |
| අවදි: | බතෙන්, බතින් |
| සබඳ: / අදර: | බතේ, බතෙහි |

සංස්කෘත ශබ්දයන් සිංහල විභක්තින් යොදා වරනැගීමේදී බොහෝවිට යයන්නක් හෝ වයන්නක් එකතුකොට ඊට විභක්ති රූප එකතුකරණු ලැබේ. තවද අප්‍රාණී ද්‍රව්‍යයන් කියන ශබ්ද නොයෙක්විට ප්‍රාණීන් කියන ශබ්දයන් මෙන් වරනගණු ලැබේ.

### මනුෂ්‍ය.

| | | |
|---|---|---|
| පෙර: | මනුෂ්‍යයා | මනුෂ්‍යයෝ |
| කම්: | මනුෂ්‍යයා | මනුෂ්‍යයන් |
| කතෘ: | මනුෂ්‍යයා (විසින්) | මනුෂ්‍යයන් (විසින්) |
| කරණ: | මනුෂ්‍යයා (කරණකොටගෙණ) | මනුෂ්‍යයන් (කරණකොටගෙණ) |
| සපදන්: | මනුෂ්‍යයාට | මනුෂ්‍යයන්ට |
| අවදි: | මනුෂ්‍යයාගෙන් | මනුෂ්‍යයන්ගෙන් |
| සබඳ: | මනුෂ්‍යයාගේ | මනුෂ්‍යයන්ගේ |
| අදර: | මනුෂ්‍යයා (කෙරෙහි) | මනුෂ්‍යයන් (කෙරෙහි) |
| අලප්: | මනුෂ්‍යය | මනුෂ්‍යයිනි |

යක්ෂ, වෘක ආදි ශබ්ද මෙසේ වරනැගේ.

### වෘක්ෂ.

| | | |
|---|---|---|
| පෙර: | වෘක්ෂය, වෘක්ෂයා | වෘක්ෂ, වෘක්ෂයෝ |
| කම්: | වෘක්ෂය, වෘක්ෂයා | වෘක්ෂ, වෘක්ෂයන් |
| කතෘ: | වෘක්ෂයා (විසින්) | වෘක්ෂයන් (විසින්) |
| කරණ: | වෘක්ෂයෙන් | වෘක්ෂවලින් |
| සපදන්: | වෘක්ෂයට, වෘක්ෂයාට | වෘක්ෂයන්ට, වෘක්ෂවලට |
| අවදි: | වෘක්ෂයෙන්, වෘක්ෂයාගෙන් | වෘක්ෂයන්ගෙන්, වෘක්ෂවලින් |
| සබඳ: | වෘක්ෂයාගේ | වෘක්ෂයන්ගේ |
| අදර: | වෘක්ෂයෙහි | වෘක්ෂයන්හි, වෘක්ෂවල |
| අලප්: | වෘක්ෂය | වෘක්ෂයිනි |

යට දැක්වූ විධිවලට මදක් වෙනස්ව වරනැගෙණ සමහර ශබ්ද ද ඇත්තේය. ඉන් සමහරක් මෙහි වරනගණු ලැබේ.

ගඟ.

| | | |
|---|---|---|
| පෙර: | ගඟ | ගංගා |
| කම්: | ගඟ | ගංගා |
| කතෘ: කරණ: | ගඟෙන්, ගඟින් | ගංගාවලින් |
| සපදන්: | ගඟට | ගංගාවලට |
| අවදි: | ගඟෙන්, ගඟින් | ගංගාවලින් |
| සබඳ: අදර: | ගඟේ, ගඟෙහි | ගංගාවල |

වල්ගා.

| | | |
|---|---|---|
| පෙර: | වල්ගය | වල්ගා |
| කම්: | වල්ගය | වල්ගා |
| කතෘ: කරණ: | වල්ගෙන් වල්ගයෙන් | වල්ගාවලින් |
| සපදන්: | වල්ගයට | වල්ගාවලට |
| අවදි: | වල්ගෙන් වල්ගයෙන් | වල්ගාවලින් |
| සබඳ: අදර: | වල්ගෙහි වල්ගයෙහි | වල්ගාවල |

පිය, රජ, සිටු ආදි පුරුෂවාචක කිසි ශබ්දයක් හට ඇදර හෝ ගෞරව පිණිස සමහරවිට 'ආනා' යන් නක්ද, පුත්, මයිල් ආදි අන් කිසි පුරුෂවාචක ශබ්ද යක්හට එසේම 'අනු' යන්නක්ද එක්කොට එහි අනට බහු වචන විභක්ති රූප එක්කරණු ලැබේ. පදයෙන් එකාර්ථයක් ප්‍රකාශකරණලද නුමුත් එක වචන විභක්ති රූප එක්කරණු නොලැබේ.

| | පියා. | පුත්. |
|---|---|---|
| පෙර: | පියානෝ * | පුතනුවෝ † |
| කම්: | පියානන් | පුතනුවන් |
| කතෘ: | පියානන් (විසින්) | පුතනුවන් (විසින්) |

* පිය + ආන + ඕ=පියානෝ.

† පුත් + අනු + ඕ=පුතනුවෝ.

| | | |
|---|---|---|
| කරණ: | පියානන් (කරණ කොටගෙණ) | පුතනුවන් (කරණ කොටගෙණ) |
| සපදන්: | පියානන්ට | පුතනුවන්ට |
| අවදි: | පියානන්ගෙන් | පුතනුවන්ගෙන් |
| සබද: | පියානන්ගේ | පුතනුවන්ගේ |
| අදර: | පියානන් (කෙරෙහි) | පුතනුවන් (කෙරෙහි) |
| අලප්: | පියානනි | පුතනුවෙනි |

දූ, මව්, නැඳි ආදි ස්ත්‍රීවාචක කිසි ශබ්දයක්හට 'අනි' යන්නක් එක්කොට එහි අගට බහු වචන විභක්ති රූප යොදනුලැබේ.

| | දූ. | නැඳි. |
|---|---|---|
| පෙර: | දුවනියෝ * | නැන්දනියෝ † |
| කම්: | දුවනියන් | නැන්දනියන් |
| කතු: | දුවනියන් (විසින්) | නැන්දනියන් (විසින්) |
| කරණ: | දුවනියන් (කරණ කොටගෙණ) | නැන්දනියන් (කරණ කොටගෙණ) |
| සපදන්: | දුවනියන්ට | නැන්දනියන්ට |
| අවදි: | දුවනියන්ගෙන් | නැන්දනියන්ගෙන් |
| සබද: | දුවනියන්ගේ | නැන්දනියන්ගේ |
| අදර: | දුවනියන් (කෙරෙහි) | නැන්දනියන් (කෙරෙහි) |
| අලප්: | දුවනියෙනි | නැන්දනියෙනි |

VERBAL NOUN.

## ක්‍රියා ශබ්ද.

අපි ක්‍රියා ශබ්දයෝ ලිඞ්ගභෙද ඇතුව ප්‍රථමා ආදිවූ ඒ ඒ විභක්තියෙහි යොදනු ලැබෙත්.

---

* දූ + අනි + ඕ = දු (ව්) අනි (ය්) ඕ = දුවනියෝ.

† නැඳි + අනි + ඕ = නැන්ද් අනි (ය්) ඕ = නැන්දනියෝ.

## පිසන්නා.

### පුංලිඞ්ග.

| | | |
|---|---|---|
| පෙර: | පිසන්නේ,පිසන්නා | පිසන්නෝ,පිසන්නාහු |
| කම්: | පිසන්නා,පිසන්නාහු | පිසන්නන් |
| කතු: | පිසන්නා,පිසන්නාහු (විසින්) | පිසන්නන් (විසින්) |
| කර: | පිසන්නා (කාරණ කොටගෙණ) | පිසන්නන් (කාරණ කොටගෙණ) |
| සපද: | පිසන්නාට | පිසන්නන්ට |
| අවදි: | පිසන්නාගෙන් | පිසන්නන්ගෙන් |
| සබඳ: | පිසන්නාගේ | පිසන්නන්ගේ |
| අදර: | පිසන්නා(කෙරෙහි) | පිසන්නන් (කෙරෙහි) |
| අලප්: | පිසන්නා | පිසන්නෙනි |

## පි ස න් නි

### ස්ත්‍රී ලිඞ්ග.

| | | |
|---|---|---|
| පෙර: | පිසන්නී | පිසන්නියෝ * |
| කම්: | පිසන්නිය | පිසන්නියන් |
| කතු: | පිසන්නිය (විසින්) | පිසන්නියන් (විසින්) |
| කර: | පිසන්නිය (කාරණ කොටගෙණ) | පිසන්නියන් (කාරණ කොටගෙණ) |
| සපද: | පිසන්නිට,පිසන්නියට | පිසන්නියන්ට |
| අව: | පිසන්නිගෙන්, පිසන්නියගෙන් | පිසන්නියන්ගෙන් |
| සබඳ: | පිසන්නියගේ | පිසන්නියන්ගේ |
| අදර: | පිසන්නිය (කෙරෙහි) | පිසන්නියන් (කෙරෙහි) |
| අලප්: | පිසන්නිය | පිසන්නියෙනි |

* ස්ත්‍රී වාචක බහු වචනයෙහිද පුරුෂ වාචක බහු වචනයෙහි මෙන් පුරාණ භාෂාවෙහි පිසන්නෝ ආදිය ව්‍යවහාරවිය.

## භාව ක්‍රියාශබ්දයන්ගේ වරනැගීම.

### කැවිලි.

| | | |
|---|---|---|
| පෙර: | කැවිල්ල | කැවිලි |
| කම්: | කැවිල්ල | කැවිලි |
| කතු: කරණ: | කැවිල්ලෙන් | කැවිලිවලින් |
| සපදන්: | කැවිල්ලට | කැවිලිවලට |
| අවදි: | කැවිල්ලෙන් | කැවිලිවලින් |
| සබඳ: අදර: | කැවිල්ලේ | කැවිලිවල |

### නටනු.

| | |
|---|---|
| පෙර: | නටනු |
| කම්: | නටනු |
| කතු: කරණ: | නටන්නෙන් |
| සපදන්: | නටන්ට |

### හැඬුම්.

| | | |
|---|---|---|
| පෙර: | හැඬිම. හැඬුම | හැඬිම්, හැඬුම් |
| කම්: | හැඬිම, හැඬුම | හැඬිම්, හැඬුම් |
| කතු: කර: | හැඬිමෙන්, හැඬුමෙන් | හැඬුම්වලින් |
| සපද: | හැඬිමට, හැඬුමට | හැඬුම්වලට |
| අවදි: | හැඬිමෙන්, හැඬුමෙන් | හැඬුම්වලින් |
| සබ: අද: | හැඬිමෙහි, හැඬුමෙහි | හැඬුම්වල |

භාව ක්‍රියා ශබ්දයන්ට දැන් ව්‍යවහාරයෙහි සමහර විට සංඛ්‍යා භෙදයක් ඇති නමුදු පූරාණ භාෂාවෙහි එබඳු භෙදයක් අප්‍රසිඬයි. භාවක්‍රියා ශබ්දයන්ගේ ලිඞ්ග විශෙෂයක් අදෘශ්‍යමානවූවද එළිවෙහිදී ඒ සියල්ලම පුල්ලිඞ්ගයයි කියනු ලැබේ.

ADJECTIVE.

## ගුණ ශබ්ද.

ගුණ ශබ්ද බොහෝතැන විභක්තිරූප රහිතවද කිසි තැනක විභක්තිරූප සහිතවද නාමයක් හා සම්බන්ධකොට ව්‍යවහාර කරණුලැබේ. ඒ සම්බන්ධයට විශෙෂණ විශෙෂ්‍යසම්බන්ධය * යි කියනුලැබේ. ගුණ වර්ණනාකරණ පදයට 'විශෙෂණය'යි කියාද, ගුණ වර්ණනාකරණු ලබන පදයට 'විශෙෂ්‍යය'යි කියාද කියනු ලැබේ.

උදාහරණය: සුදු ගොනා අද සොදයේ තණ කෑවේය. මෙහි 'සුදු' යන ශබ්දය 'ගොනා' යන පදයට විශෙෂණයයි. ගොනා යන පදය එහි විශෙෂ්‍යයයි. සමහරවිට ගුණශබ්ද ලිඟුවත්කොට ව්‍යවහාරකරණු ලැබේ.

'සුදු' ශබ්දයාගේ වරනැඟිම.

පුංලිඞ්ගයෙහි.

| | | |
|---|---|---|
| පෙර: | සුද්දා | සුද්දෝ |
| කම්: | සුද්දා | සුද්දන් |
| කතු: | සුද්දා (විසින්) | සුද්දන් (විසින්) |
| කරණ: | සුද්දා (කරණකොටගෙණ) | සුද්දන් (කරණකොටගෙණ) |
| සපදන්: | සුද්දාට | සුද්දන්ට |
| අවදි: | සුද්දාගෙන් | සුද්දන්ගෙන් |
| සබඳ: | සුද්දාගේ | සුද්දන්ගේ |
| අදර: | සුද්දා (කෙරෙහි) | සුද්දන් (කෙරෙහි) |
| අලප්: | සුද්දා | සුද්දෙනි |

ස්ත්‍රී ලිඞ්ගයෙහි.

| | | |
|---|---|---|
| පෙර: | සුද්දී | සුද්දියෝ |
| කම්: | සුද්දිය | සුද්දියන් |
| කතු: | සුද්දිය (විසින්) | සුද්දියන් (විසින්) |

* විශෙෂණ විශෙෂ්‍ය සම්බන්ධය ගැන වැඩි විස්තර මතු පරිච්ඡෙදයක දක්වනු ලැබේ.

| | | |
|---|---|---|
| කාරණ: | සුද්දිය (කාරණ කොටගෙණ) | සුද්දියන් (කාරණ කොටගෙණ) |
| සපදන්: | සුද්දියට | සුද්දියන්ට |
| අවදි: | සුද්දිගෙන්, සුද්දියගෙන් | සුද්දියන්ගෙන් |
| සබද: | සුද්දිගේ,සුද්දියගේ | සුද්දියන්ගේ |
| අදර: | සුද්දි (කෙරෙහි) සුද්දිය (කෙරෙහි) | සුද්දියන් (කෙරෙහි) |
| අලප්: | සුද්දිය | සුද්දියෙනි |

සුදු ශබ්දය ලිඞ්ග ප්‍රකාට නොවන කල්හි මෙසේ වරනැගේ.

| | |
|---|---|
| පෙරවිබත් | සුද |
| කාර්විබත් | සුද |
| කතුවිබත් කරණවිබත් | සුදෙන් |
| සපදන්විබත් | සුදට |
| අවදිවිබත් | සුදෙන් |
| සබදවිබත් අදරවිබත් | සුදෙහි |

PRONOUN.

## සර්වනාම.

සියල්ලටම ව්‍යවහාර කරණුලබන නාම සර්වනාම යයි කියනු ලැබේ. ඒ, මේ, තෝ, මම, තැම, සියලු, අන්, අනික්, යම්, පෙර, පර, කවර යනාදියයි.

'ඒ' ශබ්දයාගේ වරනැගීම.

පුංලිඞ්ගයෙහි.

| | | |
|---|---|---|
| පෙර: | ඒ, එ(තෙම), හේ, හෙ(තෙම) | ඔහු, ඔව්හු * |

* ඒ ශබ්දයේ ප්‍රථමාවිභක්ති කර්ම විභක්ති දෙකින් කථා ව්‍යවහාරයෙහි එක වචනයට ඌ කියාද බහු වචනයට ඌලා කියාද කියනුලැබේ. ප්‍රාණීන් හඟවන අන් සමහර ශබ්දයන් වත් බහුවචන සෑදීමේදී ලායන්නක් එකතුකරණු ලැබේ. නෑන්දා, නැන්දලා යනාදි ආකාරයි.

| | |
|---|---|
| කම්: ඔහු, උහු | ඔවුන්, උන් |
| කතු: ඔහු, උහු (විසින්) | ඔවුන්, උන් (විසින්) |
| කර: ඔහු, උහු (කරණ කොටගෙණ) | ඔවුන්, උන් (කරණ කොටගෙණ) |
| සප: ඔහුට, ඕහට, උහුට, ඌට | ඔවුන්ට, උන්ට |
| අව: ඔහුගෙන්. උහුගෙන්, උගෙන් | ඔවුන්ගෙන්, උන්ගෙන් |
| සබ: ඔහුගේ, උහුගේ, උගේ | ඔවුන්ගේ, උන්ගේ |
| අද: ඔහු, උහු(කෙරෙහි) | ඔවුන්, උන් (කෙරෙහි) |

## ස්ත්‍රී ලිඞ්ගයෙහි.

පෙර: ඕ (තොමෝ), ඈ
කම්: ඈ, ඈය
කතු: ඈ, ඈය (විසින්)
කර: ඈ, ඈය (කරණ කොටගෙණ)
සප: ඈට
අව: ඈගෙන්
සබ: ඈගේ, ඈයගේ
අද: ඈය (කෙරෙහි)

බහුවචනය පුංලිඞ්ගයෙහි මෙනි.

## ලිඞ්ග ප්‍රකට නොවන කල්හි.

| | | |
|---|---|---|
| පෙර විබත් | එය | ඒවා |
| කම් විබත් | එය | ඒවා |
| කතු විබත්<br>කරණ විබත් | එයින්, ඉන් | ඒවායින් |
| සපදන් විබත් | එයට, ඊට | ඒවාට |
| අවදි විබත් | එයින්, ඉන් | ඒවායින් |
| සබඳ විබත්<br>අදර විබත් | එහි | ඒවායේ |

## මේ.

### පුංලිඞ්ගයෙහි.

| | | |
|---|---|---|
| පෙර: | මේ | මොහු, මොව්හු |
| කම්: | මොහු, මූ | මොවුන්, මූන් |
| කතෘ: | මොහු (විසින්) | මොවුන්, මූන් (විසින්) |
| කර: | මොහු (කරණ කොටගෙණ) | මොවුන්, මූන් (කරණ කොටගෙණ) |
| සප: | මොහුට, මූට, | මොවුන්ට, මූන්ට |
| අව: | මොහුගෙන්, මූගෙන් | මොවුන්ගෙන්, මූන්ගෙන් |
| සබ: | මොහුගේ, මූගේ | මොවුන්ගේ, මූන්ගේ |
| අද: | මොහු, මූ (කෙරෙහි) | මොවුන්, මූන් (කෙරෙහි) |

### ස්ත්‍රී ලිඞ්ගයෙහි.

පෙර: මෝ, මැ
කම්: මැ, මැය
කතෘ: මැ, මැය (විසින්)
කර: මැ, මැය (කරණ කොටගෙණ)
සප: මැට
අව: මැගෙන්, මැගෙන්
සබ: මැගේ, මැගේ
අද: මැය, මැ, (කෙරෙහි)

[බහු වචනය පුංලිඞ්ගයෙහි මෙන්]

### ලිඞ්ග ප්‍රකට නොවන කල්හි.

| | | |
|---|---|---|
| පෙර: | මෙය | මේවා |
| කම්: | මෙය | මේවා |
| කතෘ: / කර: | මෙයින්, මින් | මේවායින් |
| සප: | මෙයට මීට | මේවාට |
| අව: | මෙයින්, මින් | මේවායින් |
| සබ: / අද: | මෙහි | මේවායේ |

## 'තා' ශබ්දයාගේ වරනැඟීම.

| | | |
|---|---|---|
| පෙර: | තෝ | තෙපි, තොපි, තෙප් |
| කම්: | තා | තොප |
| කතු: | තා (විසින්) | තොප (විසින්) |
| කර: | තා (කරණ කොටගෙණ) | තොප (කරණ කොටගෙණ) |
| සප: | තට, තාහට | තොපට |
| අව: | තගෙන්, තාගෙන් | තොපගෙන් |
| සබ: | තගේ, තාගේ | තොපගේ |
| අද: | තා (කෙරෙහි) | තොප කෙරෙහි |

## 'තා'ශබ්දයා ස්ත්‍රී ලිඞ්ගයෙහිද වරනැගේ.

| | | |
|---|---|---|
| පෙර: | තී | ඒකවචනයෙහි පමණි. |
| කම්: | තී | |
| කතු: | තී (විසින්) | |
| කර: | තී (කරණකොටගෙණ) | |
| සප: | තිට | |
| අව: | තිගෙන් | |
| සබ: | තිගේ | |
| අද: | තී (කෙරෙහි) | |

කැමති විටක ස්ත්‍රීයක්හට තෝ කියා හෝ තී කියා ව්‍යවහාරයෙහි දෝෂයක් නැත.

## 'ම' ශබ්දයාගේ වරනැඟීම.

| | | |
|---|---|---|
| පෙර: | මම, මම් | අපි, ඇප් |
| කම්: | මා | අප |
| කතු: | ම (විසින්), මා(විසින්) | අප (විසින්) |
| කර: | මා (කරණකොට ගෙණ) | අප (කරණකොට ගෙණ) |
| සප: | මාහට, මට | අපට, අපහට |
| අව: | මගෙන්, මාගෙන් | අපෙන්, අපගෙන් |
| සබ: | මගේ, මාගේ | අපගේ |
| අද: | මා (කෙරෙහි) | අප (කෙරෙහි) |

### කවර.

| | | |
|---|---|---|
| ප්‍රථ: | කවුරු | කවරහු |
| කර්: | කවුරු, කවරහු | කවුරුන් |
| කතෘ: | කවුරු, කවරහු (විසින්) | කවුරුන් (විසින්) |
| කර: | කවුරු, කවරහු (කරණකොටගෙණ) | කවුරුන් (කරණකොට) |
| සප: | කවරහුට | කවුරුන්ට |
| අව: | කවරහුගෙන් | කවුරුන්ගෙන් |
| සබ: | කවරහුගේ | කවුරුන්ගේ |
| අද: | කවරහු (කෙරෙහි) | කවුරුන් (කෙරෙහි) |

ඒකාර්ථයෙහිදී සමහර ශබ්දවලට 'එක්' යන්නක් එකතුකොට ඒ අගට විභක්ති රූප යොදනු ලැබේ. එසේ කළ කල්හි 'කවර' ශබ්දය කවරෙක්, කවරෙකු, යනාදි ආකාරයෙන් වරනැගේ.

## IV.

## VERB.

## ක්‍රියා (කිරිය).

ක්‍රියාවක් ධාතුවකින් සෑදියයුතුයි. ක්‍රියාවකින් අතීත, වර්ත්තමාන, අනාගත යන කාලත්‍රයද ප්‍රථම, මධ්‍යම, උත්තම යන පුරුෂත්‍රයද හඟවනුලැබේ. මේ පුරුෂත්‍රයට අන්‍ය කාරක, තශබ්ද කාරක, මශබ්ද කාරකයයිද ව්‍යවහාරයි.

### PERSON.

### පුරුෂයා.

මමයයි කියන තැනැත්තාගේ හෝ අපියයි කියන තැනැත්තාවුන්ගේ ක්‍රියාව උත්තම පුරුෂ හෙවත් මශබ්දකාරක (මසදකරු) ක්‍රියාවයයි කියනු ලැබේ.

තෝයයි කියන තැනැත්තහුගේ හෝ තොපි යයි කියන තැනැත්තවුන්ගේ ක්‍රියාව මධ්‍යම පුරුෂ හෙවත් තශබ්දකාරක (තසදකාරු) ක්‍රියාවයයි කියනු ලැබේ.

ඔහු කියන තැනැත්තහුගේද ඔව්හු කියන තැනැත්තවුන්ගේ හෝ වෙන අන්දමකින් හඟවා දෙන අන්‍යයෙකු හෝ අන්‍යයන්ගේ ක්‍රියාව ප්‍රථම පුරුෂ හෙවත් අන්‍යකාරක (අන්කාරු) ක්‍රියාවයයි කියනු ලැබේ.

## TENSE.

## කාලය.

කෙලවරවූ ක්‍රියාවට අතීතකාල (අයුකල්) ක්‍රියාවයයි කියාද, පවතින ක්‍රියාවට වර්ත්මානකාල (වත්මන්කල්) ක්‍රියාවයයි කියාද, නොපැමිණි ක්‍රියාවට අනාගතකාල (අනාකල්) ක්‍රියාවයයි කියාද කියනු ලැබේ.

මෙසේ ක්‍රියාව කාරක, කාල, සංඛ්‍යා, විශෙෂයෙන් අටලොස් භෙදයක් වේ.

## TRANSITIVE & INTRANSITIVE.

## සකර්මක අකර්මක භෙද.

ක්‍රියා සෑදෙන්නාවූ ධාතු සකර්මකය අකර්මකයයි ගණ දෙකකට බෙදනලදහ.

යම් ධාතුවකින් සෑදුනු ක්‍රියාවක් සම්පූර්ණවීමට කර්තෘ පමණක් නොව කර්මයක්ද අවශ්‍යවේ නම් එබඳු ක්‍රියා සෑදෙන ධාතුහු **සකර්මක** ධාතු ගණයට අයිතිවෙත්.

උදාහරණ: මම ඉංග්‍රීසි **දනිමි**. වඩුවා පෙට්ටියක් **සාදයි**. යන වාක්‍යවල තිබෙන ක්‍රියාවන් සිඩවූ **'දන' 'සද'** ධාතු සකර්මකයි.

යම් ධාතුවකින් සෑදුනු ක්‍රියාවක් කර්තෘහු පමණින් සම්පූර්ණවේ නම් එබඳු ක්‍රියා සෑදෙන් නාවූ ධාතුහු **අකර්මක** ධාතුගණයට අයිතිවෙත්.

උදාහරණ: ලමයා **හඬයි**. වැසි **වසී**. යන වාක්‍ය වල තිබෙන ක්‍රියාවන් සිඩවූ 'හැඩි''වැසි' ධාතු අකර්මකයි.

තවත් සකර්මක ධාතු.

| | |
|---|---|
| කර (කිරීමෙහි) | බල (බැලීමෙහි) |
| කී (කීමෙහි) | මර (මැරීමෙහි) |
| කොට (කෙටීමෙහි) | රක් (රැකුමෙහි) |
| ගණ (ගිණීමෙහි) | ලබ (ලැබීමෙහි) |
| පිය (වැසීමෙහි) | ලී (ලීමෙහි) |
| පිස (පිසීමෙහි) | වෙළ (වෙළීමෙහි) |
| පුර (පිරීමෙහි) | සප (සැපීමෙහි) |
| බඳ (බැඳීමෙහි) | හර (හැරීමෙහි) |

අකර්මක ධාතු.

| | |
|---|---|
| ඇති (වීමෙහි) | නිදි (නිදාගැන්මෙහි) |
| කිපි (කිපීමෙහි) | රැඳි (රැඳීමෙහි) |
| තුඹුදු(තිමිද්මෙහි හෝ ගැලීමෙහි) | වූ (වීමෙහි) |
| | සිටි (සිටීමෙහි) |
| තැපි (කම්පාවීමෙහි) | සිනා (සිනාසීමෙහි) |
| ගිලී (ගිලීමෙහි) | හම (හැමීමෙහි) |

අකර්මක ධාතුන්ගෙන් සෑදුනු ක්‍රියා කර්තෘහු පමණක් උක්තකෙරෙත්. සකර්මක ධාතුන්ගෙන් සෑදුනු ක්‍රියාවෝ වාක්‍ය සාදන්නා සෙදු පරිද්දෙන් කර්තෘහු හෝ කර්මය උක්තකෙරෙත්. ක්‍රියාවෙන් කර්තෘහු උක්තවන කල්හි එය කර්තෘකාරක ක්‍රියාවයයි කියාද, කර්මය උක්තවන කල්හි කර්මකාරක ක්‍රියාවයයි කියාද කියනුලැබේ.

කත්තෘකාරක ක්‍රියා (කතුකිරිය).

ත්‍රෛකාලික ක්‍රියා (තෙකල් කිරිය).

අන්‍යකාරකයෙහි අතීතකාල එකවචන ක්‍රියා සෑදීමෙහිදී ධාතුන්ට එක්කරණ ප්‍රත්‍යයෝ * නම් ඉ, ඊ, උ, ඒ, යන මොහු වෙති.

උදාහරණ: ලිපිණියා දියේ **ගිලුනි**. වෙළෙන්ද මට බඩු **දුනි**. මෙහෙකරුවා වැඩ **කෙළේය**. †

අන්‍යකාරකයෙහි වර්තමානකාල එකවචන ක්‍රියා සෑදීමෙහිදී ධාතුන්ට එක්කරණ ප්‍රත්‍යයෝ නම්: ආ, ඉ, ඒ, ඕ, යන මොහු වෙති.

උදාහරණ: සිදුරු ඇති බඳුනෙහි දිය **නොරැඳේ**. ගොනා දෑන් තණ **කයි**. මිතුරා ගමට **යේ**.

අන්‍ය කාරකයෙහි අනාගතකාල එක වචන ක්‍රියා සෑදීමේදී ධාතුන්ට එක්කරණ ප්‍රත්‍යයෝ නම්: අන්නේ, ඉන්නේ, එන්නේ, ඔන්නේ, නේ, යන මොහු වෙති.

උදාහරණ: ජෝර්ජ් කුමරු මතු අපට රජ **වන්නේය**. කුසල් සත්හට මතු සැප **දෙන්නේය**.

අන්‍යකාරකයෙහි අතීතකාල බහුවචන ක්‍රියා සෑදීමෙහිදී ධාතුන්ට එක්කරණ ප්‍රත්‍යයෝ නම්: උ, ඌ, උන්, ඕ; උහ, ඌහ, උන්හ; උහු, ඌහු, උන්හු, යන මොහු වෙති.

---

* ප්‍රත්‍යය නම් ක්‍රියාදද ආදිය සෑදීම පිණිස ප්‍රකෘතියෙහි අගට එක්කරණ අකුරකින් හෝ අකුරු කීපයකින් යුක්ත ශබ්දයෙකි.

† මේ ක්‍රියාව සහ වෙනත් නොයෙක් අපර ක්‍රියාවන්ගේ කෙළවරෙහි ව්‍යාකරණය හඟවනු පිණිස බොහෝවිට 'ය' යන්නක් සම්භවේ.

උදාහරණ :- කෙළේය, මෙළේය, දුවන්නේය, හඬන්නේය.

උදාහරණ: සතුරෝ මාගේ පුතෙකු **නැසූ** (නැසූහ, නැසූහු, කියාද ව්‍යවහාරයි.) මෙහෙකරුවෝ අවසරගෙණ තමන් ගම්වලට **ගියෝ**. මිතුරෝ මට මා විසින් ඉල්ලූ පොත **දුන්හු** (දුන්හූ, දුන්හ).

අන්‍යකාරක වර්ත්තමානකාල බහුවචන ක්‍රියා සෑදීමෙහිදී ධාතූන්ට එක්කරණ ප්‍රත්‍යයෝ නම්: අත්, ඉත්, එත්, ඔත්, අති, ඉති, එති, ඔති, යන මොහු වෙති.

උදාහරණ: බල්ලෝ දැන් **බුරත්** (බුරති). කම්මැලියෝ නිතරම දුක් **විඳිත්** (විඳිති). වෙළෙන්දෝ දැන් හොඳ බඩු **නොගෙණෙත්** (නොගෙණෙති). ලෙඩ්ඩු බෙහෙත් **බොත්** (බොති). *

අන්‍යකාරකයෙහි අනාගතකාල බහු වචන ක්‍රියා සෑදීමෙහිදී ධාතූන්ට එක්කරණ ප්‍රත්‍යයෝ නම්: අන්නෝ, අන්නාහු, අන්නාහ, නාහු, නාහ, යන මොහු වෙත්.

උදාහරණ: පින්කළෝ මතු සැප **ලබන්නෝය** (ලබන්නාහු, ලබන්නාහ). ධර්මිෂ්ඨයෝ දෙව්ලොව **යන්නාහු** (යන්නාහ, යන්නෝය).

ත්වශබ්දකාරක එක වචන ක්‍රියා සෑදීමේදී අතීත කාලයට ඉහි, උහි, එහි, යන ප්‍රත්‍යයෝද; වර්ත්තමාන කාලයට එහි, ඔහි, අයි, ඉයි, එයි, ඔයි † යන ප්‍රත්‍යයෝද; අනාගතකාලයට අන්නෙහි, ඉන්නෙහි, එන්නෙහි, ඔන්නෙහි, නෙහි, යන ප්‍රත්‍යයෝද වෙත්.

අතීත කාලයට උදාහරණය: තුඹ පෙර ළදරු වෙස්ව **සිටියෙහි**.

---

* අප්‍රාණින් කියන ශබ්දයන්ගේ බහුවචන උක්තකාරණ ක්‍රියාවෝ කිහිවිටක එකවචන ප්‍රත්‍යයන්ද ගණිත්. උදාහරණ: මගේ පොත් මා වෙත තිබේ.

† මෙහි 'යි' යන්න 'හි' යන්නට වූ ආදේශයක් මෙන් සැලකිය යුතු.

වර්තමාන කාලයට උදාහරණය: තෝ දැන් දිය **බොයි.**

අනාගත කාලයට උදාහරණය: තුඹ මතු රජ **වන්නෙයි.**

තා ශබ්දකාරක බහු වචන ක්‍රියා සෑදීමේදී අතීත කාලයට, ආහු, උහු, ඌහු, උන්හු, යන ප්‍රත්‍යයෝද, වර්තමාන කාලයට, අහු, ඉහු, එහු, ඔහු, අවු, ඉවු, එවු, ඔවු, * යන ප්‍රත්‍යයෝද, අනාගත කාලයට, අන්නාහු, ඉන්නාහු, එන්නාහු, ඔන්නාහු, නාහු යන ප්‍රත්‍යයෝද වෙත්.

අතීත කාලයට උදාහරණය: තොපි පෙරකල්හි වැඩ **කළාහුය.**

වර්තමාන කාලයට උදාහරණය: තොපි දැන් දන් **දෙවු.**

අනාගත කාලයට උදාහරණය: තුඹලා දැන් පින් කළොත් මතු දෙව්ලොව **යන්නාහු** (යන්නාහ).

මශබ්දකාරක එක වචන ක්‍රියා සෑදීමේදී අතීත කාලයට, ඉම්, ඉමි, ඊම්, ඊමි, එම්, එමි, යන ප්‍රත්‍ය යෝද, වර්තමාන කාලයට, අම්, අමි, ඉම්, ඉමි, එම්, එමි, ඔම්, ඔමි යන ප්‍රත්‍යයෝද; අනාගත කාලයට, අන්ගනම්, අන්නෙමි, ඉන්නෙම්, ඉන්නෙමි, එන් නෙම්, එන්නෙමි, ඔන්නෙම්, ඔන්නෙමි, නෙම්, නෙමි, යන ප්‍රත්‍යයෝද වෙත්.

අතීත කාලයට උදාහරණය: පෙර මම පොනා **දුනිම්** (දුනිමි.)

වර්තමාන කාලයට උදාහරණය: මම දැන් දන් **දෙම්** (දෙමි).

අනාගත කාලයට උදාහරණය: මම මතු රට **රක්ෂණම්** (රක්ෂෙණමි).

---

* මෙහි 'වු' යන්න 'හු' යන්නට වූ ආදෙශයක් මෙන් සැලකිය යුතු.

ම ශබ්දකාරක බහු වචන ක්‍රියා සෑදීමේදී අතීත කාලයට, අමු, අමෝ, අම්හ, අම්හු, ඉමු, ඉමෝ, ඉම්හ, ඉම්හු, ඊමු, ඊමෝ, ඊම්හ, ඊම්හු, උමු, උමෝ, උම්හ, උම්හු, එමු, එමෝ, එම්හ, එම්හු, යන ප්‍රත්‍යයෝද; වර්තමාන කාලයට, අමු,අමෝ,අම්හ,අම්හු, ඉමු, ඉමෝ, ඉම්හ, ඉම්හු, එමු, එමෝ, එම්හ, එම්හු, ඔමු, ඔමෝ, ඔම්හ, ඔම්හු, යන ප්‍රත්‍යයෝද; අනාගත කාලයට, අන්නෙමු, අන්නමෝ, අන්නම්හ, අන්නම්හු, ඉන්නෙමු, ඉන්නමෝ, ඉන්නම්හ, ඉන්නම්හු, එන්නෙමු, එන්නමෝ, එන්නම්හ, එන්නම්හු, ඔන්නෙමු, ඔන්නමෝ, ඔන්නම්හ, ඔන්නම්හු, නෙමු, නමෝ, නම්හ, නම්හු, යන ප්‍රත්‍යයෝද වෙත්.

අතීත කාලයට උදාහරණ: පෙර අපි දුක් **වින්දෙමු** (වින්දමෝ, වින්දම්හ, වින්දම්හු).

වර්තමාන කාලයට උදාහරණ: අපි දැන් සිල් **රකිමු** (රකුමෝ, රකිම්හ, රකිම්හු).

අනාගත කාලයට උදාහරණ: අපි මැරුණු පසු දෙව්ලොව **යන්නෙමු** (යන්නමෝ, යන්නම්හු).

OPTATIVE MOOD.

## ආශීර්වාද ක්‍රියා (ආසි කිරිය).

අන්‍යකාරකයාට හෝ තශබ්දකාරකයාට හෝ මශබ්දකාරකයාට යම් යහපතක් හෝ අයහපතක් ප්‍රාර්ථනා කිරීමෙහි යොදන ක්‍රියාව ආශීර්වාද ක්‍රියා (ආසිකිරිය) නම් වේ. මේ ක්‍රියාව නිතරම අනාගතාර්ථයි.

මේ ක්‍රියා සෑදීමෙහිදී පුරුෂත්‍රයෙහි වර්තමාන කාල ප්‍රත්‍යයන්ට 'වා' යන්නක් එකතුකරණුලැබේ.

උදාහරණ: මම්තුග මතු රජ **වේවා**, සුබ සේනාවෝ තමන් සතුරන් ජය **ගණිත්වා**, තුඹ මතු එරට රජ **කෙරෙහිවා**, මම් මතු රට **රකිම්වා**.

ම ශබ්දකාරක එක වචන සෑදීමේදී බොහෝවිට 'මි' යන්නට පරවද, බහු වචන සෑදීමේදී 'මෝ' යන්නට පරවද 'වා' ප්‍රත්‍යය යොදනුලැබේ.

උදාහරණ: මම් කිසිකලෙක ඔහු නොදකිම්වා, අපි කිසිකලෙක ඔහු නො **දකුමෝවා.**

IMPERATIVE MOOD.

විධි ක්‍රියා (විදි කිරිය).

ආදරයකින් හෝ අනාදරයකින් තශබ්දකාරකයාට හෝ අන්‍යකාරකයාට ආඥකිරීමෙහි යොදනා ක්‍රියාව විධි ක්‍රියා (විදිකිරිය) නම් වේ.

තශබ්දකාරකයා සම්බන්ධවූ විධික්‍රියාව බොහෝසෙයින් ව්‍යවහාරවන්නේවීනමුදු අන්‍යකාරකයා සම්බන්ධ විධි ක්‍රියාව පොත්පත්හි මිස වැඩි ව්‍යවහාර නැත.

තශබ්දකාරක විධි ක්‍රියාවෙහි එක වචන සෑදීමට ධාතුන්ට එක්කරණ ප්‍රත්‍යයෝ නම්: අ. ආ, ඊ, උ, අන්, අන්නැ, වෙත්. බහු වචන සෑදීමට ප්‍රත්‍යයෝ නම් අව්, ඉව්, එව්, ඔව්, උ, වෙත්.

අන්‍යකාරක එක වචන සෑදීමේදී ඒ, අන්නේ, ඉන්නේ, එන්නේ, ඔන්නේ, යන ප්‍රත්‍යයෝද; බහු වචන සෑදීමේදී අන්නෝ, ඉන්නෝ, එන්නෝ, ඔන්නෝ, යන ප්‍රත්‍යයෝද වෙත්.

තශබ්දකාරකයට උදාහරණ: කඩිණමින් මේ වැඩ **කර**. වෙළඳට මේ බඩු **දී**. මා එනතුරු මෙතන **සිටු**. අද ගමට නො **යන්** (නොයන්නැ).

තොපි බත් **කව්**. දැන් පොත් **ගණිව්**. සවස ගෙදර **වරෙව්**. සුරා නොබොව්.

අන්‍යකාරකයාට උදාහරණ: මෙහෙකරුවා සැණෙකින් මා වෙත **එන්නේ** (මෙහෙකරුවෝ එන්නෝ).

'ආයුබෝවන්' 'සැරදේ' යනාදියෙහි විධික්‍රියා ආශීර්වාදයිසි.

## ප්‍රයොජ්‍ය ක්‍රියා (පියදු කිරිය).

තමන් නොකොට අනිකෙකු ලවා කරවන ක්‍රියාව ප්‍රයොජ්‍යක්‍රියා (පියදු කිරිය) නම් වේ. මේ ක්‍රියා සෑදීමේදී ධාතු ප්‍රත්‍යය මධ්‍යයට 'ව'කාරයක් යොදනු ලැබේ. එය විනා අන්‍යකාරකාදි කාරකයන්ද අතීත කාලාදි කාලයන්ද සම්බන්ධවූ ප්‍රත්‍යයෝ වැඩි වෙනසක් නොව මෙහි යෙදෙත්.

ප්‍රයොජ්‍ය ක්‍රියාවෙහිදී යම් ක්‍රියාවක් කිරීමට අණ ලබන්නා කර්තෘ විභක්තියෙහි සිටිනවත් හැර බොහෝවිට 'ලවා' * යන නිපාතය සමග යෙදේ.

උදාහරණ: ස්වාමියා තම මෙහෙකරුවන් ලවා වැඩ කරවී. මම කොලුවා ලවා පොල් කැඩවීමි.

අකර්මක ධාතුනු ප්‍රයොජ්‍ය ක්‍රියාවෙහි යෙදීමෙන් සකර්මක වෙත්.

උදාහරණ: මම හඬමි. මෙහි 'හඬමි' යනු අකර්මකයි. ප්‍රයොජ්‍ය ක්‍රියාවෙහි යෙදූකල්හි: මම ලමයා 'හඬවමි'. මෙහි 'හඬවමි' යනු සකර්මකයි. 'ලමයා' යනු එහි කර්මය වේ.

ප්‍රයොජ්‍ය ක්‍රියාවෙහිදී සමහර සකර්මක ධාතුනු කිසිවිටක කර්ම දෙකක් ගණීත්.

'ගොනා තණ කෑවේ'ය කීවොත් 'තණ' යන පදය 'කෑවේ' යන සකර්මක ක්‍රියාවෙහි කර්මයවේ.

ප්‍රයොජ්‍යක්‍රියා සහිතකොට 'මම වැඩකරුවා ලවා ගොනුන් තණ කැවීමි' කීවොත් 'ගොනුන්' යනුද තණ' යනුද දෙකම 'කැවීමි' යන ක්‍රියාවෙහි කර්ම වෙත්.

---

* සමහර කෙනෙක් 'ලවා' යනු සකර්මක පූර්වක්‍රියාවක් කොට සලකා ක්‍රියාව කිරීමට නියොග ලබන්නා ඒ ක්‍රියාවෙහි කර්මයැයි කියත්.

## අසම්භාවන ක්‍රියා (අසබහව් කිරිය).

සිද්ධවන නොවන බව ස්ථිර නැත්තාවූ අනියම් අර්ථයක් හෝ කාලාර්ථයක් හඟවන ක්‍රියාව අසම්භාවන ක්‍රියා (අසබහව් කිරිය)යි කියනු ලැබේ. මෙහි කාරක කාලසංඛ්‍යාභෙදයක් නොපෙණේ. මේ ක්‍රියා සෑදීමේදී බොහෝසේ ත, ත් යන ප්‍රත්‍යයෝ යොදනු ලැබෙත්.

අනියමාර්ථයෙහි අසම්භාවන ක්‍රියාවෙහිදී බොහෝවිට 'හොත්' (ඔත්*) යන අනියමාර්ථයෙහි නිපාතයද අසම්භාවන ප්‍රත්‍යයාන්තයට එක්කොට ව්‍යවහාරකරණු ලැබේ.

හොත් (ඔත්) යන නිපාතය සහිත අසම්භාවන ක්‍රියාවට උදාහරණ: ඔහු වැඩ **කළහොත්** අපිත් වැඩකරමු. තුඹ ඒ වැඩ **කළොත්** † කැලිය ගෙවමි. තුඹ ගෙදර **යතොත්** ‡ මමත් එමි. ඔවුන් දන් **දෙතොත්** ‡ මමත් දෙමි.

හොත් යන නිපාතය රහිත අසම්භාවන ක්‍රියාවට උදාහරණ: තුඹ විසින් ඒ ගමන **යත** හැකි. ඔහු විසින් ඒ වැඩ **කරත** § හැකි.

මා විසින් මේ ගහ **කැපිය** හැකි. ඔවුන් විසින් මේ වැඩ **කළ** යුතු.

කාලාර්ථයෙහි අසම්භාවන ක්‍රියාවට උදාහරණ: රිවි උදා **වෙත** තුරු රැස අතුරුදහන් වේ.

---

* හොත් යන නිපාතයේ හකාරය ලොපව මෙසි 'ඔත්' සියාද වේ.

† කළ + ඔත් = කළොත්.

‡ යත් + ඔත් = යතොත්. දෙත් + ඔත් = දෙතොත්.

§ තුඹ **කිපෙතත්** ඇත්ත කියමි. **ඇඬුවත්** ඌ සිතූ දෙය නොලැබෙයි යනාදි වාක්‍යවල 'කිපෙතත්' 'ඇඬුවත්' යන පද 'කිපෙත' 'ඇඬුව' යන අසම්භාවන ක්‍රියාවන්ට 'ත්' යන නිපාතය එක්කොට සාදනලද්දේය.

"එසේ කල් **යත් යත්** කුමාරවරු යහළුව ගොස් මදු රජ්ජුරුවන්ගේ දුවනියන් හා එක්ව රජගෙයිම **කොළ** නාහ."

කාලාප්යෙහි ත, ය්, ප්‍රත්‍යයෝ එලුවෙහි මිස මිශ්‍ර සිංහලෙහි වැඩි ව්‍යවහාර නොවෙත්.

PAST PARTICIPLE.

පූර්වක්‍රියා (පෙර කිරිය).

**කර්තෘ**හු විසින් **එක්** ක්‍රියාවක් කිරීමට පූර්වයෙන් කරන්නාවූ ක්‍රියා පූර්ව ක්‍රියා (පෙරකිරිය) නම් **වේ.** ඊට ප්‍රත්‍යයෝ අ, ආ, ඇ, ඊ, ඉන් වෙත්. කිසිවිටක මේ ප්‍රත්‍යයන් අගට 'ලා' යන්නක්ද යොදනු ලැබේ.

උදාහරණ: ගොවියා කුඹුරෙහි වැඩ **කොට** (කර) ගෙදර එයි, ගොන්නු තණ **කා** වතුර **බී** නිදන්නෝය, අද ගෙදර **ගොසින්ලා** සෙට වරෙන්.

අවුත්, ගොස්, ආදී යටකී ප්‍රත්‍යයන් නොගන්නා පූර්ව ක්‍රියාද ඇත්තේය. මේ ක්‍රියාවෙහි කාරක කාල සංඛ්‍යා භේදයන් නොපෙණේ.

PRESENT PARTICIPLE.

මිශ්‍ර ක්‍රියා (මුසුකිරිය).

**කා**ර්තෘහු විසින් යම් ක්‍රියාවක් කරමින් අන්‍ය ක්‍රියාවක් කරණු ලැබේද ඒ ක්‍රියාව මිශ්‍ර ක්‍රියා (මුසු කිරිය) නම් වේ. ඊට ප්‍රත්‍යයෝ මින්, මින, මිනි, මිනි වෙත්.

උදාහරණ: ලමයා **හඬමින්** බත් කයි. රජ ඇම තියා රට **බලමින්** ඇවිදී.

සෙසු ප්‍රත්‍යයෝ ග් කව් ආදියෙහි මිස වැඩිකොට ව්‍යවහාර නොවෙත්.

PASSIVE VOICE.

කර්මකාරක ක්‍රියා (කම්කිරිය).

**කර්ම**කාරකයෙහි ක්‍රියාවන් සෑදීමේදී ක්‍රියාවෙන් කර්මය උක්තවන **පරිද්දෙන්** වාක්‍ය සෑදිය යුතු.

මේ ක්‍රියා සෑදීමේදී බොහෝවිට ධාතුව භාවක්‍රියා වෙහි යොදා ඊට 'ලබ' යන ධාතුව එක්කොට අතීත ආදී කාලයන්ද, ප්‍රථම පුරුෂ ආදී පුරුෂයන්ද සම්බන්ධවූ ප්‍රත්‍යයෝ එක්කරණු ලැබෙත්. සමහරවිට 'ලබ' යන ධාතුව නොගෙණත් ධාතුවේම පණ තුරු පෙරළා අතීත කාලයෙහිදී ධාතුව අගට 'නා' කාරයක් එක්කොටද, වර්තමාන අනාගත කාලයන්හිදී 'නා' කාරය එක්නොකොටද යටකී ප්‍රත්‍යයන් යොදා * කර්මකාරක ක්‍රියා (කම්කිරිය) සාදනු ලැබේ.

උදාහරණ: මා විසින් වැට බඳිනලද්දේය (බැඳුනේය). තා විසින් බත පිසනු ලැබේ (පිසේ). බෙහෙත ඔවුන් විසින් අඹරණු ලැබෙන්නේය (ඇඹරෙන්නේය). මම සොරුන් විසින් කපන ලද්දෙමි (කැපුනෙමි). තුඹ මා විසින් දවනු ලැබෙහි (දැවෙහි).

කර්මකාරක ක්‍රියා සෑදීමට දෙවැනිව දැක්වූ විධියෙන් නිරුත්සාහක ක්‍රියාද සෑදේ. නිරුත්සාහක ක්‍රියා නම් කර්තෘහුගේ උත්සාහයක් නැතිව සිදුවන්නාවූ ක්‍රියාය.

උදාහරණ: දුවුව බිඳුනේය. වැට කැඩෙයි. ඇඳුම ඉරෙයි. සඳ බැබලෙයි. —— ——.

මේ යට දැක්වූ ක්‍රියාවන් අතුරෙන් අසම්භාවන ක්‍රියාවද පූර්ව ක්‍රියාවද මිශ්‍ර ක්‍රියාවද හැර අනික් සියලු ක්‍රියාවෝ නිතරම ප්‍රථමා විභක්ත්‍ය උකතා කෙරෙති.

අනියමාර්ථයෙහි අසම්භාවන ක්‍රියාව කාරණ තැනැත්තහු කර්තෘ විභක්තියෙහිද කාලාර්ථයෙහි

---

* යටකී පරිච්ඡේදයෙහි දක්වනලද විභක්ති රූප හා මෙහි දක්වනලද ක්‍රියා ප්‍රත්‍යයෝද භූයොවෘත්තියෙන් යොදනු ලැබෙත්. කිසි තැනක අන්‍ය විභක්ත්‍යක්ෂරයක් හෝ ක්‍රියා ප්‍රත්‍යයක් ඇතහොත් ව්‍යවහාරානුසාරයෙන් ඒ යෙදිය යුතු.

ක්‍රියාව **කරණ** තැනැත්තාහු ආධාරාර්ථයෙහිවූ කර්ම විභක්ති‍යෙහිද යෙදිය යුතු.

අනියමාර්ථයෙහි අසම්භාවන ක්‍රියාව කරන්නාහු කර්තෘ විභක්තියෙන් යෙදෙන බැව් දක්වන උදාහරණ:

"මා වියළි **ඇරඹුවොත්** සියල්ලෝ නසිති."

"මූ හැම පූර්ව ජන්මයෙහි කළාවූ කුශලයෙන් හා ප්‍රාර්ථනා බලයෙන් සිඛවන විපාක විශේෂය **කිසි කෙනෙකුන්** විසින් **වැලකිය** නොහැකි බව තමන්ට දිව්‍යඥානය නැති හෙයින් නොදන්නාහු මය."

කාලාර්ථයෙහි අසම්භාවන ක්‍රියාව කරන්නාහු ආධාරාර්ථයෙහි කර්ම විභක්තියෙන් යෙදෙන බැව් දක්වන උදාහරණය:

ගුත්තිලදාවෙහි:—

"**කියත උන්** මෙතෙප ල
ඇයෙය ඇදුරු ගුත්ති ල" *

අසම්භාවන නොවන්නාවූ කාලාර්ථයෙහි ක්‍රියාව කරන්නාහු ආධාරාර්ථයෙහි කර්ම විභක්තියෙහි යොදන බැව් දක්වන උදාහරණය:

"මා වැනි ශ්‍රද්ධාවත් පින්වත් **රජෙකු** රාජ්‍යය කරද්දීන් **සිටියදී** සිල්වතුන්වහන්සේට බෙහෙත් දුලීහවන්ට කාරණ කිම්ද?"

## CONJUGATION.

ධාතුවක් පිළිවෙළින් යටකී ක්‍රියාවන්හි යොදා දැක්වීමද **වරනැගීම**යයි කියනුලැබේ.

මෙහි මතු 'දිස්' යන සකර්මක ධාතුව හා 'හැඬි' යන අකර්මක ධාතුවත් වරනගනු ලැබේ.

---

* එහි අර්ථය නම්:—උන්, ඒ ගුත්තිල පණ්ඩිතයන්ගේ දෙමව්පියන්; මෙතෙපල කියත, මේ වචන කියනකල්හි; ගුත්තිල ඇදුරු, ගුත්තිල ආචාර්ය්‍යා: ඇයෙය, (එනි) ආවේය.

## ACTIVE VOICE.

### කර්තෘකාරකයෙහි.

#### අතීත කාල.

| | දිස්. | හැඬ්. |
|---|---|---|
| ප්‍රථම පුරුෂ | ඒ: දිටි, දුටුවේ | හැඬී, හැඬුවේ |
| | බ: දුටු (හ, හු,) දුටුවෝ, | හැඬූ (හ, හු), හැඬුවෝ |
| මධ්‍යම පුරුෂ | ඒ: දුටුවෙහි | හැඬුවෙහි |
| | බ: දුටුවහු | හැඬුවාහු |
| උත්තම පුරුෂ | ඒ: දිටිම් (මි) | හැඬීම්. හැඬීමි |
| | දුටුවෙමි (ම්) | හැඬුවෙම් (මි) |
| | බ: දුටුමු, දුටුමෝ (ම්හ, ම්හු) | හැඬුමු, හැඬුමෝ (ම්හ, ම්හු) |
| | දුටුවෙමු „ „ | හැඬුවෙමු „ |

#### වර්තමාන කාල.

| | | |
|---|---|---|
| ප්‍රථම | ඒ: දකී | හඬයි |
| | බ: දකිත් (ති) | හඬත් (ති) |
| මධ්‍යම | ඒ: දකිහි, දකියි | හඬයි |
| | බ: දකිවූ | හඬවූ |
| උත්තම | ඒ: දකිම් (මි) | හඬම් (මි) |
| | බ: දකිමු, දකිමෝ, දක්මෝ, දකුම්හ (හු) | හඬමු (මෝ, ම්හ, ම්හු) |

#### අනාගත කාල.

| | | |
|---|---|---|
| ප්‍ර. | ඒ: දකින්නේ, දක්නේ | හඬන්නේ |
| | බ: දකින්නෝ (නාහු, නාහ) | හඬන්නෝ |
| | දක්නෝ (නාහු, නාහ) | (නාහු, නාහ) |
| ම. | ඒ: දකින්නෙහි, දක්නෙහි | හඬන්නෙහි |
| | බ: දකින්නාහු; දක්නාහු | හඬන්නාහු |
| උ. | ඒ: දකින්නෙම් (මි | හඬන්නෙම් |
| | දක්නෙම් (මි) | (මි) |
| | බ: දකින්නෙමු, (නමෝ, නම්හ, නම්හු) | හඬන්නෙමු (නමෝ, නම්හ, නම්හු) |
| | දක්නෙමු „ „ | |

### ආශීර්වාද ක්‍රියාව.

| | | |
|---|---|---|
| ප්‍ර. | ඒ: දකීවා | හඬාවා |
| | බ: දකිත්වා | හඬත්වා |
| ම. | ඒ: දකීවා | හැඬෙහිවා |
| උ | ඒ: දකිම්වා | හඬම්වා |
| | බ: දකුමෝවා | හඬමෝවා |

### විධි ක්‍රියාව.

| | | |
|---|---|---|
| ම. | ඒ: දකු | හඬ |
| | බ: දකිව් | හඬව් |
| ප්‍ර. | ඒ: දක්නේ, දකින්නේ | හඬන්නේ |
| | බ: දක්නෝ, දකින්නෝ | හඬන්නෝ |

## ප්‍රයොජ්‍ය ක්‍රියාව.

### අතීත කාල.

| | | |
|---|---|---|
| ප්‍ර. | ඒ: දැක්වී, දැක්කුවේ | හැඬවී, හැඬෙව්වේ, |
| | බ: දැක්වූ (හ, හු) දැක්කුවෝ | හැඬවූ (හ, හු), හැඬෙව්වෝ, හැඬෙව්වාහු |
| ම. | ඒ: දැක්කුවෙහි | හැඬෙව්වෙහි |
| | බ: දැක්කුවාහු | හැඬෙව්වාහු |
| උ. | ඒ: දැක්වීම් (මි) දැක්කුවෙම් (මි) | හැඬවීම් (මි), හැඬෙව්වෙම් (මි) |
| | බ: දැක්වීමු, දැක්කුවෙමු | හැඬවීමු, හැඬෙව්වෙමු |

### වර්තමාන කාල.

| | | |
|---|---|---|
| ප්‍ර. | ඒ: දක්වයි | හඬවයි |
| | බ: දක්වත් (ති) | හඬවත් (ති) |
| ම. | ඒ: දක්වයි | හඬවයි |
| | බ: දක්වවු | හඬවවු |
| උ. | ඒ: දක්වම් (මි) | හඬවම් (මී) |
| | බ: දක්වමු (මෝ, ම්හ, ම්හු) | හඬවමු (මෝ, ම්හ, ම්හු) |

### අනාගත කාලය.

| | | |
|---|---|---|
| ප්‍ර. | ඒ: දක්වන්නේ | හඬවන්නේ |
| | බ: දක්වන්නෝ (නාහ, නාහු) | හඬවන්නෝ (නාහ, නාහු) |

ම. { ඒ: දක්වන්නෙහි    හඬවන්නෙහි
බ: දක්වන්නාහු    හඬවන්නාහු

උ. { ඒ: දක්වන්නෙම් (මි)    හඬවන්නෙම් (මි)
බ: දක්වන්නෙමු    හඬවන්නෙමු (නාමෝ
(නාමෝ, නම්හ,    නාම්හ, නම්හු)
නාම්හු)

ප්‍රයොජ්‍ය ආශීර්වාද ක්‍රියාව.

ප්‍ර. { ඒ: දක්වව්වා    හඬවව්වා
බ: දක්වවත්වා    හඬවවත්වා

උ. { ඒ: දක්වම්වා    හඬවම්වා
බ: දක්වමෝවා    හඬවමෝවා

ප්‍රයොජ්‍ය විධි ක්‍රියාව.

ම. { ඒ: දක්වව    හඬවව
බ: දක්වව්    හඬවව්

ප්‍ර. { ඒ: දක්වන්නේ    හඬවන්නේ
බ: දක්වන්නෝ    හඬවන්නෝ

PASSIVE VOICE.

කර්මකාරකයෙහි.

දිස්.    හැඩි.

අතීත.    නැහැ.

ප්‍ර: { ඒ: දක්නු ලද්දේ (දක්නුලදී)
දක්න ලද්දේ, දක්නාලද්දේ (ලදී)
බ: දක්නු ලද්දෝ (ලද්දාහ, ලද්දාහු, ලදහ)
දක්න ලද්දෝ (ලද්දාහ, ලද්දාහු, ලදහ)
දක්නා ලද්දෝ ( „ „ „ )

ම: { ඒ: දක්නු ලද්දෙහි
දක්නා ලද්දෙහි
බ: දක්නු ලද්දාහු
දක්නා ලද්දාහු

උ: { ඒ: දක්නු ලද්දෙමි (ලදිමි, ලද්මි)
දක්නා ලද්දෙමි (ලදිමි ලද්මි)
බ: දක්නු ලද්දෙමු (ලද්දම්හ, ලද්දම්හු,
ලදිමු, ලද්ම්හ, ලදිම්හු
දක්නා ලද්දෙමු, ( „ „ „ „ )

වර්තමාන.

ප්‍ර: { ඒ: දකිනු ලැබේ (ලැබෙයි)
දක්නා ලැබේ (ලැබෙයි)
බ: දකිනු ලැබෙත් (ති)
දක්නා ලැබෙත් (ති) }

ම: { ඒ: දකිනු ලැබෙයි, දක්නා ලැබෙයි
බ: දකිනු ලැබෙවු, දක්නා ලැබෙවු }

උ: { ඒ: දකිනු ලැබෙම් (මි), දක්නා ලැබෙම් (මි)
බ: දකිනු ලැබෙමු (ලැබෙමෝ, ලැබෙම්හ,
ලැබෙම්හු)
දක්නා ලැබෙමු (ලැබෙමෝ, ලැබෙම්හ,
ලැබෙම්හු) }

අනාගත.

ප්‍ර: { ඒ: දකිනු ලැබෙන්නේ, දක්නා ලැබෙන්නේ
බ: දකිනු ලැබෙන්නෝ, (ලැබෙන්නාහ,
ලැබෙන්නාහු)
දක්නා ලැබෙන්නෝ ( ,, ,, ) }

ම: { ඒ: දකිනු ලැබෙන්නෙහි
දක්නා ලැබෙන්නෙහි
බ: දකිනු ලැබෙන්නාහු, දක්නා ලැබෙන්නාහු }

උ: { ඒ: දකිනු ලැබෙන්නෙම් (මි)
දක්නා ලැබෙන්නෙම් (මි)
බ: දකිනු ලැබෙන්නෙමු (ලැබෙන්නමෝ,
නම්හ, නම්හු)
දක්නා ලැබෙන්නෙමු ( ,, ,, ,, ) }

ආශීර්වාද ක්‍රියාව.

ප්‍ර: { ඒ: දකිනු ලැබේවා, දක්නා ලැබේවා
බ: දකිනු ලැබෙත්වා, දක්නාලැබෙත්වා }

ම: ඒ: දකිනු ලැබෙහිවා, දක්නා ලැබෙහිවා

උ: { ඒ: දකිනු ලැබෙම්වා, දක්නා ලැබෙම්වා
බ: දකිනු ලැබෙමෝවා, දක්නා ලැබෙමෝවා }

විධි ක්‍රියාව.

ම: { ඒ: දකිනු, දකිනු ලැබෙව, දක්නා ලැබෙව
බ: දකිනු ලැබෙව්, දක්නා ලැබෙව් }

ප්‍ර: { ඒ: දකිනු ලැබෙන්නේ, දක්නා ලැබෙන්නේ
බ: දකිනු ලැබෙන්නෝ, දක්නාලැබෙන්නෝ }

## ප්‍රයොජ්‍ය ක්‍රියාව.

### අතීත.

| | දිස් | හැඬි |
|---|---|---|
| ප්‍ර: | එ: දක්වනු ලදී | හඬවනු ලදී |
| | දක්වන ලදී | හඬවනලදී |
| | බ: දක්වනු ලදහ | හඬවනු ලදහ |
| | දක්වන ලද්දහ | හඬවන ලද්දහ |
| ම: | එ: දක්වනු ලද්දෙහි | හඬවනු ලද්දෙහි |
| | බ: දක්වනු ලද්දහු | හඬවනු ලද්දහු |
| උ: | එ: දක්වනු ලද්මි (ලදිමි) | හඬවනුලද්මි(ලදිමි) |
| | බ: දක්වනු ලද්දෙමු (ලදිමු) | හඬවනු ලද්දෙමු (ලදිමු) |

### වර්තමාන.

| | | |
|---|---|---|
| ප්‍ර: | එ: දක්වනුලැබේ | හඬවනු ලැබේ |
| | බ: දක්වනු ලැබෙත් | හඬවනු ලැබෙත් |
| ම: | එ: දක්වනු ලැබෙහි(යි) | හඬවනු ලැබෙහි(යි) |
| | බ: දක්වනු ලැබෙවු | හඬවනු ලැබෙවු |
| උ: | එ: දක්වනු ලැබෙමි(මි) | හඬවනු ලැබෙමි |
| | බ: දක්වනු ලැබෙමු | හඬවනු ලැබෙමු |

### අනාගත.

| | | |
|---|---|---|
| ප්‍ර: | එ: දක්වනු ලැබෙන්නේ | හඬවනු ලැබෙන්නේ |
| | බ: දක්වනු ලැබෙන්නෝ | හඬවනු ලැබෙන්නෝ |
| ම: | එ: දක්වනු ලැබෙන්නෙහි | හඬවනු ලැබෙන්නෙහි |
| | බ: දක්වනු ලැබෙන්නාහු | හඬවනු ලැබෙන්නාහු |
| උ: | එ: දක්වනු ලැබෙන්නෙමි | හඬවනු ලැබෙන්නෙමි |
| | බ: දක්වනු ලැබෙන්නොමු | හඬවනු ලැබෙන්නෙමු |

### ප්‍රයොජ්‍ය ආශීර්වාද ක්‍රියාව.

| | | |
|---|---|---|
| ප්‍ර: | එ: දක්වනු ලැබේවා | හඬවනු ලැබේවා |
| | බ: දක්වනු ලැබෙත්වා | හඬවනු ලැබෙත්වා |

ම: ඒ: දක්වනු ලැබෙහිවා හඬවනු ලැබෙහිවා

උ: { ඒ: දක්වනු ලැබෙම්වා හඬවනු ලැබෙම්වා
බ: දක්වනු ලැබෙමෝවා හඬවනු ලැබෙමෝවා }

### ප්‍රයොජ්‍ය විධි ක්‍රියාව.

ම: { ඒ: දක්වනු ලැබෙව හඬවනු ලැබෙව
බ: දක්වනු ලැබෙව් හඬවනු ලැබෙව් }

ප්‍ර: { ඒ: දක්වනුලැබෙන්නේ හඬවනුලැබෙන්නේ
බ: දක්වනු ලැබෙන් නෝ හඬවනු ලැබෙන් නෝ }

### අසම්භාවනා ක්‍රියාව.

#### කර්තෘකාරකයෙහි.

දුටු, දුටුවොත් හැඬුව, හැඬුවොත්
දකිත, දකිතොත් හඬත, හඬතොත්

#### ප්‍රයොජ්‍යයෙහි.

දැක්වූවොත්, දැක්කුවොත් හැඬෙව්වොත්
දක්වතොත් හඬවතොත්

#### කර්මකාරකයෙහි.

දකිනු ලදහොත්
දකිනු ලැබෙතොත්

#### එහි ප්‍රයොජ්‍යයෙහි.

දක්වනු ලැබුවොත් හඬවනු ලැබූවොත්
දක්වනු ලැබෙතොත් හඬවනු ලැබෙතොත්

### පූර්ව ක්‍රියාව.

#### කර්තෘකාරකයෙහි.

දැක (ලා) හඬා (ලා)

#### ප්‍රයොජ්‍යයෙහි.

දක්වා (ලා) හඬවා (ලා)

#### කර්මකාරකයෙහි.

දකිනු ලැබ
දක්නා ලැබ

එහි ප්‍රයොජ්‍යයෙහි.

දක්වනුලැබ හඬවනුලැබ

මිශ්‍ර ක්‍රියාව.

කර්තෘකාරකයෙහි,

දකිමින් හඬමින්

ප්‍රයොජ්‍යයෙහි.

දක්වමින් හඬවමින්

කර්මකාරකයෙහි.

දකිනු ලැබෙමින්

එහි ප්‍රයොජ්‍යයෙහි.

දක්වනු ලැබෙමින් හඬවනු ලැබෙමින්

උපකාර ක්‍රියා.

**දම**, පිය, ල, ගණ යන ධාතූහු කිසි ක්‍රියාවකට උපකාර වශයෙන් යෙදෙත්. එසේ යොදන කල්හි පූර්ව ක්‍රියානතයට මේ දැක්වූ ධාතුවක් එක්කොට ඊට ප්‍රත්‍යය එක්කරණු ලැබේ.

උදාහරණ: පාළි ලින් වයා **දමව්**. කම්මැලි නැතුව වැඩ කර**පන්**. ඔබු ගෙයි තබාලා පලයන්. මම සහෝදරයා කැඳවා **ගෙණ** එමි.

අපී ක්‍රියා.

ධාතුවක් අපී ක්‍රියාවෙහි වන කල්හි නාමයක් මෙන් ලිඞ්ග විභක්ති සෙවනය කෙරේ. අපී ක්‍රියාව පුරුෂයෙක් කියනකල්හි හෝ පුරුෂයෙකු කියන නාමයකට විශෙෂණ වන කල්හි පුංලිඞ්ගය සෙවනය කෙරේ. එසේම ස්ත්‍රියක් කියනකල්හි හෝ ස්ත්‍රියකු කියන නාමයකට විශෙෂණවන කල්හි ස්ත්‍රීලිඞ්ගය සෙවනය කෙරේ.

උදාහරණ: දැන් ඕලන්ද රට රජ**කරන්නී** විල්හැල්මිනා රාජිනිය. යන වාක්‍යයෙහි **'කරන්නී'**

යනු ස්ත්‍රී ලිඞ්ගික ඒකවචන අපී ක්‍රියාවයි. එය 'විල්හැල්මිනා රැජිනී' යන්නට විශෙෂණ ද වේ.

තවත් උදාහරණ: අරන්කැමියා ආහාර නොදව **පිසන්නා** (පිසන්නේය). දර**කපන්නෝ** අද නාවෝය.

“යකිනී **කියන්නී** 'තී කොයිසිත් ලත් පුතෙක්ද? මූ මාගේ පුතනුවෝය'යි හයක් නැතුව කීය.”

“ඝොර රාත්‍රිභාගයෙහි තාමා වසන ගෙදෙරට ඇවිත් භාර්‍ය්‍යාවට **කියනුයේ** 'එව්බල සොඳුර දෙර හැරපියව'යි කීය.”

උත්තම මධ්‍යම පුරුෂ සම්බන්ධිවූ අපී ක්‍රියා ඒ ඒ පුරුෂයන් දක්වන ප්‍රත්‍යයන් අත් නොහැරද ව්‍යවහාර වේ.

උදාහරණ: “මම ඔබ මොබ **බලන්නෙම්** ගොන් දෙන්නා බැඳගෙණ යන මේ සොරදැක ලුහුබැඳ අල්ලානතිම්.” “අපි මෙතෙක්කල් මෙහි **වසන්නමෝ** එකදවසකුත් මේ වීපියට නොබටවිරුම්හ.” “පෙරත් තෝ අකුසල්කොට යකින්නාව **උපන්නෙනි** වේද, දැන් වනාහි නැවතත් අකුසල් **කරන්නෙහි** ද වී.”

නාමධාතුක ක්‍රියා.

නාම පදයන්ටද සමහරවිට වාක්‍යාන්තයෙහිදී ක්‍රියා ප්‍රත්‍යයෝ එකතුකරණු ලැබෙත්.

උදාහරණ: ඌ සුදු **ගොනෙකි**. ඒ ලමයා බස්තියන් **නම්**. “තෝ **සෙරෙහිද** නො **සෙරෙහිද**?”, “තෝ **දිව්‍යරාජයෙහිද**?” “මම රජ්ජුරුවන්ගේ **මැනියෙමි**” 'අපින් නුඹවහන්සේට එපරිද්දෙන්ම **මිත්‍රයම්හ**.”

මෙබඳු පද සෑදීමෙහිදී නාමයට ධාතුවකට මෙන් ක්‍රියා ප්‍රත්‍යයන් යොදන බැවින් ඊට නාමධාතුක ක්‍රියායි කියත්.

# V

## Relation Between
# VERB & KARAKAS.

## ක්‍රියා කාරක සම්බන්ධය.

ක්‍රියාකාරක පද සම්බන්ධය ඇති තැනෙක්හි විනා වාක්‍යයෙක් නොවේ. ක්‍රියා සම්පාදනයට කාරණ වන්නේ කාරක නම්වේ.

එබඳු කාරක කර්ම, කර්තෘ, කරණ, සම්ප්‍රදාන, අවධි, ආධාර නම් සයෙකි, ඔවුන්ගේ ලක්ෂණ විභක්ත්‍යධිකාරයෙහි දක්වනලද බැවින් මෙහි දක්වනු නොලැබේ.

විභක්ති නවයෙන් සම්බන්ධ ආලපන යන දෙක කාරක නොවෙති.

වාක්‍ය යොදන්නා කැමතිපරිද්දෙන් කර්මය හෝ කර්තෘව ප්‍රථමා විභක්තියෙන් යොදයි. එබැවින් ප්‍රථමා විභක්තිය කර්ම හෝ කර්තෘයෙහි වන්නේය. ප්‍රථමා යන නමින් කාරකයක් නොවන්නේය.

සම්බන්ධ විභක්තිය අන්‍ය පදයකට විශෙෂණ වශයෙන් සිටිනා විනා ක්‍රියා සම්පාදනයකට හේතුවක් නොවේ.

ආලපන විභක්තියද කිසිවෙක් ඉදිරියට කැඳවීමට මිස ක්‍රියා සම්පාදනයකට කාරණ නොවේ.

මෙහි දක්වනලද කර්ම කර්තෘ ආදි කාරකයන් ක්‍රියා පද හා එක්කොට යෙදීම 'ක්‍රියාකාරක පද සම්බන්ධය'යි කියනු ලැබේ.

ඊට උදාහරණ: ගොපල්ලා ලිඳෙන් වතුර ඇද කළින් ගෙණගොස් ගාලෙහි සිටින ගවයනටදෙයි.

මෙහි 'ගොපල්ලා' කර්තෘකාරකයි, 'ලිඳෙන්' අවධිකාරකයි, 'වතුර' කර්මකාරකයි, 'කළින්' කරණ කාරකයි, 'ගාලෙහි' ආධාර කාරකයි, 'ගවයන්ට' සම්ප්‍රදාන කාරකයි.

කර්ම කර්තෘ හැර අනික් කාරකයන්ගේ යෙදී ම සියලු තැන්හි අවශ්‍ය නොවන බැවින් යථාලාභ යෙන් වන්නේය.

කර ආදි සමහර ධාතුවක් කිසි තැනක විකර්ම ක බැවි (හෙවත් කර්ම දෙකක් ගන්නාබැවි) සැ ලකිය යුතු.

උදාහරණ: 'මම තුඹ මාගේ ඇමතියෙක් කරමි' කියනකල 'තුඹ' යනුද 'ඇමතියෙක්' යනුද 'කරමි' යන ක්‍රියාවෙහි කර්මයි. මෙයින් පළමුවන කර්මය ප්‍රකෘති කර්මයයිද දෙවන කර්මය විකෘති කර්ම යයිද කියනු ලැබේ.

## VI.

### Relation Between

## VERB & SUBJECT.

## උක්තානුක්ත විධිය.

කර්මකාරකය හා කර්තෘකාරකය සවකීය විභක්තිය සෙවනාය් කරණ කල්හි ක්‍රියාවෙන් උක්ත නොවේ.

වාක්‍යයකදී මේ දෙකින් එකක් උක්ත වියයුතු. එකල්හි අනික උක්ත නොවේ.

කර්තෘහු උක්තවූකල්හි එය ප්‍රථමා විභක්තිය සෙවනාය කොරේ. කර්මය සවකීය විභක්තියෙන් සිටී.

උදාහරණය: **වඩුවා ඇද සාදයි.**

කර්මය උක්තවූකල්හි එය ප්‍රථමාවිභක්ති සෙවනාය කෙරේ. කර්තෘ සවකීය විභක්තියෙන් සිටී.

උදාහරණය මෙහෙකරුවන් විසින් **ගොනා බඳි නා ලද්දේය.**

වාක්‍යයක ක්‍රියාවක් නොපෙණේනම් ප්‍රථමා විභක්තිය බලා ඊට 'වූ' ධාතුවෙන් සිඩවූ වෙයි, වේත්, ආදී ක්‍රියාවක් යොදගත යුතු. එසේ යොදගැණි මට අධ්‍යාහාරයයි කියනු ලැබේ.

'වූ' ධාතුවෙන් සිධවූක්‍රියාවන් බොහෝවිට ප්‍රථමා විභක්ති දෙකක් උක්ත කාරණබැව් සැලකියයුතු.

උදාහරණ: 'මම මහණවෙමි' කියනකල 'මම' යනුද. 'මහණ' යනුද ප්‍රථමා විභක්තියි. 'මම' ප්‍රකෘතියයි. 'මහණ' විකෘතියයි.

## VII.

### Relation Between

## SUBJECT & ATTRIBUTES.

## විශෙෂණ විශෙෂ්‍යසම්බන්ධය.

වාක්‍යයක ක්‍රියාකාරක සම්බන්ධය හැර විශෙෂණ විශෙෂ්‍ය සම්බන්ධයයි අන්‍ය සම්බන්ධයකුදු ඇත. ඒ සම්බන්ධයෙහිදී පද කීපයක් අතුරෙන් එකක් ප්‍රධානවද, අනික් පද එහි ගුණ වර්ණනාකිරීම් වශයෙන්ද පවතී. ප්‍රධාන පදය විශෙෂ්‍යයිද, සෙසු පද විශෙෂණයිද කියනු ලැබේ. විශෙෂ්‍යයෙහිවූ ලිඞ්ග විභක්ති විශෙෂණ පදයන්ටද සමාන වේ-එසේද වුවත් ව්‍යවහාර භාෂාවෙහි බොහෝවිට විශෙෂණ පදයන්ට විශෙෂ්‍යයෙහි ලිඞ්ග විභක්ති නොයොදන බැව් පෙණේ.

සමානවූ ලිඞ්ග විභක්ති යොදනලද විශෙෂණ විශෙෂ්‍ය සම්බන්ධය දක්වන නිදර්ශන:

(1) ගුත්තිලදවෙහි: —

"තෙදින් දිනි ද න න්
සක කුල සිඳු ය ද න න්
සිරින් සුරි ද න න්
නිසා සුදෙවුන් මහ ර ද න න්" *

---

* මෙහි සත්තය:—තෙදින්, තෙජසින්; දිනිඳුනන්, සූර්‍ය්‍යයා වූ; සකකුල සිඳු, ශාක්‍යවංශ නමැති සමුද්‍රයට; සඳුනන්, චන්ද්‍රයාවූ; සිරින්, ඉශ්වරයෙන්; සුරිඳුනන්, සුරෙන්ද්‍රවූ; සුදෙවුන් මහරදුනන්, ශුද්ධොදන මහ රජ්ජුරුවන්; නිසා, ඇශ්‍රයකොට.

මෙහි පළමුවෙනි දෙවෙනි තුන්වෙනි පාදයන්ගේ කෙළවර තිබෙන 'දිනිඳුනන්' 'සඳුනන්' 'සුරිඳුනන්' යන පද තුණ අන්තිම පාදයෙහි ඇති 'සුදෙවුන් මහාරදුනන්' යන පදයට විශෙෂණයි.

(2) <u>හොනා</u> නණ **කන්නා** දිටිමි.

(3) <u>අලෙක්සන්ද්‍ර බිසව්</u> කුළුණු ගුණෙන් රට වැස්සන් දුන් **බලන්නී** සියල්ලන්. විසින් බුහුමන් **කරණලද්දීය**.

(4) "එක් කුල ගෙයක බැලමෙහෙකොට ජිවත් වන්නාවූ දුක්පත් <u>ස්ත්‍රියක්</u> කාලයක් ගෙණ **පැනට යන්නී** පසේබුදුන් දැක කාලය බිමතබා පසඟ පිහිටුවා වැඳ 'ස්වාමිනි කුමක් පිණිස වැඩසිටියේක්දැ'යි **විචාලාය**." 2, 3, 4, වෙනි නිදශිනයන්හි ඇති අපිඃක්‍රියා තමන් විසින් උක්තකරණ පදයන්ට විශෙෂණව ඒ ඒ ලිඞ්ග විභක්ති සෙවනය කොරන්.

විශෙෂ්‍යයෙහි යෙදූ ලිඞ්ග විභක්ති විශෙෂණයන්හි නොයොදනලද විශෙෂණ විශෙෂ්‍ය සම්බන්ධයට නිදශීන:

(1) සැළලිහිණි අස්නෙහි:—

"පොහොසද් ද න ඇති තුනුරුවනැ බැතිපෙමා
මූ ලු ව ද් ද න සුරපුර සිරිසිරින් හැ මා
ජ ය ව ද් ද න තොරුමෙන් සුසැදි තමනමා
ජ ය ව ද් ද න පුරවර දනු මිතුරු තු මා"*

---

මෙහි සන්නය:—තුනුරුවනැ, (බුඩාදි) රත්නත්‍රයෙහි; බැතිපෙමා, භක්ති ප්‍රෙම ඇත්තාවූ; පොහොසත් දන ඇති ප්‍රභූජනයා ඇත්තාවූ; සිරි, සම්පූර්ණවූ; හැමාසිරින්, සකල ශ්‍රියෙන්; සුරපුර, දිව්‍යපුරය; මූලුවද්දන, කොණ ප්‍රවෙශකරන්නාවූ; ජයවද්දන තොරුමෙන්, ජයවර්ධනකිරීම හෙතුකොටගෙණ; තම නමා, ස්වකීය නාමය; සුසැදි, අපීනවීතවූ හෙයින් සුසජ්ජිතවූ; ජයවද්දන පුරවර, ජයවර්ධන පුරප්‍රවරය; මිතුරු තුමා, මිත්‍රොත්තමය; දනු, අවබොධකර.

මෙහි පළමුවෙනි පාදයෙන් කියන 'තුනුරුවනැ බැතිපෙමා පොහොසද් දන ඇති' යන විශෙෂණයද, දෙවෙනි පාදයෙන් කියන 'පිරි හැමා සිරින් සුරපුර මුලුවද්දන' යන විශෙෂණයද, තුන්වෙනි පාදයෙන් කියන 'ජයවද්දන කොරුමෙන් තම නමා සුසැදි' යන විශෙෂණයද, සතරවෙනි පාදයෙහි සඳහන්වූ 'ජයවද්දනා පුරවර' යන්නට විශෙෂණයෝයි.

(2) "ඒ කුමාරිකාවෝ [1]'**නිලුපුල් පෙති පරයන**' [2]'**දිගු පුලුල්වූ**' [3]'**සුනිල්**' **නුවන්** ඇතියහ."

විශෙෂණ පදයන්ට විශෙෂ්‍යය හා සමානකොට ලිඞ්ග විභක්ති යෙදීම හෝ නොයෙදීම වාක්‍ය යොදන්නාගේ අභිමතය පරිද්දෙන් වේ.

විශෙෂණ පදයෝ තුල්‍යාධිකරණ හෙවත් සමානාධිකරණ විශෙෂණ සහ භින්නාධිකරණ විශෙෂණයයි විවිධ වෙත්

**1.** 'සුදු ගොනා' යන විශෙෂණ විශෙෂ්‍ය සම්බන්ධයෙහි සුදුවූයේත් ගොනා වූයේත් එකම වස්තුව බැවින් 'සුදු' යන විශෙෂණ පදය සමානාධිකරණ විශෙෂණයයි කියනු ලැබේ. මෙබඳු විශෙෂණ පදයන්ට යම් විටක ලිඞ්ග විභක්ති යොදතහොත් විශෙෂ්‍යය හා සමානවේ. ලිඞ්ග විභක්ති නොයෙදූ මෙබඳු විශෙෂණ පද හැඳින්වීම පිණිස 'වූ' යන්නක්ද යොදති.

තවත් උදාහරණ: මිහිරි රස, යහපත්වූ මිනිසා.

2. 'රජදරු' කී තන්හි රජවූයේත් දරුවූයේත් එකම තැනැත්තෙක් නොව දෙදෙනෙක් කොට රජුගේ දරුයයි අර්ථ වැටහෙයි. එබැවින් 'දරු' යන්නට විශෙෂණවූ 'රජ' යනු භින්නාධිකරණ විශෙෂණයයි කියනු ලැබේ.

තවද 'පොල්තෙල්' කීතන්හි පොල්වූයේත් තෙල් වූයේත් එකම වස්තුවක් නොව පොලෙහි තෙල් යයි අපි වැටහෙන බැවින් 'තෙල්' යන්නට විශෙෂණවූ 'පොල්' යන්නද භින්නාධිකරණ විශෙෂණයයි කියනු ලැබේ.

අස්ලොම්, සූරපුර, ආදිය මීට තවත් උදාහරණයි. භින්නාධිකරණ විශෙෂණයන්ට විභක්ති යොදන කල්හි සමානාධිකරණයෙහිදී මෙන් විශෙෂ්‍යයෙහිවූ විභක්ති නොයොදා සම්බන්ධාදී අන්‍ය විභක්ති යක් යොදනු ලැබේ. එහෙයින් භින්නාධිකරණයයි කියනු ලැබේ.

ක්‍රියාවක ගුණ කියන හොහොත් ක්‍රියාව කෙරෙණ ආකාරය දක්වනපද ක්‍රියා විශෙෂණ නම්වේ.

උදාහරණ: ගොනා **ඉක්මණින්** දුවයි. රන්කරුවා **සෙමින්** තමාගේ වැඩ කරන්නේය. මමිතුරා **සුවසේ** බොහෝ කලක් ජීවත්වේවා.

ක්‍රියා විශෙෂණ පදනනයෙහි සමහරවිට කරණසපදන් ආදී විභක්ති රූප පෙණේ. කිසි තැනක සේ, ලෙස, ආදි නිපාතද පෙණේ.

## VIII
## INDECLINABLES.
### අව්‍යය (අවිය).

**ලිඞ්ග** විභක්ති හා සංඛ්‍යා භෙදයන් නොදක්වන් නාවූ වරනොනැගෙණ පද අව්‍යය නම් වෙත්.

### නිපාත (නිපා).

වාක්‍යයන මූලට මැදට හෝ අගට එයි අර්ථ සුබාවබොධය ආදී කිසි කාරණයක් පිණිස දමන විචිත්‍රාර්ථවූ පද නිපාත * යයි කියනු ලැබේ.

සහ, හා, ද, ත්, ආදිය සමුච්චයාර්ථයෙහි (කැටිකිරීමෙහි) ද;

---

* නිපාත—වැටීම යනාර්ථයි.

වනාහි, නම්, ආදිය උපන්‍යාසයෙහි හෝ වාක්‍යාලංකාරයෙහිද;

අනේ, අහෝ, ආදිය ඛේදාර්ථයෙහි (දුක හැඟවීමෙහි) ද;

එම්බා, එම්බල, කොල, ආදිය ආමන්ත්‍රණාර්ථයෙහි (අභිමුඛකිරීමෙහි) ද;

අ, න, නො, ආදිය ප්‍රතිෂේධාර්ථයෙහි (ඇර්ථය බාධාකිරීමෙහි) ද;

කිම්, ද, ආදිය ප්‍රශ්නාර්ථයෙහිද;

විනා, මිස, මුත්, ආදිය විප්‍රයොගාර්ථයෙහි (වෙන් කිරීමෙහි) ද;

හෝ, නොහොත්, එක්කෝ, නම් ආදිය අනියමාර්ථයෙහිද;

මෙන්, සේ, වැනි, ආදිය උපමා දැක්වීමෙහි හෙවත් තුල්‍යාර්ථයෙහිද;

වහා, නිතර, නැවත, ඇලි, වැලි, දැන්, අද, හෙට, ඊයේ, සාවද්‍ය ආදිය ක්‍රියා විශෙෂණාර්ථයෙහිද;

තෙක්, දක්වා, ආදිය අවධි අර්ථයෙහිද;

ල, ලූ, ශ්‍රැතිසූචනාර්ථයෙහි (ඈසූදෙයකීමෙහි)ද;

ම,අවධාරණයෙහි හෙවත් නිශ්චයාර්ථයෙහිද වූ නිපාතයි.

තෙම, තොමේ, යන නිපාත පුල්ලිංග පෙරවිබත් එක බස දැක්වීම පිණිසද;

තොම, තොමෝ, යන නිපාත ස්ත්‍රීලිංගික ප්‍රථමා විභක්ති එක වචන දැක්වීම පිණිසද;

තුමූ * යන නිපාතය පුංලිංගික හෝ ස්ත්‍රී ලිංගික ප්‍රථමා විභක්ති බහුවචන දැක්වීම පිණිසද;

---

* තෙමේ, තොමෝ, තුමූ, කිසි විටක නාම වෙත්. උදාහරණ: "**තොමේ** තමාට අරණලද දෙර ඇති ගඳකිළි පිරිවෙණින් නික්ම"; "හැෂ්, තිට අත්පා නැද්ද? **තොමෝත්** ගසට නැගී දිඹුල් කඩාගණ නා"; "දිවියෝ දුවල් සරක් රැක සවස ගෙණවුත් ගාල්වල ලා රත්‍රිභාගයෙහි **තුමූ** ගොදුරු සොයා කති."

විසින් යන නිපාතය අනුක්ත කර්තෘත්ව දැක්වීම පිණිසද;

නාම පදයන්ට පසුව යොදනු ලැබෙත්.

නිපාත පදයන්ගේ අර්ථ ඒ ඒ නිපාත වැටී තිබෙන වාක්‍යයන්ගේ අර්ථ සම්බන්ධයෙන් සැලකියයුතු.

ගොස්, ඇවිත්, සී, කියා, හැර, තබා, වඩා, නිසා ආදි පූර්වක්‍රියාවෝද නිපාතයයි සලකනු ලැබෙත්.

## උපසර්ග (උපසග).

කිසි උපසර්ගයක් ධාතුවක අර්ථය බාධාකෙරෙයි, කිසිවක් එයට අනුගත වේ, අන් සමහරක් එය වෙනස්කෙරේ.

උදාහරණ: වියොග යන පදයෙහි 'වි' උපසර්ගයෙන් යුජ් (යෙදීමෙහි හෝ එක්වීමෙහි) යන ධාතුවෙහි අර්ථබාධාකාරණ ලැබේ. ප්‍රයොග යන පදයෙහි 'ප්‍ර' උපසර්ගය යුජ් (යෙදීමෙහි) යන ධාතුවෙහි අර්ථයට අනුගතවේ. අවවාද යන පදයෙහි 'අව' උපසර්ගයෙන් වද්(කථාවෙහි) යන ධාතුවෙහි අර්ථය වෙනස්කරණ ලැබේ.

| උපසර්ග | | උපසර්ග සහිත පද | |
|---|---|---|---|
| සංස්කෘත. | සිංහල | සංස්කෘත. | සිංහල. |
| ප්‍ර | ප | ප්‍ර'භා | ප'බ (බැබළීම) |
| | | ප්‍ර'මාණ | ප'මණ |
| | | ප්‍ර'යොග | පි'යෝ |
| පරා | පර | පරා'ක්‍රම | පැර' කුම් |
| | | පරා'ජය | පැර'දුම් |
| අව | අව | අව'ඥා | අව'සේ |
| | | අව'වාද | ඕ'වා |
| සං | ස | සම්'බන්ධ | ස'බඳ |
| | | සං'යොග | සි'යෝ |
| අනු | අනු | අනු'ඥා | අනු'දැන්ම |
| | | අනු'කම්පා | |

| | | | |
|---|---|---|---|
| නි / නිඃ(නිර්) | නි | නි'ග්‍රහ | නි'ගා |
| | | නිෂ්'පත්ති | නි'පැදුම් |
| | | නිෂ්'ක්‍රාන්ත | නි'කුත් |
| දුඃ (දුර්) | දු | දුර්'ලභ | දු'ලබ |
| | | දුශ්චරිත | දු'සිරි |
| වි | වි | වි'ලාස | වි'ලස් |
| | | වි'කාර | වි'යරු |
| ආ | අ | ආ'ධාර | අ'දර |
| | | ආ'ගම | අ'ගම් |
| අධි | අදි | අධි'කාර | අදි'යර |
| | | අධ්‍යයන (පාඩම්කිරීම) | ඇදුරුම් |
| අභි | අබි | අභි'ෂේක | අබි'සෙස් |
| | | අභි'වෘද්ධි | |
| සු | සු | සු'චරිත | සු'සිරි |
| | | සු'භාෂිත | සු'බැසි |
| උද් | උ | උද්'ග්‍රහණ | උ'ගැන්ම, ඉ'ගැන්ම |
| | | උ'ල්ලඞ්ඝන | උ'ලැහි(උඩින් පැන යාමහෝ ඉක්මයාම) |
| පරි | පිරි | පරි'වාර | පිරි'වර |
| | | පරි'ෂ්කාර | පිරි'කර |
| උප | උව | උප'චාර | උව'සර(ලඟහැසිරීම |
| | | උප'ස්ථාන | උව'ටන් |
| අප | අප | අප'කාර (අනදර) | |
| | | අපාදන | අප'දන් (ඉවතගැන්ම) |
| | | අප'කර්ෂ(පහලට ඇදීම) | |
| ප්‍රති | පස් | ප්‍රත්‍යක්ෂ | පසක් (ඉන්ද්‍රියයන්ට සම්මුඛවීම) |
| | පිළි | ප්‍රති'ලාභ | පිළි'ලබ |
| අති | අති | අති'රික්ත | ඉති'රි |
| | | අති'ක්‍රාන්ත | ඉ'කුත් |
| අපි (පි) | | අපි'ගම් (ලංවීමෙහි) | |
| | | අපි'ධා, පි'ධා(වැසීමෙහි) | |
| | පි | | පි'හිතුළු (වැසීම) |

සු, දු, අව, ආදි අව්‍යයෝ කිසි තැනෙක උපසර්ග වෙත්, කිසි තැනෙක නිපාත වෙත්.

වාක්‍ය සෑදී තිබෙන්නාවූ නානා පදයන් වෙනස්කොට ඒ ඒ පදයන්ට ව්‍යාකරණ විභාග දක්වන ක්‍රමය පෙන්වා නිදර්ශනයන් මිට සම්බන්ධ කරණු ලැබේ.

## IX.

## ELISION.

### ලොප (ලොප්) විධිය.

පදයක යම් වර්ණයක් නොකියා හැරීම ලොප (ලොප්) නම් වේ.

'හැරගෙණ' කියයුතු තන්හි 'රගෙණ' කියන කල 'හැ' යන්න ලොප්වේ. 'අරන්' (ගනය) කියයුතු තැන 'රන්' කියන කල 'අ' කාරය ලොප්වේ. 'රදනු' කියයුතු තන්හි 'රනු' කියනකල 'ද'යන්න ලොප්වේ. 'අඹමල්' කියයුතු තන්හි 'අම්මල්' කියනකල 'බ' යන්න ලොප්වේ. 'පාද' කියයුතු තැන 'පා' කියන කල 'ද'කාරය ලොප්වේ

මේ දක්වනලද උදාහරණයන්ගෙන් පදයක මුල මැද අග යන තුන් තැන්හිම අකුරු ලොප්වියහැකි බව පෙනේ.

## SUBSTITUTION.

### ආදේශ (අදෙස්) විධිය.

වර්ණයන් ලොපකොට ඒ වෙනුවට අන්‍ය වර්ණයක් පැමිණවීම ආදෙශ(අදෙස්) නම් වේ.

'සාවා' කියයුතු තන්හි 'හාවා' කියනකල 'හ' කාරය ආදෙශවේ. 'සුගඳ' කියයුතු තන්හි 'සුවඳ' කියනකල 'ව'කාරය ආදෙශයයි. 'ගහුල්'කියයුතු තැන 'ගවුල්' කියනකල 'ව' කාරය ආදෙශයයි. 'දුබල' කි

# Table of Parsing.

## උම්මග්ගජාතකයෙහි:

"මෙසේ ඒ අමරාදේවී බෝධිසත්ත්වයන්වහන්සේට මග කියාලා පියානන්ට සුළුකැන් ඇරගෙණ නැගී ගියහ. මහබෝසතානන්වහන්සේත් අමරාදේවීන් කී මගින් උන්ගේ ගෙට වැඩිසේක."

මේ වාක්‍ය දෙක්හි ක්‍රියාකාරක සම්බන්ධයෝ:—අමරාදේවී බෝධිසත්ත්වයන්වහන්සේට මග කියාලා පියානන්ට සුළුකැන් ඇරගෙණ නැගී ගියහ. බෝසතානන්වහන්සේ මගින් ගෙට වැඩිසේක.

මේ වාක්‍ය දෙක්හි ඇති විශේෂණ විශේෂ්‍ය සම්බන්ධයෝ: ඒ—අමරාදේවී; මහ—බෝසතානන්වහන්සේ; කී—මගින්; උන්ගේ—ගෙට.

| වාක්‍යයෙහි ඇති පද. | පදවිභාගය | වචන | නාමපදයක් නම්: ලිංග | නාමපදයක් නම්: විභක්තිය. | ක්‍රියාපදයක් නම්: කුමන ක්‍රියාද යන බව. | ක්‍රියාපදයක් නම්: සකර්මක අකර්මක භේදය. | ක්‍රියාපදයක් නම්: ප්‍රකාරය | ක්‍රියාපදයක් නම්: පුරුෂ | ක්‍රියාපදයක් නම්: කාලය | නිපාතාදි කිසිවක් නම් එහි විභාගය. | වැඩි විභාග. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| මෙසේ | නිපාත | ...... | ...... | ... | ... | ... | ...... | ...... | ...... | ක්‍රියාවිශේෂණ | 'කියාලා' යන පූර්ව ක්‍රියාවට |
| ඒ | සර්වනාම | ...... | ...... | ... | ... | ... | ...... | ...... | ...... | විශේෂණ | 'අමරාදේවී' යන්නට |
| අමරාදේවී | නාම | ඒක | ස්ත්‍රී | ප්‍රථමා | ... | ... | ...... | ...... | ...... | .. | 'ගියහ' යන අපර ක්‍රියාවෙන් උක්ත කර්තෘයි |
| බෝධිසත්ත්වයන්වහන්සේට | නාම | ඒක | පුං | සම්ප්‍රදාන | ... | ... | ...... | ...... | ...... | .. | .. |
| මග | නාම | ඒක | ...... | කර්ම | ... | ... | ...... | ...... | ...... | .. | 'කියාලා' යන්නෙහි |
| කියාලා | ක්‍රියා | ...... | ...... | ... | පූර්ව ක්‍රියාව | සක | කර්තෘ | ...... | ...... | .. | .. |
| පියානන්ට | නාම | බහු* | පුං | සම්ප්‍රදාන | ... | ... | ...... | ...... | ...... | .. | .. |
| සුළුකැන් | නාම | ඒක | ...... | කර්ම | ... | ... | ...... | ...... | ...... | .. | 'ඇරගෙණ' යන පූර්ව ක්‍රියාවෙහි |
| ඇර ගෙණ | ක්‍රියා | ...... | ...... | ... | පූර්ව ක්‍රියා | සක | කර්තෘ | ...... | ...... | .. | .. |
| නැගී | ක්‍රියා | ...... | ...... | ... | පූර්ව ක්‍රියාව | අක | කර්තෘ | ...... | ...... | .. | .. |
| ගියහ. | ක්‍රියා | බහු* | ...... | ... | අපර ක්‍රියාව | අක | කර්තෘ | ප්‍රථම | අතීත | .. | .. |
| මහබෝසතානන්වහන්සේ | නාම | ඒක | පුං | ප්‍රථමා | ... | ... | ...... | ...... | ...... | .. | 'වැඩිසේක' යන අපර ක්‍රියාවෙන් උක්ත කර්තෘ |
| ත් | නිපාත | ...... | ...... | ... | ... | ... | ...... | ...... | ...... | සමුච්චයාර්ථයෙහි | .. |
| අමරාදේවීන් | නාම | බහු* | ස්ත්‍රී | කර්තෘ | ... | ... | ...... | ...... | ...... | .. | 'කී' යන්නෙහි. |
| කී | ... | ...... | ...... | ... | ... | ... | ...... | ...... | ...... | විශේෂණ | 'මගින්' යන්නට |
| මගින් | නාම | ඒක | ...... | කරණ | ... | ... | ...... | ...... | ...... | .. | .. |
| උන්ගේ | සර්වනාම | බහු* | ස්ත්‍රී | සම්බන්ධ | ... | ... | ...... | ...... | ...... | .. | .. |
| ගෙට | නාම | ඒක | ...... | කර්ම † | ... | ... | ...... | ...... | ...... | .. | 'වැඩිසේක' යන ක්‍රියාවෙහි |
| වැඩිසේක | ක්‍රියා | ඒක | ...... | ... | අපර ක්‍රියාව | සක | කර්තෘ | ප්‍රථම | අතීත | .. | 'සේක' යනු ක්‍රියාවන් අගට එකතු කරණ ගෞරවාර්ථයෙහි නිපාතයකි |

* සිංහල භාෂාවෙහි ගෞරව පිණිසද නොයෙක්විට ඒකාර්ථ පද බහුවචනයෙහි යොදනු ලැබේ.

† ගමනාර්ථ ධාතූහු බොහෝ කොට සකර්මක වෙත්. ඒ ධාතූන්ගෙන් සෑදූ ක්‍රියාවන්ට කර්ම වන පදයන් වෙත 'ට' යන විභක්ති රූපය හෝ 'ට' යන්නකින් යුක්තවූ අන්‍ය විභක්ති රූප හෝ බොහෝවිට පෙනේ.

'පාසා' යන නිපාතය හා සම්බන්ධ වන පදය කිසි තැනක විකිරූප කොටද, කිසි තැනක එසේ නොකොටද ව්‍යවහාරවේ. උදාහරණ: කෝරළ යක් කෝරළයක් පාසා මුදලි කෙණෙක් සිටි. නාග රයක් පාසා අධිකරණ ශාලාවක් තැබියයුතු.

METATHESIS.

## විපර්‍යාස (පෙරළි) විධිය.

පිළි පෙරළි, වර්ණපෙරළි, පදපෙරළි, විබත් පෙරළි, කිරියපෙරළි කියා විපර්‍යාසය (පෙරළි) පඤ්චවිධ වේ.

1. පිළි පෙරළි නම් පදයක ස්වර වෙනස්වීමය. 'උගෙණ' කියයුතු තැන 'ඉගෙණ' කියනකලද, 'තුසුම්' කියයුතු තැන 'තිසුම්' කියන කලද පිළි පෙරළිවී තිබේ.

2. වර්ණ පෙරළි නම් යම් පදයක ගාත්‍රාක්‍ෂර මාරුවීමයි.

'කෙළවර' කියයුතු තැන 'කොරවළ' කියනක ලද 'එරඬු' කියයුතු තැන 'එඬරු' කියනකලද 'සම ණ' කියයුතු තැන 'මහණ' * කියනකලද වර්ණ පෙරළිවී තිබේ.

3. පද පෙරළි නම් පදයන්ගේ මාරුවීමයි.

'පතිදම්' කියයුතු තැන 'දම්පති' කියනකලද 'විසිපස්වෙනි' කියයුතු තැන 'පස්විසිවෙනි' කියන කලද 'දත්රජ' (ලොකු දත) කියයුතු තැන 'රජ දත්' කියන කලද පද පෙරළිවී තිබේ.

4. විබත් පෙරළි නම් යම් පදයක් ගතයුතු වි භක්ති හැර අන්‍ය විභක්ති ගැණීමයි.

"ඒ අඥාන **පණ්ඩිතයෝ නන්දෙඩන්නවුන්** මෙන් කට්ට ආවක්ම කීහ." යන වාක්‍යයෙහි පණ්ඩිතයන්ට උපමාකළාවූ 'නන්දෙඩන්නවුන්' යන පදය "[illegible]ඩන්නෝ' යයි පෙරවිබත්

---

* 'මහණ' කියන තැන 'හ'කාරය 'ස'කාරයවූ ආදෙශයකි.

ගතමනා වුවද එසේ නොගෙණ කම්විබත් ගත් බැවින් විභක්ති විපර්‍යාසයි.

"මම දන බිමඹබා නැඹුරුව **ගොයෙකු** සේ බඩ ගා යමි." "**කුමාරයෝ** දණ්ඩෙන් ගැසූ **නයෙකු** සේ කිපී රජගෙට වත්හ." යන වාක්‍යයන්හි 'ගොයෙකු' 'නයෙකු' යන පදද යටකී පරිද්දෙන් විභක්ති විපර්‍යාසයෙන් කර්ම විභක්තියෙහි යොදන ලද්දේය.

මෙන්, සේ, යන නිපාත සම්බන්ධයෙහිදී ප්‍රථමා විභක්ති ගතයුතු පද බොහෝවිට කර්ම විභක්ති ගණිත්.

අන්‍ය උදාහරණයක්:

ගුත්තිල කාව්‍යයෙහි:—

"අද මව් පිය දෙදෙ නා
ඔහු වයනා බව නොම දැ නා
කතී වෙණ මීය නා
සුසූදයි අතගැසූ සැකයෙ නා"*

යන කවෙහි 'මීයෝ' යයි පෙරවිබත් තිබියයුතු තන්හි 'මීයනා' යයි විභක්ති විපර්‍යාසයෙන් කතු විබත් යොදතිබේ.

5. කිරිය පෙරළි නම් වර්තමානකාල ප්‍රත්‍යය තැබියයුතු ක්‍රියාවෙක්හි අනාගත කාල ප්‍රත්‍යය තැබීමද විධි ක්‍රියා ප්‍රත්‍යය තැබියයුතු ක්‍රියාවෙක්හි වර්තමාන කාල ප්‍රත්‍යය තැබීමද, ආදී ක්‍රියා ප්‍රත්‍යයන් මාරුකිරීමයි.

"පණ්ඩිතයෝ පළමු කී අපරාධයම **කියන්නාහ.**" "නුවනැත්තාහු දුකට පැමිණියන්ට නිග්‍රහ නො

---

* සන්නය:- අද, අඬවු: මව්පිය දෙදෙන, (ගුත්තිලාචාර්‍ය්‍යයන්ගේ) මව්පිය දෙදෙනා; ඔහු, ඒ මූසිලයා; වයනබව, වාදනයකරණ බව; නොමදැන, නො[illegible]; වීණකතී, මීයෝ කත්යයි; සැකයෙන [illegible] ගැසූ, සුසූකියා අත්ලගීහුවෝය.

**කරන්නාහ**" යන වාක්‍ය දෙක්හි '**කියති**' 'නොකරති' යසි වර්ත්තමාන ප්‍රත්‍යයෙන් යුක්ත ක්‍රියා නොතබා ක්‍රියා විපර්‍ය්‍යාසයෙන් අනාගත ප්‍රත්‍යයෙන් යුක්තක්‍රියා තබනලද්දේය.

ගුත්තිල **දාවෙන්** මීට තවත් උදහරණ මෙහි දක්වනු ලැබේ.

"මේ ගුත්තිල ඇදු රු
කොළෙහි නෝ දැන් තට ගු රු
එබැවින් තගෙ නිය රු
තෙපුල් කෙලෙසක **නොවන්නෙ** ද බො රු"*

"මෙයින් එක ගුලිය ක්
දමව ඉන් තුන් සියය ක්
සුරඟන බැස පස ක්
සතුටුකර **නටති** දන මනස ක්"†

"සුගත් මෙත් බෝස ත්
විදුරත් තිනෙත් පියුම ත්
ගහණත් තිනෙත් පු ත්
මෙසත් සුර සත් ලොවට සෙත් දෙ ත්"‡

---

* අන්වය:—මේ ගුත්තිල ඇදුරු, මේ ගුත්තිල නම් ආචාර්‍ය්‍යයිනි; නෝ, යුෂ්මත්හු; දැන්, මේකාලයෙහි හෙවත් මේ ආත්මභාවයෙහි; තට ගුරු කොළෙහි, ඔබගේ ගුරුකොළෙහිය; එබැවින්, එහෙයින්; තගෙ නිසරු තෙපුල්, තාගේ නිස්සාර වදන්; කෙලෙසක බොරුනොවන්නෙද, කෙසේ මුසාවාද නොවේද?

† මෙයින් එක ගුලියක්, (මාවිසින් දෙනලද) මේ ගුලිකාවන්ගෙන් එකක්: දමව, නික්ෂෙපකර; ඉන්, ඒ නිමිත්තයෙන්; තුන්සියයක්, ත්‍රිශත සංඛ්‍යාතවූ; සුරඟන, දිව්‍යප්සරාවෝ; බැස, බැසලා; පසක්, ප්‍රත්‍යක්ෂයෙහි (අභිමුඛයෙහි); දනමනසක් සතුටුකර, ජනයාගේ මනොනෙත්‍රයන් සතුටුකොට; නටති, නෘත්‍යකරන්නෝය.

‡ සුගත්, බුද්ධයා; මෙත් බෝසත්, මෛත්‍රී බෝධිසත්වයෝය; විදුරත්, ශක්‍රයා; තිනෙත්, ඊශ්වරයා; පියුමත්, බ්‍රහ්මයා; ගහණත්, ගණදෙවියා; තිනෙත්පුත්, ස්කන්ධ කුමාරයා (යන) මෙසත් සුර, මේ සතපත් දෙවිවරු; සත්ලොවට, සත්වලොකයාට; සෙත්දෙත්, ශාන්තිදානය කෙරෙත්වා.

පළමුවෙනි කවෙහි 'නොවේ' දැයි වර්ත්තමාන ක්‍රියා යෙදියයුතු තැන 'නොවන්නේ'දැයි අනාගත ක්‍රියා යොදද, දෙවෙනි කවෙහි 'නටන්නෝ' යයි අනාගත ක්‍රියා යෙදියයුතු තැන 'නටති'යයි වර්ත්තමාන ක්‍රියා යොදද, තුන්වෙනි කවෙහි 'දෙත්වා' කියා ආශීර්වාද ක්‍රියා යෙදියයුතු තැන 'දෙයි' කියා වර්ත්තමාන ක්‍රියා යොදද ක්‍රියා විපර්‍ය්‍යාස කොට තිබේ.

## වෘද්ධි (වැඩි) විධිය.

ELONGATION.

වෘද්ධි (වැඩි) නම් යම් පදයක එක මාත්‍රාවූ ස්වර යක් ද්විමාත්‍රාකොට දීර්ඝකිරීමයි. (ලඝු ස්වරයෝ එක මාත්‍රාවක් ඇත්තෝය. ගුරු ස්වරයෝ ද්විමාත්‍රා ඇත්තෝය. ව්‍යඤ්ජනාක්ෂරයෝ අර්ධමාත්‍රාඇත්තෝය.*

'උවරණ' කියයුතු තන්හි 'උවාරණ' † කියන කලද 'නවම්' කියයුතු තන්හි 'නවාම්' ‡ කියන කලද 'අ' කාරයට මාත්‍රාවෘද්ධිවී තිබේ.

ගුත්තිල දවෙහි:

"සුවඳ කුසුම් වරලසෙහි
පැළඳ කපුරු හර උරෙහි
නොමද බරණ ලා සැරහී
නිබද කෙළිති ලියො පුරෙහි"§

---

* අර්ධමාත්‍රාවක් ඇති ගාත්‍රාක්ෂරයක් සම්පූර්ණ මාත්‍රාවක් කොට ඊට හ්‍රස්ව ස්වරයක් පැමිණවීමද ඇතම්කෙනෙක් වෘද්ධියයි කියත්.

† උපකරණ. ‡ අළුත්කිරීම.

§ වරලසෙහි, කොණ්ඩයෙහි; සුවඳ කුසුම්, සුගන්ධ පුෂ්ප යන්ද; උරෙහි, ළයෙහි; කපුරුහර, කර්පූරහාරයන්ද; පැළඳ පැළඳගෙණ; නොමද, බොහෝවූ; අබරණලා සැරහී, ආභරණයන් බහා පැළඳ; පුරෙහි, නගරයෙහි; ලියො, ස්ත්‍රීහු; නිබද කෙළිති, නිරන්තරයෙන් ක්‍රීඩා කෙරෙති.

"කෙ ළි මි න් තැන තැන ල    න් දු
දෙන මෙන් කණ අඹි    න් දු
කි ය මි න් සොඳ ගි සි    න් දු
ඇ සු ව න් සිත දුක් බි    න් දු"*

යන කව් දෙකින් පළමුවෙනි කවෙහි 'වරලසෙහි' 'උරෙහි', 'පුරෙහි', කියයුතු තන්හි පදන්තයන්හි 'ඉ' කාරයද; දෙවෙනි කවෙහි 'ලඳු', 'බිඳු', සිඳු', කියයුතු තන්හි පදන්තයන්හි 'උ' කාරයද මාත්‍රා වෘද්ධිවී තිබේ.

'අස්' කියයුතු තැන 'ඈස්' කියනකලද, 'අල්' කියයුතු තැන 'ඇල්' කියන කලද මාත්‍රාංශයක් වෘද්ධි වී තිබේයයි සිදත්සඟරා නම් ව්‍යාකරණයෙහි කියනලදී.

## ABBREVIATION.

## හානි (අඩු) විධිය.

හානිය (අඩු)නම් මාත්‍රා හානියයි.

කාව්‍යසේඛරයෙහි:

"පෙරටුව සහසක    ර
දුරුකෙලෙ අරුණු ගනඳ    ර
ඔබ් වඩන මගතු    ර
ඉවත කරණෙව් සතුන් වෙතඳ    ර"†

---

* ලන්දු, ස්ත්‍රීහු, තැන තැන, තන්හි තන්හි; කෙළිමින්, ක්‍රීඩාකරමින්; කණ, කර්ණයෙහි; අඹින්දු, අමෘතබින්දූන්; දෙනමෙන්, දෙන්නා සෙයින්; සොඳ, යහපත්වූ; ගිසින්දු, ගීතිකා සින්දු; කියමින්, කථනයකරමින්; ඇසුවන් සිත, ඇසූවන්ගේ සිත්හි; දුක්බින්දු, දුක් දුරුකළෝ.

† ඔබවඩන, ඔබවහන්සේ වඩින්නාවූ; මගතුර, මාර්ගාන්තරයෙහි; වෙතඳර, වෙත්‍රධාරීන් විසින්; සතුන්, සත්වයන්; ඉවත්කරණෙව්, පහකරණ පරිද්දෙන්; සහසකර, සූර්ය්‍යයා, පෙරටුව, පූර්වයෙන්; අරුණු, අරුණාලෝකය තෙම; ගනඳර, ඝනාන්ධකාරය; දුරුකෙළෙ, දුරීභූතකෙළේය.

යන කාවෙහි දෙවෙනි පෙදෙහි 'දුරුකෙළේ'යයි කියයුතු තැන මත් අඩුකොට 'දුරුකෙළෙ'යයි කියා තිබේ.

'දංග' 'කන්ද' කියයුතු තන්හි මාත්‍රාංශයක් හානිවී 'දඟ' 'කඳ' කියා සෑදී තිබේයයි සිදත්සඟරා ව්‍යාකරණයෙහි දක්වා තිබේ.

මේ නව වැනිවූ පරිච්ඡේදයෙහි දක්වනලද ලෝපය, ආදේශය, පූර්වරූපය, පරරූපය, ආගමය, ද්විත්වරූපය, විපර්‍ය්‍යාසය, වෘද්ධිය, හානිය යන නව වැදෑරුම්වූ ව්‍යාකරණ විධි ශබ්ද ධර්‍මයෙන් හෝ ඡන්දස් හෙතුවෙන් කටයුත්තේයි.

ශබ්ද ධර්‍මය නම්: උගතුන් අතරේ පැවත එන ශබ්දයන්ගේ මනා ව්‍යවහාරයයි. ඡන්දස් හෙතුව නම්: කාව්‍ය ප්‍රබන්ධය පිණිස උගන්වනලද වර්‍ණ මාත්‍රානියමය අනුවයාමයි. එසේද වුවත් මාත්‍රා නියමය අනුව යාමෙන් ශබ්දයන්ගේ මනා ව්‍යවහාරය අතික්‍රාන්තකොට ලෝපාදිය නොකටයුත්තේය.

මෙහි කී ලෝපාදිය හා මත්තට කියන සන්ධි, සමාස, ප්‍රත්‍යයාදිය හා සියල්ල උගතුන්ගේ යෙදුම් අනුසාරයෙන්ම කටයුත්තේය.

## X.
## PERMUTATION
## සන්ධි (සඳ).

එකාටෙක ලංවූ පද දෙකකින් පෙර පෙදෙහි අගද පසු පෙදෙහි මුලද එක්කොට ගැළපීම සන්ධි (සඳ) නම් වේ.

ප්‍රකෘතියට ප්‍රත්‍යයන් එක්කිරීමේදීද බොහෝ විට සන්ධිකරණ ලැබේ.

ශුද්ධ සිංහලෙහි සන්ධි ක්‍රම දසයක් වේ. එනම්:

1. පූර්වස්වරලෝප සන්ධිය...(පෙරසරලොප්සඳ)
2. පරස්වරලෝප සන්ධිය...(පරසරලොප්සඳ)
3. ස්වර සන්ධිය ..........(සරසඳ)
4. ස්වරාදේශ සන්ධිය......(සරදෙස් සඳ )
5. ගාත්‍රාදේශ සන්ධිය.....(ගතදෙස් සඳ)
6. පූර්වරූප සන්ධිය........(පෙරරූ සඳ)
7. පරරූප සන්ධිය.......(පරරූ සඳ)
8. ගාත්‍රාක්ෂරලෝප සන්ධිය(ගතකුරු ලොප් සඳ)
9. ආගම සන්ධිය........(අගම් සඳ)
10. විත්වරූප සන්ධිය.......(දෙරූසඳ) යනාමේය.

1. **පූර්වස්වරලෝප සන්ධි** විධියෙන් සන්ධි කටයුතු ස්ථානයෙහි පූර්වස්වරය ලොපකොට පරස්වරය පූර්වපදාන්තයෙහි ගාත්‍රාක්ෂරය කරා පමුණුවනු ලැබේ.

උදාහරණ: 'දිනඉසුරු' කියයුතු තන්හි 'දිනිසුරු'* කියාද, ගොණ එන' කියයුතු තන්හි 'ගොණෙන' කියාද, 'දිගු ඇස' කියයුතු තන්හි 'දිගැස' † කියාද සන්ධිකරණු ලැබේ.

පද දෙකක් සන්ධි වන පරිදි මේ මතු දක්වන සංයෝජනාවෙන් වඩා පැහැදිලි වේ.

සංයෝජනා:

| | |
|---|---|
| දින + ඉසුරු | දිගු + ඇස |
| දින්-අ + ඉසුරු | දිග්-උ+ඇස |
| දින්+ඉසුරු | දිග්+ඇස |
| දිනිසුරු | දිගැස |

2. **පරස්වරලෝප සන්ධි** විධියෙන් සන්ධි කටයුතු ස්ථානයෙහි පරස්වරය ලොපකරණු ලැබේ.

උදාහරණ: 'දෙවි උතුමා' කියයුතු තන්හි 'දෙවිතුමා' කියාද, 'බිගු අවල'‡ කියයුතු තන්හි 'බිගුවල' කියාද 'බමරු අවට' කියයුතු තන්හි 'බමරුවට' කියාද සන්ධිකරණු ලැබේ.

---

* දිනිසුරු යන්නෙන් සූර්යයා කියනු ලැබේ. † ස්ත්‍රියයි.
‡ මීමැස්සන්ගෙන් ආකුලවූ

සංයෝජනා.

දෙවි +උතුමා
දෙව්—ඉ +උතුමා
දෙව්—ඉ +තුමා
දෙවිතුමා

බමරු +අවට
බමර්—උ +අවට
බමර්—උ +වට
බමරුවට

බිඟු +අවල
බිඟ්—උ+අවල
බිඟ්—උ +වල
බිඟුවල

3. **සවර** සන්ධි විධියෙන් ලොපයක් නොකොට පසු පෙදෙහි මුලින් ඇති සවරය පෙර පෙදෙහි අග ඇති ගාත්‍රාක්ෂරය කරා පමුණුවනු ලැබේ.

උදාහරණ: 'නිල් උපුල්' කියයුතු තන්හි 'නිලුපුල්'* කියාද, 'පුලුල් උර' කියයුතු තන්හි 'පුලුලුර'† කියාද, 'එකින් එක' කියයුතු තන්හි 'එකිනෙක' කියාද, 'ඔවුන් ඔවුන්' කියයුතු තන්හි 'ඔවුනොවුන්' කියාද, සන්ධිකරණු ලැබේ.

සංයෝජනා.

නිල්+උපුල්
නිලුපුල්

ඔවුන්+ඔවුන්
ඔවුනොවුන්

4. **සවරාදෙශ** සන්ධි විධියෙන් සන්ධිකටයුතු ස්ථානයෙහි ඇති 'අ' 'ඉ' දෙක වෙනුවට 'එ' ද, 'අ, 'උ'වෙනුවට 'ඔ' නොහොත් 'ඕ' ද ආදෙශකරණු ලැබේ.

උදාහරණ: 'මහ ඉසුරු' කියයුතු තන්හි 'මෙහෙසුරු'‡ කියාද, 'වටඋර' කියයුතු තන්හි 'වටොර' § කියාද, 'මහඋර' කියයුතු තන්හි 'මොහොර' ‖ කියාද, 'තඹර උර' කියයුතු තන්හි තඹරෝර' ¶ කියාද සන්ධිකරණු ලැබේ

'මෙහෙසුරු' යන පදය 'මහෙසුරු' යන පදයට පිළිපෙරළිවීමෙන් සෑදෙයි. 'මොහොර'යන පදයද එසේම 'මහොර'යන්න පිළිපෙරළි වීමෙන්සෑදෙයි.

* මහනෙලුයි. † පලල්වූ ලැපැත්තයි. ‡ ඊශ්වරයායි.
§ වටවූ කලවයි. ‖ මහාප්‍රාකාරයයි. ¶ නෙලුම් මල් ගැබ

සංයොජනා:

| | |
|---|---|
| මහ+ඉසුරු | වට+උර |
| මහ්—අ+ඉසුරු | වට්—අ+උර |
| මහ්—එසුරු | වට්—ඔර |
| මහෙසුරු | වටොර |
| මෙහෙසුරු | |

5. **ගාත්‍රාදෙශ සන්ධි** විධියෙන් සන්ධිකටයුතු ස්ථානයෙහි ගාත්‍රාක්ෂරයක් වෙනුවට අන්‍ය ගාත්‍රාක්ෂරයක් ආදෙශ කරණුලැබේ.

උදාහරණ: 'අඩුකම්' කියයුතු තන්හි 'අඩුවම්' කියාද 'පිළිකම්' කියයුතු තන්හි 'පිළියම්' කියාද 'බිලිකම්' කියයුතු තන්හි 'බිලියම්'* කියාද 'කිඩිකර' කියයුතු තන්හි 'කිඩියර'† කියාද සන්ධිකරණුලැබේ.

'බුදුසරණ' කියයුතු තන්හි 'බුත්සරණ' කියන කලද, 'හෙබ තොට' කියයුතු තන්හි 'හෙප්තොට'‡ කියන කලද, පෙර පෙදෙහි අග සිටි ස්වරය ලොප කොට ගාත්‍රාක්ෂරය වෙනුවට අන්‍ය ගාත්‍රාක්ෂරයක් ආදෙශකරණු ලැබේ.

සංයොජනා:

| | | |
|---|---|---|
| අඩු+කම් | පිළි+කම් | බුදු+සරණ |
| අඩු+ක්-අම් | පිළි+ක්—අම් | බුද්—උ+සරණ |
| අඩු+ව්-අම් | පිළි+ය—අම් | බුද්+සරණ |
| අඩුවම් | පිළියම් | බුත් සරණ |

6. **පූර්වරූපසන්ධි** විධියෙන් පසු පෙදෙහි පෙරකුර පෙර පෙදෙහි පසුකුර හා සමාන රූප ගණුලැබේ.

උදාහරණ: 'පත්කම්' කියයුතු තන්හි 'පන්නම්'§ කියාද, 'ගෙත්කම්' කියයුතු තන්හි 'ගෙත්තම්' කියාද, 'කම්හල්' කියයුතු තැන 'කම්මල්' කියාද සන්ධිකරණු ලැබේ.

---

* බලිකර්මයි. † ක්‍රීඩාකාරයා හෙවත් ඇස්බැන්දුම්කාරන් [නායි.
‡ වැවෙහිවූ තොටුපලයි.
§ පත්වලින් කරණ වැඩයි.

සංයෝජනා:

| | |
|---|---|
| පත්+කම් | ගෙත්+කම් |
| පත්+ක්—අම් | ගෙත්+ක්—අම් |
| පන්+න්—අම් | ගෙත්+ත්--අම් |
| පන්නම් | ගෙත්තම් |

**7. පරරූප සන්ධි** විධියෙන් පෙර පෙදෙහි අගකුර පසුපෙදෙහි මුලකුර හා සමාන රූප ගණුලැබේ. උදාහරණ: 'අත්ලස්' කියයුතු තන්හි 'අල්ලස්' කියාද, 'දුක්පත්' කියයුතු තන්හි 'දුප්පත්' කියාද, 'කිංනර' කියයුතු තන්හි 'කින්නර' * කියාද සන්ධි කරණුලැබේ. †

සංයෝජනා:

| | |
|---|---|
| අත්+ලස් | කිං+නර |
| අත්+ල්-අස් | කිං+න්-අර |
| අල්+ල්-අස් | කින්+න්-අර |
| අල්ලස් | කින්නර |

**8. ගාත්‍රාක්ෂර ලොප සන්ධි** විධියෙන් පෙර පෙදෙහි අග සිටි ගාත්‍රාක්ෂරය ප්‍රාණාක්ෂරයත් සමග ලොපකොට ඊට පූර්වයෙන් අනුනාසිකාර්ධයක් ඇත් නම් එය වෘඩිකොට පසු පදය හා සන්ධිකරණුලැබේ. උදාහරණ: 'ගඟවතුර' කියයුතු තන්හි 'ගංවතුර කියාද 'අඹමල්' කියයුතු තන්හි 'අම්මල්' කියාද, 'නෙලුඹුමල්' කියයුතු තන්හි 'නෙලුම් මල්' කියාද සන්ධිකරණු ලැබේ.

සංයොජනා:

| | |
|---|---|
| ගඟ+වතුර | අඹ+මල් |
| ගංග+වතුර | අම්බ+මල් |
| ගංවතුර | අම්මල් |

---

* කිඳුරෝයි.

† මෙ පරරූප සන්ධි විධිය සිදත්සඟරා ව්‍යාකරණයෙහි ගාත්‍රාදෙශ සන්ධි විධියෙහි අන්තර්ගත කරනලදී.

'නවකම්' කියයුතු තැන 'නවාම්' කියා සන්ධිකරණ ලැබේ. 'මූකළවන' කියයුතු තන්හි 'මූකළාන' යයි සන්ධිකරණ ලැබේ. මෙතැන්හි පසු පෙදෙහි මුල ගතකුර පණකුරත් හා සමග ලොප්වේ. පෙර පෙදෙහි අග සිටි ස්වරය දීඝවෙයි.

9. **ආගම සන්ධි** විධියෙන් පසු පෙදෙහි මුල සිටි ප්‍රාණාක්ෂරය ආශ්‍රයකොට ගාත්‍රාක්ෂරයක් ආගම වන්නේය. ඒ ආගම වන අක්ෂර බොහෝවිට 'ය' කාර, 'ව'කාර වෙත්. පෙර පෙදෙහි අග 'ඉ' කාරයකින් කෙළවරවූයේ නම් පසු පෙදෙහි මුලට 'ය' කාරයක්ද 'උ' කාරයකින් කෙළවරවූයේ නම් 'ව' කාරයක්ද ආගමවේ.

එසේ වන්නේ ප්‍රාණාක්ෂර 'ඉ'කාර 'උ'කාරයන්ට ගාත්‍රාක්ෂර 'ය'කාර 'ව'කාරයන්ගේ ආසන්නතම නිසාය.

උදාහරණ: 'තුනුඅග' කියයුතු තන්හි 'තුනුවග* කියාද, 'කටුඅල' කියයුතු තන්හි 'කටුවල' කියාද, 'පිරිඅත්' කියයුතු තන්හි 'පිරියත්' † කියාද, 'සිපිඑව්' කියයුතු තන්හි 'සිපියෙව්' ‡ කියාද සන්ධිකරණ ලැබේ.

සංයෝජනා:

| | |
|---|---|
| තුනු + අග | සිපි + එව් |
| තුන් — උ + අග | සිප් — ඉ + එව් |
| තුන් - උ + ව් - අග | සිප් - ඉ + ය් - එව් |
| තුනුවග | සිපියෙව් |

10 **විකාරරූප සන්ධි** විධියෙන් පෙර පෙදෙහි අග සිටි ස්වරය ලොපකර ගාත්‍රාක්ෂරය විකාරරූපකොට පසු පදය හා සන්ධිකරණ ලැබේ.

---

* ශරීරයයි. † පර්යන්තය හෙවත් කෙළවරයි.

‡ ශිල්ප දන්නා තැනැත්තෙක් මෙන්.

උදාහරණ: 'හෙලිලි අඹු' කියයුතු තන්හි 'හෙලිල්ලඹු' * කියාද 'වැලිඅවුරු' කියයුතු තන්හි 'වැල්ලවුරු' † කියාද සන්ධිකරණු ලැබේ.

සංයොජනා:

| | |
|---|---|
| හෙලිලි + අඹු | වැලි + අවුරු |
| හෙලිල්-ඉ + අඹු | වැල්-ඉ + අවුරු |
| හෙලිල් + අඹු | වැල් + අවුරු |
| හෙලිල්ල් + අඹු | වැල්ල් + අවුරු |
| හෙලිල්ලඹු | වැල්ලවුරු |

කොලු යන ශබ්දයට 'ආ' විභක්ති එකතුකිරීමෙහිදී 'ව' කාරයක් ආගමකොට 'කොලුවා' කියා ආනම සන්ධි විධියෙන් හෝ ශබ්දාන්තයෙහි 'උ' කාරය ලොප්කොට 'ල' කාරය විත්වරූපකොට 'කොල්ලා' කියා ද්විත්වරූප සන්ධි විධියෙන් හෝ සන්ධිකරණු ලැබේ.

තුමුත් බොහෝවිට 'පිරිමි' ආදි 'ඉ' කාරාන්ත ශබ්දයන්ට විභක්ති එක්කිරීමෙහිදී 'ය' කාරයක්ද 'එළු' 'කොටළු' ආදි 'උ' කාරාන්ත ශබ්දයන්ට විභක්ති එක්කිරීමෙහිදී 'ව' කාරයක්ද ආගමවෙත්.

මිශ්‍ර සිංහලෙහි ව්‍යවහාරවෙන සංස්කෘත වචනයන් ඒ භාෂා ක්‍රමයෙන් සන්ධිකරණලද බැවින් බොහෝවිට සම්භවෙන එබඳු සන්ධි සමහරක් මෙහි දක්වනු ලැබේ.

'අ' කාර දෙකක් ලංව සන්ධිවනකල ඒ දෙක එක්ව 'ආ' කාරයක් වේ.

උදාහරණ:

| | | |
|---|---|---|
| ගුණ | + අගුණ | = ගුණාගුණ |
| කාරණ | + අකාරණ | = කාරණාකාරණ |
| උත්තම | + අඞ්ග | = උත්තමාඞ්ග ‡ |

* එළදු ගැහැණී. † වැල්ලෙස් කළ අවරණය. ‡ සිය ස. මහ.

'අ' යන්නක් 'ආ' යන්නක් හෝ 'ආ' යන්නක් 'අ' යන්නක් හෝ ලංව සන්ධිවන කල 'අ' යන්න ලොප්ව සන්ධිවේ.

උදාහරණ:

ධම්ම + ආසන = ධම්මාසන
කණ්ණ + ආභරණ — කණ්ණාභරණ
නානා + අර්ථ = නානාර්ථ
යථා + අවසර = යථාවසර *

'ආ' කාර දෙකක් ලංව සන්ධිවන කල එක 'ආ' කාරයක් ලොපව සන්ධිවේ.

උදාහරණ:

මහා + ආත්ම = මහාත්ම
ක්‍රීඩා + ආදි — ක්‍රීඩාදි

හ්‍රස්ව හෝ දීර්ඝ 'අ' 'ඉ' වර්ණ ලංව සන්ධිවන කල 'අ' 'ඉ' වෙනුවට 'එ' ආදෙශවේ.

උදාහරණ:

නර + ඉන්ද්‍ර = නරෙන්ද්‍ර
උප + ඊක්ෂා = උපෙක්ෂා †
ජිහ්වා + ඉන්ද්‍රිය = ජිහෙව්න්ද්‍රිය ‡
මහා + ඊශ්වර = මහෙශ්වර §

හ්‍රස්ව හෝ දීර්ඝ 'අ' 'උ' වර්ණ ලංව සන්ධිවනකල ඒ වෙනුවට 'ඔ' ආදෙශවේ.

උදාහරණ:

සහ + උදර = සහොදර
කෘත + උපකාර = කෘතොපකාර ‖
යථා + උක්ත — යථොක්ත **
මහා + උත්තම = මහොත්තම

හ්‍රස්ව හෝ දීර්ඝ 'ඉ' දෙකක් ලංව සන්ධිවන කල 'ඊ' යන්නක් වේ.

---

* අවකාශ ඇතිලෙස † ප්‍රමාදය ‡ දිව § ශිවා ‖ කෘත + උපකාර ආදිය කිසිවිට කෘතුපකාර ආදි වශයෙන්ද සන්ධිවේ ** යට කියනලද

උදාහරණ:

මුනි + ඉන්ද = මුනීන්ද
කවි + ඉන්ද = කවීන්ද
පෘථිවි + ඊශ්වර = පෘථිවීශ්වර *

හ්‍රස්ව හෝ දීර්ඝ 'උ' දෙකක් ළංව සන්ධිවන කල 'ඌ' යන්නක් වේ.

උදාහරණ:

ලඝු + උපාය = ලඝූපාය
වධූ + උත්සව = වධූත්සව

හ්‍රස්ව හෝ දීර්ඝ 'අ' වර්ණය 'ඍ' හා සන්ධිවන කල ඒදෙක එක්ව 'අර්' කියා වේ.

උදාහරණ:

රාජ + ඍෂි = රාජර්ෂි †
මහා + ඍෂි = මහර්ෂි

හ්‍රස්ව හෝ දීර්ඝ 'අ' වර්ණය 'ඒ' හෝ, 'ඓ' හා සන්ධිවන කල එදෙක එක්ව 'ඓ' කියාද; 'ඔ' හෝ 'ඖ' හා සන්ධිවනකල එදෙක එක්ව 'ඖ' කියාද වේ.

උදාහරණ:

කාරක + ඒක = කාරකෛක
රාජ + ඓශ්වර්‍ය = රාජෛශ්වර්‍ය ‡
කණ්ඨ + ඔෂ්ඨ = කණ්ඨෞෂ්ඨ ‖
මහා + ඖෂධ = මහෞෂධ §

හ්‍රස්ව හෝ දීර්ඝ 'ඉ' වර්ණය අ ආ උ ඌ ඍ ඒ ඓ ඔ ඖ හා සන්ධිවන කල ඒ 'ඉ' වර්ණය වෙනුවට 'ය' කාරයක් ආදේශ වේ.

උදාහරණ:

හස්ති + අශ්ව = හස්ත්‍යශ්ව
විභක්ති + අර්ථ = විභක්ත්‍යර්ථ
ප්‍රති + උත්තර = ප්‍රත්‍යුත්තර
අති + උග්‍ර = අත්‍යුග්‍ර **
පරි + ඒෂණ = පර්‍යේෂණ ††
නදී + අම්බු = නද්‍යම්බු ‡‡

---

* රජ † රජ්ජුරුවන්ගේ අනුභාව හෙවත් තේජස
‡ රජ ඉසුරු ‖ උගුර හා තොල § ඉඟුරු ** ඉතා දරුණු
†† සෙවීම ‡‡ ගඟෙහි දිය

හ්‍රස්ව හෝ දීර්ඝ 'උ' වර්ණය අ ආ ඉ ඊ ඍ එ ඓ ඔ ඖ හා සන්ධිවන කල ඒ 'උ' වර්ණය වෙනුවට 'ව' කාරයක් ආදේශ වේ.

උදාහරණ.

අනු + අපි = අන්වපි *
තනු + අඞ්ගි = තන්වඞ්ගි †
ගුරු + අක්ෂර = ගුර්වක්ෂර
වධූ + ආදි = වධ්වාදි ‡

'ඍ' කාරය හා අ ආ ඉ ඊ උ ඌ එ ඓ ඔ ඖ සන්ධිවනකල ඒ 'ඍ' කාරය වෙනුවට 'ර' කාරයක් ආදේශ වේ.

උදාහරණ.

කර්තෘ + අපි = කර්ත්‍රපි
මාතෘ + අධ්‍යාස = මාත්‍රධ්‍යාස §
පිතෘ + උපස්ථාන = පිත්‍රුපස්ථාන ‖

ව්‍යඤ්ජන සන්ධි නානාවිධ හෙයින් උදාහරණ කොට තබාගැණිමට මෙහි වචන ස්වල්පයක් සන්ධි කොට දක්වනු ලැබේ.

උදාහරණ.

වාක් + දණ්ඩ = වාග්දණ්ඩ **
ෂට් + වර්ණ = ෂඩ්වර්ණ ††
තත් + ගුණ = තද්ගුණ §§
සත් + ජන = සජ්ජන ‖‖
තත් + ටීකා = තට්ටීකා ***
තත් + භව = තද්භව †††
විද්‍යුත් + ලතා = විද්‍යුල්ලතා ‡‡‡
මනස් + චාර = මනොචාර §§§
පයස් + ධර = පයොධර

---

* අපිය අනුව † ස්ත්‍රිය ‡ ස්ත්‍රී ආදි § මව්ගේ අදහස ‖ පියාට කරණ සංග්‍රහ ** වචන නමැති දණ්ඩ †† පාට හය §§ එහි ගුණ ‖‖ සුදනා *** එහි ටීකාව ††† එහි භාවය ‡‡‡ විදුලිය §§§ සිත් නමැති දෙර

| | | |
|---|---|---|
| ශිරස් | + ධාතු | = ශිරොධාතු * |
| තපස් | + ලීලා | = තපොලීලා |
| නිඃ | + ගුණ | = නිර්ගුණ |
| නිඃ | + චල | = නිශ්චල |
| දුඃ | + චරිත | = දුශ්චරිත |
| නිඃ | + ධන | = නිර්ධන |
| නිඃ | + ශෙෂ | = නිශ්ශෙෂ |

## XI.

## COMPOUNDS.

### සමාස (සමස්).

**නා**නාර්ථ ශබ්දයන් දෙකක් හෝ වැඩි ගණනක් සම්බන්ධකොට එකාර්ථයක් ප්‍රකාශ කරණ කල්හි එට සමාස (සමස්) යයි කියනු ලැබේ.

සමාසයෝ පංචවිධ වෙත්.

එනම්: i විභක්ති සමාසය (විබත් සමස්)
ii විශෙෂණ සමාසය (වෙසෙසුන් සමස්)
iii ද්වන්ද්වාර්ථ සමාසය (ද අරුත් සමස්)
iv අන්‍යාර්ථ සමාසය (අන් අරුත් සමස්)
v අව්‍යය සමාසය (අවිය සමස්)

### i.

### **විභක්ති සමාසය (විබත් සමස්).**

සප්ත විභක්ත්‍යන්ත පද පර පද හා සම්බන්ධවූ සමාස වන කල්හි ඒ විභක්ති සමාසයයි කියනු ලැබේ. ප්‍රථමා ආලපන විභක්ත්‍යන්ත පදහා සම්බන්ධව සමාස නොවේ. අනික් සප්ත විභක්ත්‍යර්ථ යෙහිම සමාස යෙදේ.

මිශ්‍ර භාෂාවෙහි ශුද්ධ සිංහල සමාස මෙන්ම සංස්කෘත සමාසද සම්භවෙන බැවින් ඉන් සමහරක් ද මෙහි අන්තර්ගත කරණු ලැබේ.

---

* හිස

උදාහරණ:

1. කම්විබත් සමස්.

ශුද්ධ සිංහල:

සමාස: විග්‍රහවාක්‍ය:

මීපා (මීමැස්සා) = මීබොන්නේ 'මීපා'යි (පා = බී මෙහි ධාතුයි).

මීපල් (රජ) = මිය පල්නේ (පෘථිවිය පාලනය කරන්නේ) 'මීපල්'.

හිරවරණ (තුඩය) = හිරු අවුරන්නේ හෙවත් වහන්නේ 'හිරවරණ'යි.

දිවයුරු (හිරු) = දවාල කරන්නේ 'දිවයුරු'යි *

කිඩියර (ඉන්ද්‍රජාලික) = කිඩි (ක්‍රීඩා) කරණුයේ 'කිඩියර'යි.

සංස්කෘත:

මධුප (මීමැස්සා) = මධු පානය කරන්නේ 'මධුප'යි

ගොපාල (ගොපල්ලු) = ගවයන් පාලනය කරන්නේ 'ගොපාල'යි.

කුම්භකාර (කුඹලා) = කුම්භයන් කරන්නේ හෙවත් කලගෙඩි සාදන්නේ 'කුම්භකාර'යි.

2. කතු විබත් සමස්.

ශුද්ධ සිංහල:

පරපුටු (කොහා එක්කෝ සිඟන්නා) = පර විසින් පුටුයේ හෙවත් අන්‍යයා විසින් පොෂ්‍යය කරණු ලද්දේ 'පරපුටු'යි.

දෙව්දත් (භොජන) = දෙවියන් විසින් දෙනලද්දේ 'දෙව්දත්'.

සංස්කෘත:

බ්‍රහමදත්ත = බ්‍රහමයා විසින් දානය කරණ ලද්දේ 'බ්‍රහමදත්ත'යි.

මාතෘසදෘශ — මාතෘව හා සදෘශවූයේ 'මාතෘසදෘශ'යි

---

* 'දිවකර' යන්නු ආදෙශ හා පිළිපෙරළි විධියෙන් 'දිවයුරු' කියා වේ.

3. කරණවිබත් සමස්.

ශුඬ සිංහල:

කිරිබත් — කිරෙන් පිසූ බත් 'කිරිබත්'.

දියබත් — දියෙන් හැඳූ බත් 'දියබත්'.

බමරුදුල (මල්පොකුර) — බමරුන් (මීමැස්සන්) කරණකොටගෙණ උදුලේ (දිලිසුනේ) 'බමරුදුල'සි.

බාසුරු (සිංහයා) — බාහුව කරණකොටගෙණ සූර වූයේ 'බාසුරු'සි.

සංස්කෘත:

පාදප(රුක)— පාදයෙන් පානයකරන්නේ'පාදප'සි.

නාබිජාත — නාබියෙන් ජාතවූයේ හෙවත් නියෙන් බිදුනේ 'නාබිජාත'සි.

ධාන්‍යජ — ධාන්‍යයෙන් උපයනලද අජිය (වස්තුව) 'ධාන්‍යජ'සි.

4. සපදන් විබත් සමස්.

ශුඬ සිංහල:

බමුණුදන් — බමුණන්ට දියයුතු දන් 'බමුණුදන්'.

සිවුරුපිළි — සිවුරු පිණිස තැබූ පිළි 'සිවුරුපිළි'සි.

සංස්කෘත:

ගොහිත — ගවයන්ට හිතවූයේ 'ගොහිත'සි.

ධනලොභ — ධනයට වන ලොභය 'ධනලොභ'සි.

5. අවදි විබත් සමස්.

ශුඬ සිංහල:

සොරබිය — සොරුගෙන් වන බිය 'සොරබිය'සි.

මිණිමුතු — මිණියෙන් මිදුනේ හෙවත් කොපුවෙන් ගැලවුනේ 'මිණිමුතු'සි.

රහුමුත්(හිර හෝ සඳ)—රාහුගෙන් මිදුනේ'රහුමුත්'.

සංස්කෘත:

වෘකභීත — වෘකයාගෙන් භීතවූයේ 'වෘකභීත'සි.

ස්වර්ගපතිත — ස්වර්ගයෙන් පතිතවූයේ 'ස්වර්ගපතිත'සි.

### 6. සබඳ විබත් සමස්.

ශුඞ සිංහල.

එළුමස් = එළුවාගේ මස් 'එළුමස්'.
රජපිරිස් = රජහුගේ පිරිස් 'රජපිරිස්'.
සුරපුර = සුරන්ගේ පුර 'සුරපුර'යි.
බුදුගුණ = බුදුන්ගේ ගුණ 'බුදුගුණ'.

සංස්කෘත:

රාජභොජන=රාජයාගේ භොජනය 'රාජභොජන'යි
වෘක්ෂශාඛා = වෘක්ෂයාගේ ශාඛාව 'වෘක්ෂශාඛා'යි.
ගිරිනදී = ගිරි (පර්වතය) සම්බන්ධ නදිය 'ගිරිනදී'යි.
මූර්ඛශත = මූර්ඛ (මෝඩ) යන්ගේ ශත (සියය) ක හෙවත් මෝඩයන් සියක්දෙනා 'මූර්ඛශත'යි.

### 7. අදර විබත් සමස්.

ශුඞ සිංහල:

රාසොඬ (බේබද්ද) = රාවෙහි සොඬවූයේ හෙවත් ඇළුනේ 'රාසොඬ'යි.
දහම්සොඬ — දහම්හි සොඬවූයේ හෙවත් ධර්මයෙහි ඇළුනේ 'දහම්සොඬ'යි.
පොල්තෙල් = පොලෙහි තෙල් 'පොල්තෙල්'.
සරාසඳ = සරා (ශරත්) කල්හි සඳ 'සරාසඳ'යි.

සංස්කෘත:

ගෘහස්ථ = ගෘහයෙහි ස්ථානයකරන්නේ (ගෙයි සිටින්නේ) 'ගෘහස්ථ'යි.
වනචර = වනයෙහි සඤ්චාරණය කරන්නේ 'වනචර'යි.
පූර්වකාය — කායෙහි පූර්ව කොට්ඨාසය 'පූර්වකාය'යි.
මධ්‍යාහ්න — අහ්නයෙහි (දවසෙහි) මධ්‍යය 'මධ්‍යාහ්න'යි.

මේ ආදියෙහි විභක්ත්‍යර්ථ පදය පූර්වපදය නොව පසු පදයයි.

ස්වයංකෘත = තමන් විසින්ම කරණලද්දේ 'ස්වයංකෘත'යි.

ස්වයම්භූ = (කිසිකෙනෙකුන් විසින් නොමවන ලදුව) තමාම ඇතිවූයේ 'ස්වයම්භූ'යි.

ස්වයංජිනත = තමන්විසින්ම කපනලද්දේ 'ස්වයංජිනත'යි.

මේ ආදී සමහර සමාසයක මුල අව්‍යය පදද පෙණේ.

## අලුප්ත සමාස.

කිසි සමාසයෙක්හි විභක්ත්‍යන්ත පද විභක්ති රූප සමගම අන්‍ය පද හා ගළපා සමාස කරණු ලැබේ.

එසේ විභක්තිරූප ලොප්නොකොට ගළපනලද සමාස 'අලුප්ත සමාස' හෙවත් 'අලුක්සමාස'යයි කියනුලැබේ.

උදාහරණ:

ශුද්ධ සිංහල:

සමාස: විග්‍රහ වාක්‍ය:

නරනිඳු (නරන් + ඉඳු) = නරන්ගේ ඉඳු (මිනිසුන්ගේ ස්වාමියා) 'නරනිඳු'යි.

ගොවියාපුත් = ගොවියාගේ පුත් 'ගොවියාපුත්'.

අතැවැසි = අතැ (අන්තයෙහි) වසන්නේ 'අතැවැසි'යි.

සංස්කෘත:

යුධිෂ්ඨිර (එනම් කුමාරයෙක්) = යුධයෙහි ස්ථිර වූයේ 'යුධිෂ්ඨිර'යි.

ශරදිජ = ශරත් කාලයෙහි ජාතවූයේ (උපන්නේ) 'ශරදිජ'යි.

සරසිජ (උපුල්) = සරස්හි (පොකුණෙහි) ජාතවූයේ 'සරසිජ'යි.

විභක්ති සමාසයයි කියනලද මේ වර්ගයට සංස්කෘත ව්‍යාකරණයෙහි 'තත්පුරුෂ සමාසය'යි කියනු ලැබේ.

ii.

## විශෙෂණ සමාසය (වෙසෙසුන් සමස්).

සමානාධිකරණ විශෙෂණ පදයක් හා විශෙෂ්‍ය පදයක් සම්බන්‍ධව සමාස වන කල්හි ඊට විශෙෂණ සමාසයයි කියනුලැබේ.

උදාහරණ:

ශුද්ධ සිංහල:

සමාස: විග්‍රහ වාක්‍ය:

සුදුමල් = සුදුවූයේත් එම මල්වූයේත් 'සුදුමල්'
රතුගොන්=රතුවූයේද එම ගොන්වූයේද 'රතුගොන්
නිලුපුල් (මහනෙල්) = නිල්වූයේත් එම උපුල්වූයේත් 'නිලුපුල්'
කිහිරිගැහැණි = කිහිරිවූත් ඔමැගැහැණිවූත් 'කිහිරි ගැහැණි'
නරසි (රජ) = නරවූයේද එම සිහ (සිංහ) වූයේද 'නරසි' (සිංහයෙක් හා සමාන හෙයින් සිංහයයි කියනුලැබේ.)
දෙව්තුම = දෙව්වූයේද එම උතුම් වූයේද 'දෙව්තුම'
එකාවිරු = එකාවූයේද එම විරවූයේද 'එකාවිරු'

සංස්කෘත:

එකනාථ = එකාවූයේද එම නාථවූයේද 'එකනාථ'
ඝනශ්‍යාම = ඝනාකාර ශ්‍යාමවූයේ හෙවත් වලාකුල මෙන් කලුවූයේ 'ඝනශ්‍යාම'යි.
ගජේන්‍ද්‍ර = ගජවූයේද එම ඉන්‍ද්‍රවූයේද 'ගජේන්‍ද්‍ර'යි
මහාදෙව = මහත්වූයේද එම දෙව වූයේද 'මහාදෙව'යි

ශුද්ධ සිංහල:

දෙලෝ = ලොව දෙකක් එක්කොට සලකණ ලදහු 'දෙලෝ'යි.
සිව්සයුරු = සයුරු (සාගර) සතරක් එක්කොට සලකණ ලදහු 'සිව්සයුරු'යි.

නවදෙර = දෙර නවයක් එක්කොට සලකණ ලදහු 'නවදෙර'යි

සංස්කෘත:

ත්‍රිභුවන = භුවනත්‍රයක් එක්කොට සලකණලද හු 'ත්‍රිභුවන'යි

චතුර්යුග = යුග චතුෂ්ටයක් එක්කොට සලකණ ලදහු 'චතුර්යුග'යි

පඤ්චපාත්‍ර = පාත්‍ර පඤ්චකයක් එක්කොට සල කණලදහු 'පඤ්චපාත්‍ර'යි

එසා නාථ ආදී සමාස පදයන්ට සංස්කෘත ව්‍යාකර ණයෙහි 'කර්මධාරය' කියාද ත්‍රිභුවන ආදී සමාස පදයන්ට 'ද්විගු' කියාද කියනුලැබේ.

iii.

### දකාරාර්ථ සමාසය (ද අරුත් සමස්).

දකාරයකින් සම්බන්ධ කටයුතු පදයන් ඒ දකා රය ලොපකොට සමාසකරණ කල්හි ඊට දකාරාර්ථ සමාසයයි කියනුලැබේ.

ශුද්ධ සිංහල:

සමාස: විග්‍රහ වාක්‍ය:

කිරසඳ = කිරද සඳද 'කිරසඳ'

ඇත්අස්රියපද = ඇත්හුද අස්හුද රිය(රථ) ද පද (පාබල සේනාව) ද 'ඇත් අස් රිය පද'

බඹසුරනර = බඹහුද සුරහුද නරහුද 'බඹසුරනර'

ගිනැවුම් = ගිද නැවුම්ද 'ගිනැවුම්'

සංස්කෘත:

හස්ත්‍යශ්ව = හස්තිහුද අශ්වයෝද 'හස්ත්‍යශ්ව'යි

ඵලපුෂ්ප = ඵලද පුෂ්පද 'ඵලපුෂ්ප'යි

අර්ථධර්ම = අර්ථ (වස්තුව) ද ධර්මද 'අර්ථධර්ම'යි

අහිනකුල = අහි(නයා) ද නකුල(මුගටියා) ද 'අහි නකුල'යි

සුඛදුඃඛ = සුඛද දුඃඛද 'සුඛදුඃඛ'යි
ශීතොෂ්ණ = ශීතද උෂ්ණයද 'ශීතොෂ්ණ'යි
යුධිෂ්ඨිරාර්ජුන = යුධිෂ්ඨිරද අර්ජුනද 'යුධිෂ්ඨිරාර්ජුන'යි (එනම් කුමරු දෙදෙනෙකි).
බ්‍රාහ්මණක්ෂත්‍රිය = බ්‍රාහ්මණයෝද ක්ෂත්‍රියයෝ (රජදරුවෝ) ද 'බ්‍රාහ්මණක්ෂත්‍රිය'යි.

'ගිනැවුම්' ආදි දකාරාර්ථ සමාස කිසිවක් සමූහ ප්‍රමුඛකොට එකාර්ථවේ. 'බඹසුරනර' ආදි අන් කිසිවක් අධිග ප්‍රමුඛකොට බහ්වර්ථවේ.

මේ සමාස වර්ගයට සංස්කෘත ව්‍යාකරණයෙහි 'ද්වන්ද්ව සමාසය'යි කියනු ලැබේ.

iv.

**අන්‍යාර්ථ සමාසය (අන් අරුත් සමස්).**

විවිධාර්ථවූ පද කීපයක් සම්බන්ධව ඒ ඒ පදයන් විසින් නොකියනලද්දාවූ අන්‍යාර්ථයක් ප්‍රකාශකරණ කල්හි ඊට අන්‍යාර්ථ සමාසයයි කියනුලැබේ. මේ සමාස වර්ගයද නාමාදී සපත විභක්තියෙහි යෙදේ.

උදාහරණ:

ශුද්ධ සිංහල:

සමාස: විග්‍රහ වාක්‍ය:

එරුණුහස් (විල) = හස් (හංසයා) එරුණේ (බැස්සේ) යමකාටද ඒ ස්ථානය 'එරුණුහස්' නම්වේ.
දැමිඳුරු (බුදුනු) = යමෙකු විසින් ඉඳුරෝ (ඉන්ද්‍රිය) දමනයකරණ ලද්දේද එතෙම 'දැමිඳුරු' නම් වේ.
ඉකුත්සයුරු = සයුර (සාගරය) ඉකුත්කරණ ලද්දේ (පසුකරණ ලද්දේ) යමෙක් විසින්ද එතෙම 'ඉකුත් සයුරු' නම්වේ.
සහතරුවැල (අහස) = තරුවැල සහවූයේ හෙවත් තාරකා පඞ්ක්තිය සහිතවූයේ 'සහතරුවැල' නම්වේ.

සුන්බත් (කලහ)—යම් කාරණකින් බත්සුන් වේද එතෙම 'සුන්බත්' නම් වේ.

සුන්තුරු (පොරව)—යමක් කරණකොටගෙණ තුරු (ගස්) සුන්වේද එතෙම 'සුන්තුරු' නම් වේ.

දුන්වත් (බමුණු)—යමෙක්හට වත් (වස්ත්‍ර) දෙන ලද්දේද එතෙම 'දුන්වත්' නම් වේ.

ගුලුගොනගුල් (රුක්)—යමකින් ගොනගුල් (වඳුරා) ගිලිහුණේ (වැටුණේ) ද එතෙම 'ගුලුගොනගුල්' නම් වේ.

දසබල (බුදුහු)—දසබල ඇත්තේ යමෙක්හට ද එතෙම 'දසබල' නාම් වේ.

ලඹ සවන් (එනම් ගොත්‍රයක්)—ලඹ සවන් හෙවත් එල්ලෙන්නාවූ කන් ඇත්තේ යමෙක් හට ද එතෙම 'ලඹසවන්' නාම් වේ.

සඳවත් (රූවත් මුහුනක් ඇති ස්ත්‍රිය)—සඳවැනි වතක් (මුහුනක්) ඇත්තේ යමක්හටද ඕ 'සඳවත්' නම් වේ.

මත්නේගජ (වනය)—මත්වූ නොයෙක් ගජන් (ඇතුන්) ඇත්තේ යම් තැනෙකක්හිද එය 'මත්නේගජ' නම් වේ.

'තාදගුණ' (තගුණ) සහ 'අතාදගුණ' (අතගුණ) යයි මේ සමාස විග්‍රහය දෙකොටසකට බෙදියහැකි. ලඹ සවන් ආදි කිසි අන්‍යාර්ථ සමාසයෙක්හි ගළපනලද පදයන් විසින් සමාස වීමට පෙරත් ඒ සමාස පදයෙන් අභිප්‍රාය කළ තැනැත්තා සම්බන්ධ කිසි ගුණයක් කියනුලැබේ. එසේ කල්හි එබඳු සමාස "තාදගුණ' නාම් වේ.

ඉකුත් සයුරු ආදි අන් කිසි අන්‍යාර්ථ සමාසයෙක් හි ගළපනලද පදයන් විසින් යටකීලෙස ඒ සමාස

පදයෙන් අභිප්‍රාය කළ තැනැත්තා සම්බන්ධ ගුණයක් කියනු නොලැබේ. එබැවින්. ඒ 'අතද්ගුණ' නම් වේ.

සංස්කෘත :

පීතාම්බර (විෂ්ණු)—පීතවර්ණ (කහවන්) වූ අම්බරය (වස්ත්‍රය) යමෙක්හට ද හෙතෙම 'පීතාම්බර' නම් වේ.

දීර්ඝබාහු—දීර්ඝවූ බාහුවක් ඇත්තේ යමෙක්හට ද එතෙම 'දීර්ඝබාහු' නම් වේ.

ඉන්ද්‍රාදි—ඉන්ද්‍ර(ශක්‍ර)යා ආදිවූයේ යම් දිව්‍ය සමූහයක්හටද ඒ සමූහය 'ඉන්ද්‍රාදි' නම් වේ.

චතුර්මුඛ(මහබඹ)—මුඛ චතුෂ්ටයක්(සතරක්) ඇත්තේ යමෙක්හටද එතෙම 'චතුර්මුඛ' නම් වේ.

ත්‍රිලොචන (ඊශ්වරයා)—ලොචන (ඇස්) ත්‍රයක් ඇත්තේ යමෙක්හට ද එතෙම 'ත්‍රිලොචන' නම් වේ.

මහාබාහු (රජ)—මහාබාහුවක් ඇත්තේ යමෙක්හටද එතෙම 'මහාබාහු' නම් වේ.

බහුනදීක(කිසි රටක්)—බොහෝ නදීන් ඇත්තේ යම් ස්ථානයෙක්හි ද එය 'බහුනදීක' නම් වේ.

ගතභර්තෘක (වැන්දඹු)—භර්තෘ පරලොක ගතවූයේ හෙවත් සැමියා පරලොව ගියේ යමකුගේ ද ඕ 'ගතභර්තෘක' නම් වේ.

බහුකුමාරීක—බොහෝ කුමාරියන් ඇත්තේ යමෙක්හට ද එතෙම 'බහුකුමාරීක' නම්වේ.

මේ සමාස වර්ගයට සංස්කෘත ව්‍යාකරණයෙහි 'බහු ව්‍රීහි' සමාසයයි කියනු ලැබේ.

V.

## අව්‍යය සමාසය (අවිය සමස්).

අව්‍යය ශබ්දයක් මුල්කොට එය හා අන්‍ය ශබ්ද සම්බන්ධව සමාස වන කල්හි ඊට අව්‍යය සමාසයයි කියනුලැබේ.

මේ සමාසය සිද්ත්සඟරා කතිතෘහු විසින් යව් ආදි වර්ගය, කු ආදි වර්ගය, ප ආදි වර්ගය, න ආදි වර්ගයයි සතරකට බෙදනලද්දේය.

1. යව් ආදි වර්ගයට උදහරණ:

යව්දිව් —දිවි යම්තාක්ද ඒතාක්

යතලබ —ලැබෙන්නේ යම්සේද එසේ

යතාවිදි —විදිය යම්සේද එසේ

අනුරූ —රූපයට අනුව

2. කු ආදි වර්ගයට උදහරණ:

කුදිටු—ගැරහුම්ලද දිටු (ගරහනු ලද්දාවූ දෘෂ්ටිය) 'කුදිටු' නම්වේ.

කුපුරිස්—ගැරහුම්ලද පුරිස් (ගරහනු ලද්දාවූ පුරුෂ) තෙම 'කුපුරිස්' නම් වේ.

දුදන—නිදිලද දන (නින්දා ලද්දාවූ ජන) තෙම 'දුදන' නම්වේ.

සුවඳ—මනාවූ ගඳ 'සුවඳ' නම්වේ.

3. ප ආදි වර්ගයට උදහරණ:

පබ—උත්කෘෂ්ට භාවයෙන් ශොභමානවූයේ 'පබ'* නාම්වේ.

උපවන—සමීපයෙහි වනය 'උපවන' නම්වේ.

4. න ආදි වර්ගයට උදහරණ:

නුගුණ—ගුණ නොවන්නේ 'නුගුණ'යි.

අසුර—සුර නොවන්නේ 'අසුර'යි.

අකුසල්—කුසල් නොවන්නේ 'අකුසල්'

මේ න ආදි වර්ගයෙහිද් අව්‍යය පදය හා බැදෙන පදයෙහි මූලකුර ප්‍රණකුරක් විනම් ඒ ප්‍රණකුර වෙත 'න'කාරාගමයක් වේ.

---

* බා—බැබලීමෙහි ධාතුයි.

උදාහරණ: 'අ' යන අව්‍යය හා 'අදර' යන පදය සම්බන්ධවන කල්හි (අ+න්+අදර=) අනදර කියාවේ. අ+ඉටු (අ+න්+ඉටු=) අනිටු කියාවේ.

සංස්කෘත:

යථාක්‍රම=ක්‍රමය යම්සේද එසේ.

යථාවසර=අවසරය යම්සේද එසේ.

යාවච්ඡක්‍ය=ශක්‍ය (පුළුවන්) වූයේ යම්තාක්ද ඒතාක්.

අනුවාර =වාරයෙන් වාරය.

අනුදින =දිනපතා

උපසන්ධ්‍ය =සන්ධ්‍යා කාලයට ආසන්නව.

යථාක්‍රම ආදී සමාස පදයන්ට සංස්කෘත ව්‍යාකරණයෙහි 'අව්‍යයීභාව'යයි කියනු ලැබේ.

සිදත්සඟරා කර්තෘහු විසින් දක්වනලද යව් ආදී වර්ගයෙහි බොහෝ සිංහල සමාස හා ඊට සමානවූ සංස්කෘත ව්‍යාකරණයෙහි 'අව්‍යයීභාව' යයි කියනලද 'යථාක්‍රම' ආදි සමාසද නිතරම ක්‍රියා විශේෂණ වෙත්.*

පද දෙකකට වඩා එකට ගළපා කරණලද කිසි සමාස පදයන් ඇතුළෙහි අන්‍ය සමාසද ඇත්තේය. නිලිපුල් වැනි ඇස් යමක්හටද ඕ 'නිලිපුලැස්' කියා තද්ගුණ සම්බන්ධ විභක්ති අන්‍යාර්ථ සමාසයෙහි ගැළපූ පද තුණින් නිලිපුල් යන මූල පද දෙක විශේෂණ සමාසයෙහි ගළපා තිබේ. එබැවින් 'නිලිපුලැස්' යන පදය විශේෂණ සමාස ගර්භකොට ඇති අන්‍යාර්ථ සමාසයෙකි.

* කුඤ්ටු, ඌබ, අසුර ආදිය අව්‍යයන් මුල්කොට ඇති හෙයින් අව්‍යය සමාසයයි සිදත්සඟරාවෙහි කියනලද්දේය. නුමුත් සංස්කෘත ව්‍යාකරණයෙහි ඊට සමානවූ කුදෘෂ්ටි ආදි සමාස කර්මධාරයටද අබ්‍රාහමණ, අනශ්ව ආදිය තත්පුරුෂ සමාසයටද අන්තර්ගතකරණ ලද්දේය.

සමාස සෑදී තිබෙන විවිධ පද නිතරම සන්ධි කට යුතු බැවිද එකම භාෂාවකට අයිතිනැති ශබ්ද එක්කොට තළපා සමාසකිරීම සාමාන්‍යයෙන් නුසු දුසු බැවිද සැලකිය යුතු.

## XII.

## ROOTS.

## ප්‍රකෘති (පියවි).

පදයන්ගේ මූලස්වභාව ප්‍රකෘති (පියවි) යයි කිය නු ලැබේ. ප්‍රකෘති වනාහි ධාතුප්‍රකෘති (දපියවි)ය ශබ්ද ප්‍රකෘති (සදපියවි)යයි දෙවැදෑරුම් වේ.

ක්‍රියාවාචීවූ සියලු පදයන්ට මුල්වූයේ 'ධාතුප්‍රකෘ ති'යයි කියනු ලැබේ.

විභක්ති ආදීන්ට ආශ්‍රයවූ නාමයන්ගේ මූලස්වභා වද විභක්ත්‍යාදීන් විසින් ආශ්‍රයකරණු නොලබන් නාවූ අව්‍යයද 'ශබ්ද ප්‍රකෘති'යයි කියනු ලැබෙත්.

මේ විවිධවූ ප්‍රකෘති නැවත නිෂ්පන්න (නිපන්), තත්සම (තසම), තද්භව (තබව), යයි තුන්කොට සයාට බෙදනලද්දේය. අන්‍ය කිසි භාෂා මිශ්‍රව යක් නොලැබ ලඬකාවීපයෙහිම උපන්නේ නිෂ්ප න්න ප්‍රකෘති වේ. සංස්කෘත, මාගධි, ද්‍රවිඩ ආදී භාෂාවන්ගේ ප්‍රකෘති හා සමානවූයේ තත්සම නම් වේ, ඒ භාෂාවලින් භින්නකොට ව්‍යවහාර කරණු ලැබෙන්නේ තද්භව නම් වේ.

උදාහරණ:

රුකුර, හරඹ, ආදිය නිෂ්පන්න ධාතු ප්‍රකෘතිසි.
යා, දා, ආදිය තත්සම ධාතුප්‍රකෘතියි.
පිසි, සමර, ආදිය තද්භව ධාතුප්‍රකෘතියි.

පොල්, කොළඹ, කරළු, ආදිය නිෂ්පන්න ශබ්ද ප්‍රකෘතියි.

ගජ, කර, කිරණ, ආදිය තත්සම ශබ්ද ප්‍රකෘතියි.

අත්, සිදුරු, ඇදුරු, ආදිය තද්භව ශබ්ද ප්‍රකෘතියි.

කිරීම් අර්ථ ඇති 'රුකුර' යන ධාතුවද බැලීම් අර්ථ ඇති 'නරඹ' යන ධාතුවද; නෙරළු කියන 'පොල්' ශබ්දයද නැව්තොට කියන 'කොළඹ' ශබ්දයද අලුත් රෙදි කියන 'කරළු' ශබ්දයද; යන මේ ආදිය අන්‍ය භාෂාවකින් සිංහල භාෂාවට නොපැමිණ එම භාෂාවෙහිම උපන් බැවින් නිෂ්පන්න ප්‍රකෘතියයි කියනු ලැබේ.

'යා' යාමෙහි යන ධාතුවද, 'දා' දීමෙහි යන ධාතුවද; හස්තීන් කියන 'ගජ' ශබ්දයද, හස්තයන් කියනා 'කර' ශබ්දයද, රශ්මීන් කියන 'කිරණ' ශබ්දයද; යන මේ ආදිය සංස්කෘත මාගධි භාෂාවන්හි ප්‍රකෘතීන් හා සමාන බැවින් තත්සම ප්‍රකෘතියයි කියනු ලැබේ.

සංස්කෘත භාෂාවෙහි පිසීම් අර්ථ ඇති 'පච්' යන ධාතුවෙන් භින්නාවූ එම් අර්ථ ඇති 'පිසි' යන ධාතුවද; සිහිකිරීම් අර්ථ ඇති 'සමෘ' යන ධාතුවෙන් භින්නාවූ එම අර්ථ ඇති 'සමර' යන ධාතුවද, 'හස්ත' ශබ්දයෙන් භින්නාවූ එම අර්ථ ඇති 'අත්' ශබ්දයද, 'ඡිද්‍ර' ශබ්දයෙන් භින්නාවූ එම අර්ථ ඇති 'සිදුරු' ශබ්දයද, 'ආචාර්‍ය්‍ය' ශබ්දයෙන් භින්නාවූ එම අර්ථ ඇති 'ඇදුරු' ශබ්දයද යන මේ ආදිය තද්භව ප්‍රකෘතියයි කියනු ලැබේ.

ඉලක්කම්, ඉඩම්, කඩ, ආදි කිසි ශබ්දයක් ද්‍රවිඩ භාෂාවේ ඒ සමානවූ ශබ්දවලින්ද; තින්ත, පෑන ආදි කිසි ශබ්දයක් පෘතුගීසි භාෂාවේ ඒ සමාන

ශබ්දවලින් ද සිංහල ව්‍යවහාරයට ඇවිත් තිබෙන බැවින් ඒවාද තත්සමයයි කියනු ලැබේ.

'කරවළ' ආදි ශබ්ද ද්‍රවිඩ භාෂාවෙහි 'කරුවාඩු' ආදි ශබ්දවලින් බිඳී ව්‍යවහාරයට විත් තිබෙන බැවින් ඒවාද තද්භවයයි කියනු ලැබේ.

භාෂාවෙහි තද්භව ප්‍රකෘති බහුලයි. නිෂ්පන්න ප්‍රකෘති ස්වල්පයි. තද්භව ප්‍රකෘති පාඨයක් ඒ ප්‍රකෘති භිනනාවූ මූලධාතු හෝ ශබ්ද සමග මෙහි දක්වනු ලැබේ.

| සංස්කෘත ධාතු: | දුන් භින්නවූ සිංහල ධාතු: |
|---|---|
| ග්‍රන්ථ් (ගෙතීමෙහි) | ගොත |
| චර් (හැසිරීමෙහි) | සර |
| චල් (සෙලවීමෙහි) | සල |
| චිත් (සිතීමෙහි) | සිත |
| ඡිද් (කැපීමෙහි) | සිඳ |
| ජ්වල් (දිලිසීමෙහි) | දල |
| දෘශ් (දැකීමෙහි) | දිස් |
| පච් (පිසීමෙහි) | පිස |
| බන්ධ් (බැඳීමෙහි) | බඳ |
| භිද් (බිඳීමෙහි) | බිඳ |
| භූ (වීමෙහි) | වූ |
| මුච් (මිදීමෙහි) | මුද |
| වෙෂ්ට් (වෙළීමෙහි) | වෙළ |
| යුජ් (යෙදීමෙහි) | යොද |
| ස්ථා (සිටීමෙහි) | සිටි |
| ස්නා (නෑමෙහි) | නා |

| සංස්කෘත ශබ්ද: | ඉන් භින්නවූ සිංහල ශබ්ද: | සංස්කෘත ශබ්ද: | ඉන් භින්නවූ සිංහල ශබ්ද: |
|---|---|---|---|
| අමෘත | අමා | ද්වාර | දොර |
| ආම්‍ර | අඹ | ද්වීප | දිව් |
| ආස්න | අසුන් | නාග | නා |
| ඉක්ෂු | උක් | න්‍යාය | නාය |
| ඊර්ෂ්‍යා | ඉසි | පීඨ | පිළ |
| උද්‍යාන | උයන් | පුත්‍ර | පුත් |
| ඌන | උණු (අඩු) | පුස්තක | පොත් |
| ඍෂි | රුසි | බ්‍රාහ්මණ | බමුණු |
| ඒක | එක් | භාර | බර |
| ඓශ්වර්ය | ඉසුරු | භිත්ති | බිත් |
| ඕජස් | ඔද | මධු | මී |
| ඖෂධ | ඔසු | මහී | මිහි |
| කාරුණ්‍ය | කුළුණු | මෘග | මුව |
| කිරීට | කිරුළු | මේෂ | මේ |
| ගෘහ | ගේ | යක්ෂ | යක් |
| ගෝචර | ගොදුරු | යන්ත්‍ර | යතුරු |
| ගෝත්‍ර | ගොත් | රාත්‍රි | රෑ |
| ග්‍රාම | ගම් | රශ්මි | රැස් |
| ග්‍රහණ | ගහණ (නාහය) | රෝග | රෝ |
| චූර්ණ | සුණු | ලක්ෂණ | ලකුණු |
| චෞර | සොර | ලංකා | ලක් |
| ඡිද්‍ර | සිදුරු | ලෝක | ලෝ |
| ජගත් | දිය | විද්‍යා | විදු |
| ජාති | දෑ | ශත්‍රු | සතුරු |
| ජ්‍යෙෂ්ඨ | දෙටු(වැඩිමහල්) | ශරීර | සිරුරු |
| තීර | තෙර | ශාසන | සසුන් |
| තෘණ | තණ | ශෘගාල | සිවල් |
| දේෂ | දෙස් | හේතු | හේ |

| | | | |
|---|---|---|---|
| ශරෛනස් | සිනි (සෙමින්) | උප | උව |
| | | උද් | උ |
| පශ්චාත් | පසු | දුර් | දු |
| චිරම් | සැර (බොහෝකල්) | ප්‍රති | පිළි |
| | | සං | ස |

| මාගධී ශබ්ද: | ඉන් බිත්නවූ සිංහල ශබ්ද: |
|---|---|
| චීවර | සිවුරු |
| ථෙර | තෙර |
| පාරමී | පෙරුම් |
| බුධ | බුදු |
| බොධි | බෝ |
| විහාර | වෙහෙර |
| සඞ්ඝ | සඟ |

| ද්‍රවිඩ ශබ්ද: | ඉන් බිත්නවූ සිංහල ශබ්ද: |
|---|---|
| තාලි (தாலி) | තැලි (ආභරණයක්) |
| තොලිල් (தொழில்) | තොයිල් |
| සාවල් (சாவல்) | හැවුල් (කුකුළා |

කිසි තැනෙක එකම ශබ්දය සංස්කෘත සහ මාගධී භාෂාවන්ගෙන් දෙවරකට බිඳී ශබ්ද දෙකක් වශයෙන් සිංහල ව්‍යවහාරයෙහි පෙණේ.

උදාහරණ: සංස්කෘත භාෂාවෙහි 'සත්‍රී' ශබ්දය සිංහලට 'ඉතිරි' කියාද, මාගධී භාෂාවෙහි 'ඉත්ථි' ශබ්දය සිංහලට 'ඉති' කියාද, සංස්කෘත භාෂාවෙහි 'අර්හ' ශබ්දය සිංහලට 'අරුත්' කියාද, මාගධී භාෂාවෙහි 'අත්ථ' ශබ්දය සිංහලට 'අත්' කියාද, සංස්කෘත භාෂාවෙහි 'මිත්‍ර' ශබ්දය සිංහලට 'මිතුරු' කියාද මාගධී භාෂාවෙහි 'මිත්ත' ශබ්දය සිංහලට 'මිත්' කියාද බිඳී තිබේ.

තත්සම ප්‍රකෘති පාඨයෙකුදු මෙහි දක්වනු ලැබේ.

| සංස්කෘත ධාතු: | මාගධී ධාතු: | සිංහල ධාතු: |
|---|---|---|
| ද (දීමෙහි) | ද | ද |
| පා (බීමෙහි) | පා | පා |
| යා (යාමෙහි) | යා | යා |

| සංස්කෘත ශබ්ද: | මාගධී ශබ්ද: | සිංහල ශබ්ද: |
| --- | --- | --- |
| අරුණ | අරුණ | අරුණ (මදක් රත) |
| කර | කර | කර (අත) |
| කලා | කලා | කලා(සඳමඬලින් දහසයින් පංගුව හෝ ගීතවාද්‍යාදි 64 ක් ශිල්ප.) |
| කිරණ | කිරණ | කිරණ (රැස්) |
| කුල | කුල | කුල |
| ගජ | ගජ | ගජ (ඇතා) |
| ගුණ | ගුණ | ගුණ |
| තිමිර | තිමිර | තිමිර (අඳුර) |
| නකුල | නකුල | නකුල (මුගටියා) |
| නර | නර | නර |
| පද | පද | පද |
| පුර | පුර | පුර |
| බල | බල | බල |
| වන | වන | වන |
| වියත් | ,, | වියත් |
| සමය | සමය | සමය |
| සුර | සුර | සුර |
| ඉති | ඉති | ඉති (මෙසේ) |
| න | න | න |
| විනා | විනා | විනා |
| සහ | සහ | සහ |
| සදා | සදා | සදා (හැමකල්හි) |

| ද්‍රවිඩ ශබ්ද: | සිංහල ශබ්ද: |
| --- | --- |
| ඉඩම් (இடம்) | ඉඩම් |
| ඉලක්කම් (இலக்கம்) | ඉලක්කම් |
| කඩෛ (கடை) | කඩ |
| කොණ්ඩෛ (கொண்டை) | කොණ්ඩ |

| ද්‍රවිඩ ශබ්ද: | සිංහල ශබ්ද: |
|---|---|
| නරි (நரி) | නරි |
| නිලෙල (நீல) | නිල |
| කුඩෙඩ (குடை) | කුඩ |
| කොඩි (கொடி) | කොඩි |

විභක්ති සහිත පදයක ප්‍රකෘතිය දැනගන්ට ඕනෑකොලේ නම් ඒ ශබ්දය පූර්වකොට කරණලද සමාසයක් බැලියයුතු.

උදාහරණ: 'එළුවා' යන පදයෙහි ප්‍රකෘතිය සොයනු පිණිස 'එළුමස්' යන සමාසය බැලූකල එහි මුලින් ප්‍රකෘති ස්වභාවයෙන් 'එළු' යන ශබ්දය පෙණේ.

තවත් උදාහරණ:

| පදය: | ප්‍රකෘතිය: | සමාසය: |
|---|---|---|
| මිනිස්සු | මිනිස් | මිනිස්ලොව |
| පූවුව | පූවු | පූවුකතුල |
| ගොන්නු | ගොන් | ගොන්බාන |
| දරුවා | දරු | දරුපෙම් |
| බත් | බත් | බත්මාළු |
| බල්ලා | බලු | බලුනගුට |
| රන් | රන් | රන්මිරිවැඩි |

සියලුම ශබ්දයෝ 'ස්වරාන්ත' සහ 'හලන්ත'යයි දෙකොටසකට බෙදනලද්දේය. අ ආ ආදි ස්වරය කින් කෙළවර වන්නෝ 'ස්වරාන්ත' නම් වෙත්.

උදාහරණ: රජ, දන්වා(අසුර), මුනි, ගි, සතුරු, දූ, ලේ, යෝ (යොග), ආදියයි.

ව්‍යඤ්ජනයකින් කෙළවර වන්නෝ 'හලන්ත' නම් වෙත්.

උදාහරණ: රුක්, අත්, පින්, සිප් (ශිල්ප), ගිම් (ග්‍රීෂ්ම), පොල්, කවි, වස් ආදියයි.

D.E. JOHANNES
K.N.C.

# XIII.
# DERIVATIVES.
## ප්‍රත්‍යයාර්ථ ශබ්ද.

ප්‍රකෘතියක අගට අර්ථයක් සඳහා එකතුකරණු ලද්දේ ප්‍රත්‍යය (පස) නම් වේ.

ධාතු ප්‍රකෘතියකින් ක්‍රියාවක් කියන්ට වුවමනා කල්හිද, ශබ්ද ප්‍රකෘතියක් විභක්ත්‍යර්ථයෙහි යොදන්ට වුවමනා කල්හිද ප්‍රකෘතීන් අගට ප්‍රත්‍යයයෝ එක්කරණු ලැබෙත්.

මේ හැර ධාතුවකින් නාමයක් සාදාගැණීම පිණිස හෝ නාමයකින් අන්‍ය නාමයක් සාදාගැණීම පිණිස හෝ ඊට සමහර ප්‍රත්‍යයයෝ එක්කරණු ලැබෙත්. මෙසේ සාදන ශබ්දයන්ට **'ප්‍රත්‍යයාර්ථ'** ශබ්ද (පසරුත්සද) යයි කියනු ලැබේ.

මේ ප්‍රත්‍යයාර්ථ (පසරුත්) ශබ්දයන් අතුරෙන් ධාතූන්ගෙන් සිද්ධවූ ශබ්දයන්ට 'කෘදන්ත'යයි කියාද නාමයන්ගෙන් සිද්ධවූ ශබ්දයන්ට 'තද්ධිත' යයි කියාද කියනු ලැබේ.

## 1. කෘදන්ත.

**කෘදන්ත** * සෑදීම පිණිස ධාතූන්ට එක්කරණ ප්‍රත්‍යයයෝ ෂට්කාරකාර්ථයෙහි ද භාවයෙහි ද වෙත්. එයින්:—

### 1. කර්මකාරක ප්‍රත්‍යයයෙන් නිෂ්පන්න ශබ්ද.

කරණී (කටයුතු දෙය): 'කර' කිරීමෙහි යන ධාතුව කොටගෙන් පරව කර්මකාරකයෙහි 'නී' ප්‍රත්‍යය යොදා සාදනලද්දේය.

* මාගධී ව්‍යාකරණයෙහි මීට 'කිතක'යයි කියනු ලැබේ.

පැන් (ප්‍රියයුතු දෙය): 'පා' බීමෙහි යන ධාතුවෙන් පරව 'ඇන්' ප්‍රත්‍යය කොට සාදන ලද්දේය.

ගත් (ගොතනලද දෙය): 'ගොත' ගෙතීමෙහි යන ධාතුව කෙරෙන් පරව 'අ' ප්‍රත්‍යය කොට පිළිපෙරළිකොට 'ගත' කියා සාද නැවත 'ත' කාරයෙහි 'අ' කාරය ලොප්කළ කල්හි 'ගත්' කියා සෑදේ.

බොජුන් (බුදියයුතු දෙය): 'බොජ' බුදීමෙහි යන ධාතුව කෙරෙන් පරව 'උන්' ප්‍රත්‍යයකොට සාදනලද්දේය.

2. කර්තෘකාරක ප්‍රත්‍යයෙන් නිෂ්පන්න ශබ්ද:

'වැදි (විදිනා තැනැත්තා): 'විද' විදීමෙහි යන ධාතුව කෙරෙන් පරව කර්තෘකාරකයෙහි 'ඉ'ප්‍රත්‍යය කොට 'වි'කාරයා වෙත සිටි 'ඉ'කාරයා 'ඇ'කාරයාට පෙරළා සාදන ලද්දේය.

යදී (යදිනාතැනැත්තා): 'යද'යාච්ඤා කිරීමෙහි යන ධාතුව කෙරෙන් පරව 'ඉ' ප්‍රත්‍යය කොට සාදනලද්දේය. (යදි සිඟන්නායි·)

ගැණි (ගණින්නා): 'ගණ' ගණන් කිරීමෙහි යන ධාතුහු කෙරෙන් පරව 'ඉ' ප්‍රත්‍යය කොට 'ග' කාරයා වෙත සිටි 'අ' කාරයා 'ඇ' කාරයාට පෙරළා සාදනලද්දේය.

දුවා (දුවන්නා): 'දව' දිවීමෙහි යන ධාතුහු කෙරෙන් පරව 'ආ' ප්‍රත්‍යය කොට 'ද'කාරය වෙත සිටි සවරයට මාත්‍රාවෘද්ධිකොට සාදන ලද්දේය.

පැනි (පැන් කැමැත්තා): 'පා' බීමෙහි යන ධාතුවෙන් පරව 'ඇනි' ප්‍රත්‍යය කොට සාදන ලද්දේය.

කරු (කරණ තැනැත්තේ): 'කර' කිරීමෙහි යන ධාතුවෙන් පරව 'උ' ප්‍රත්‍යය කොට 'කරු' කියා සාද 'ර'කාරයට [illegible] ආදේශ කොට සාදනලද්දේය.

3. කරණ කාරක ප්‍රත්‍යයයෙන් නිෂ්පන්න ශබ්ද

යාන් (යානා): ඒ කාරණකොටගෙණ යන්නේය යන අර්ථයෙහි 'යා' ගමන්හි යන ධාතුවෙන් පරව 'අන්' ප්‍රත්‍යයය කොට සාදනලද්දේය.

වසන් (වස්ත්‍ර): එයින් වසන්නේය යන අර්ථයෙහි 'වස' වැසීමෙහි යන ධාතුවෙන් සිඩයි.

කර (අත): එයින් කරන්නේය යන අර්ථයෙහි 'කර' කිරීමෙහි යන ධාතුවෙන් සිඩයි.

නහඬු: එයින් නහන්නේය යන අර්ථයෙහි 'නා' නෑමෙහි යන ධාතුවෙන් සිඩයි.

4 සම්ප්‍රදාන කාරක ප්‍රත්‍යයයෙන් නිෂ්පන්න ශබ්ද:

දනි (බ්‍රාහ්මණයා): ඕහට දෙනු ලැබෙයි යන අර්ථයෙහි 'ද' දීමෙහි යන ධාතුවෙන් සිඩයි.

5 අවධිකාරක ප්‍රත්‍යයයෙන් නිෂ්පන්න ශබ්ද:

බෙම් (රකුසා): ඔහුකෙරෙන් බිය පැමිණේයයන අර්ථයෙහි 'බා' බියෙහි යන ධාතුවෙන් සිඩයි.

6 ආධාර කාරක ප්‍රත්‍යයයෙන් නිෂ්පන්න ශබ්ද:

පුර: එහි සම්පත් පිරෙන්නේය යන අර්ථයෙහි 'පුර' පිරීමෙහි යන ධාතුවෙන් සිඩයි.

බිම්: එහි වන්නේය යන අර්ථයෙහි 'වූ' වීමෙහි යන ධාතුවෙන් 'විම්'යයි සෑදී 'ව' කාරයට 'බ' කාරාදෙශ වී තිබේ.

කර්තෘකාරක ප්‍රත්‍යයයෙන් සහ කර්ම කර්තෘ කාරක දෙකට සමානවූ ප්‍රත්‍යයයෙන්ද නිෂ්පන්නාව නාමපදයන්ට බොහෝවිට විශේෂණ වශයෙන් සිටින්නාවූ සමහර ප්‍රත්‍යයාන්ත ශබ්ද ඇත්තේය.

එයින් කර්තෘකාරක ප්‍රත්‍යයයෙන් නිෂ්පන්නාව අකර්මක ධාතුන්ගෙන් සිඩවූ සමහර ප්‍රත්‍යයාන්ත ශබ්ද මෙහි දක්වනු ලැබේ.

බබලන (බබලන්නාවූ): 'බබල' දිලිසීමෙහි යන ධාතුවෙන් පරව 'අන' ප්‍රත්‍යයය කොට සාදනලද්දේය.

වසනා (වසන්නාවූ): 'වස' වාසය කිරීමෙහි යන ධාතුවෙන් පරව 'අන' ප්‍රත්‍යයය කොට සාදනා ලද්දේය.

කුමුදු (ගිලුනාවූ): 'කුමුද' කිමිදීමෙහි යන ධාතුව කෙරෙන් පරව 'උ' ප්‍රත්‍යයය කොට 'ද' කාරයට 'ට'කාරාදෙශ කොට සාදන ලද්දේය.

කිපි (කොපවූ): 'කිපි' කිපීමෙහි යන ධාතුව කෙරෙන් පරව 'ඉ' ප්‍රත්‍යයය කොට සාදනලද්දේය.

තිටි (තුෂටවූ): 'තුස' සතුටුවීමෙහි යන ධාතුව කෙරෙන් පරව 'ඉ' ප්‍රත්‍යයය කොට 'ස'කාරයට 'ට'කාරය ආදෙශ කොට 'තා'කාරයට පිළිපෙරළි කොට සාදනලද්දේය.

සිටි (සිටියාවූ): 'සිටි' සිටීමෙහි යනා ධාතුව කෙරෙන් පරව 'ඉ'ප්‍රත්‍යයය කොට සාදනලද්දේය.

උදුල (උජ්වලිතවූ): 'උ'යනා උපසර්ගය පූර්වවූ 'දල' දිලිසීමෙහි යන ධාතුවකෙරෙන් පරව 'අ'ප්‍රත්‍යයය කොට පිළිපෙරළි කොට සාදන ලද්දේය.

කර්ම කර්තෘ කාරක දෙකට සමානවූ ප්‍රත්‍යයයෙන් නිෂ්පන්නව සකර්මක ධාතුන්ගෙන් සිද්ධවූ සමහර ප්‍රත්‍යයාර්ථ ශබ්ද මෙහි දක්වනු ලැබේ.

කැපූ (කපනලද හෝ කැපුවාවූ): 'කප' කැපීමෙහි යන ධාතුවෙන් පරව 'උ' ප්‍රත්‍යයය කොට 'ක' කාරයා වෙත සිටි 'අ' කාරයා 'ඇ'කාරයාට පෙරළා සාදනලද්දේය.

කන (කනුලබන්නාවූ හෝ කන්නාවූ): 'කා' කෑමෙහි යන ධාතුවෙන් පරව 'අන' ප්‍රත්‍යයය කොට සාදනලද්දේය.

දුටු (දක්නාලද්දවූ හෝ දුටුවාවූ): 'දිස්' දැක්මෙහි යනා ධාතුවෙන් පරව 'උ' ප්‍රත්‍යයය කොට 'ශ' කාරයට 'ට' කාරාදෙශ කොට පිළිපෙරළි කොට සාදනලද්දේය:

කොටු (කොටනලද්දවූ හෝ කොටුවාවූ): 'කොට' කොට්මෙහි යන ධාතුවෙන් පරව 'උ' ප්‍රත්‍යය යකොට පිළිපෙරළි කොට සාදනලද්දේය.

මැරු (මරණලද්දවූ හෝ මැරුවාවූ): 'මර' මැරීමෙහි යන ධාතුවෙන් සිඬයි.

පැළු (පළනලද්දවූ හෝ පැළුවාවූ): 'පළ' පැළීමෙහි යන ධාතුවෙන් සිඬයි.

දුන් (දෙනලද්දවූ හෝ දුන්නාවූ): 'ද' දීමෙහි යන ධාතුවෙන් සිඬයි.

* කර්තෘ කාරක ප්‍රත්‍යයෙන් නිෂ්පන්න කෘදන්ත කර්තෘකාරකය උක්ත කෙරෙති.

ඊට උදාහරණ:

"නිදුපුල් මල් ගත් අත් ඇතිව සැරහී දෑලයෙහි **'සිටි' ගෑණු දෙන්නා** මලින් කොළ පිස මල් අතුරු විපියට දමන්නාහ" යන වාක්‍යයෙහි 'සිටි' යන කෘදන්ත (පසරුත්) පදය කර්තෘහු උක්තකොට 'ගෑණු' යන පදයට විශෙෂණවේ.

තවත්:—

"මම පූගල **'වසන' තිස්ස තෙරුන්වහන්සේට** ආරාධනා කෙළෙමි."

"පැන් නැති මහ වනයෙක්හි **'විසූ' මහ ඇතෙක්**"

"මිහුලු නුවර **'වැසි'** පිංගුත්තර නම් **ළදරුවෙක්**"

"පෙර කළ පිණින් **'වන' දෙය** නාවිසිනුත් වැලකිය නොහැක්කේමැයි."

"මිතු රු තු මෝ **දුක් සැප දෙකෙහිම 'පැවතී'**
බිතු සිතු යම් රූමෙන් පිටු නොපාවි ති"

“රුක් සිදුරක වැ දේ
'**උන්**' කටු **නයෙක්** එස දේ

**කර්ම** කර්තෘකාරක දෙකට සමානවූ ප්‍රත්‍යයයෙන් නිෂ්පන්නවූ කෘදන්තයෙන් කර්මය හෝ කර්තෘව උක්තකෙරෙයි.

ඊට උදහරණ:

“සේනකයන් '**කී**' බස් අසා රජ්ජුරුවෝ 'පුත මහෞෂධ පණ්ඩිතයෙනි' කීහ” යන වාක්‍යයෙහි 'කී' යන කෘදන්ත පදය කර්මය උක්තකොට 'බස්' යන පදයට විශේෂණ වේ.

“එසේ '**කී**' **රජහට** චරපුරුෂයෙක් බොරුවක් ගොතා......කීහ” යන වාක්‍යයෙහි 'කී' යන කෘදන්ත පදය කර්තෘව උක්තකොට 'රජහට' යන පදයට විශේෂණ වේ.

තවත්:—

“රජ්ජුරුවන් '**දෙන**' **දෙය** නව් වියට සමාරක් පමණ නුසුදුසුය.”

“නා රජ්ජුරුවෝ කැමති කැමති වස්තු '**දෙන**' තමන් කරබදනා **අශ්වාඛ්‍ය මාණික්‍ය රත්නය** කුමාරයන්ගේ හස්ත තලයෙහි එලූහ.”

“උ '**දුන්**' **දෙයක්** ගණුව.”

“ව හන් දෙකක් '**දුන්**' **අගනක්** ඉසුරු පතා
යොදුන් උසැති පහයක ඉපිද පැහැ පතා”

“දහවල් '**කරණ**' **මෙමෙහෙවරත්** කොට”
“මේ සිතුවක්ම '**කරණ**' නොනිකරු **එකෙක**”
“මා විසින් '**කළ**' **මාසමකුත්** නැත”
“තමන් පා පියුම් ලෝමූදුන් '**කළ**' තිලෝගුරු **බොධිසත්වයන්වහන්සේ**”

**සිටි** (සිටිමෙහි), සිද (සිදිමෙහි), ආදී අකර්මක ධාතුන්ගෙන්ද නිසිවිටක කර්මකාරකාර්ථයෙහි කෘදන්ත පද සිඬවේ.

උදාහරණ:

"සක්දෙව් රජනෝ මිනිස්වෙසින් අවුත් පුරුෂයා පදිමින් **'සිරි' රථයෙහි** පසුකඩ අල්වාගෙණ යන්නාහු......"

"ඒසා මහත් රජ සේනාවක් කඳවුරු බැඳ **'හුන්' තැන** එකද මනුෂ්‍යයෙක් නැතිව සිස්වූයේය."

භාව ප්‍රත්‍යයෙන් නිෂ්පන්න ශබ්ද:

කරණු (කිරීම): 'කර' කිරීමෙහි යන ධාතුවෙන් පරව 'නු' ප්‍රත්‍යය කොට සාදනලද්දේය.

නටනු (නැටීම): 'නට' නැටුම්හි යන ධාතුවෙන් පරව 'නු' ප්‍රත්‍යය කොට සාදනලද්දේය,

දිවුම්: 'දව' දිවීමෙහියන ධාතුවෙන් පරව 'උම්' ප්‍රත්‍යයකොට පිළිපෙරළිකොටසාදනලද්දේය.

සිඳුම් (කැපීම): 'සිද' කැපීමෙහි යන ධාතුවෙන් පරව 'උම්' ප්‍රත්‍යය කොට සාදනලද්දේය.

කෙවිලි (කෙටුම්): 'කොට' කෙටීමෙහි යන ධාතුවෙන් පරව 'ලි' ප්‍රත්‍යය කොට පිළිපෙරළි කොට සාදනලද්දේය.

මිශ්‍ර භාෂාවෙහි කිසි තැනෙක සංස්කෘත කෘදන්ත පදද ව්‍යවහාරවූ බැවින් එහි සිද්ධිය මදක්වත් දැනගැණීම ප්‍රයෝජනවත් හෙයින් සංස්කෘත කෘදන්ත පාඨ ස්වල්පයක්ද මෙහි දක්වනු ලැබේ.

කිරීම් අර්ථ ඇති 'කෘ' යන ධාතුවට 'කරණලද' යන අර්ථයෙහි 'ත' ප්‍රත්‍යය එක්කොට 'කෘත' කියාද; 'කටයුතු' යන අර්ථයෙහි 'තව්‍ය' ප්‍රත්‍යයය එක් කොට 'කර්තව්‍ය' කියාද, එම අර්ථයෙහි 'අනීය' ප්‍රත්‍යයය එක්කොට 'කරණීය' කියාද; එම අර්ථයෙහිම 'ය' ප්‍රත්‍යයය එක්කොට 'කාර්‍ය' කියාද කෘදන්තයෝ සාදනු ලැබෙත්.

| ධාතු: | —ත— | —තව්‍ය— | —අනීය— | —ය— |
|---|---|---|---|---|
| කෘ (කිරීමෙහි) | කෘත | කර්තව්‍ය | කරණීය | කාර්‍ය්‍ය, කෘත්‍ය |
| ගම් (ගමනෙහි) | ගත | ගන්තව්‍ය | ගමනීය | ගම්‍ය |
| දා (දීමෙහි) | දත්ත | දාතව්‍ය | දානීය | දෙය |
| භූ (වීමෙහි) | භූත | භවිතව්‍ය | භවනීය | භව්‍ය |
| බුධ් (අවබොධකිරීමෙහි) | බුද්ධ * | බොධිතව්‍ය | බොධනීය | බොධ්‍ය |
| යුජ් (යෙදීමෙහි) | යුක්ත / යොජිත | යොජිතව්‍ය | යොජනීය | යොග්‍ය |
| දෘශ් (දැක්මෙහි) | දෘෂ්ට | ද්‍රෂ්ටව්‍ය | දර්ශනීය | දෘශ්‍ය |
| දන්ශ් (දෂ්ටකිරීමෙහි) | දෂ්ට | දංෂ්ටව්‍ය | දංශනීය | දංශ්‍ය |
| ශ්‍රු (ඇසීමෙහි) | ශ්‍රැත | ශ්‍රොතව්‍ය | ශ්‍රවණීය | ශ්‍රව්‍ය |

* මේ ආදීයෙහිදී 'ත' කාරයාගා ධාත්වන්තය බලා 'ධ' කාරාදිය ආදෙශ කරණු ලැබේ.

බන්ධ්' බැඳීමෙහි යන ධාතුවෙන් බද්ධ කියාද
'ප්‍රච්' පිළිවිසීමෙහි ,, පෘෂ්ට ,,
'ලභ්' ලැබීමෙහි ,, ලබ්ධ ,
'ඉෂ්' කැමතිවීමෙහි ,, ඉෂ්ට
'මූර්ඡ්' { මුළාවීමෙහි හෝ,, කලාන්තවීමෙහි } { මූඪ / මූර්ඡ කියාද }
කෘදන්ත සෑදෙත්.

'ඡිද්' ආදි ධාතූන්ට 'ත' ප්‍රත්‍යය වෙනුවට 'න' ප්‍රත්‍යය යොදනු ලැබේ. මේ 'න' ප්‍රත්‍යය ඝෂිච්චක පූර්වණ් යත් බලා මූර්ධජ හෝ වන්නේය.
'ඡිද්' බිඳීමෙහි යන ධාතුවෙන් ඡින්න කියාද
'සද්' හිඳීමෙහි ,, සන්න ,,
'ග්ලෛ' ගිලන්වීමෙහි ,, ග්ලාන ,,
'කෘෘ' විසිරීමෙහි ,, කීර්ණ ,,
'භන්ජ්' බිඳීමෙහි ,, භග්න ,,
කෘදන්ත සෑදෙත්.

කර්තෘ කාරක 'තෘ' 'අක' 'ඉන්' ප්‍රත්‍යයාන්ත කෘදන්ත සමහරක්ද මෙහි දක්වනු ලැබේ.

—'තෘ'—

| ධාතු: | කෘදන්ත: |
|---|---|
| කෘ (කිරීමෙහි) | කර්තෘ (කරන්නා) |
| දා (දීමෙහි) | දාතෘ (දෙන්නා) |
| හන් (මැරීමෙහි) | හන්තෘ (මරන්නා) |

—'අක'—

| ධාතු: | කෘදන්ත: |
|---|---|
| කෘ (කිරීමෙහි) | කාරක (කරන්නා) |
| දා (දීමෙහි) | දායක (දෙන්නා) |
| නී (මඟපෙන්වීමෙහි) | නායක (මඟපෙන්වන්නා) |

—'ඉන්'—

| | |
|---|---|
| කෘ (කිරීමෙහි) | කාරින් (කරන්නා)-කාරී* |
| වස් (වැසීමෙහි) | වාසින් (වසන්නා)-වාසී |
| වද් (කීමෙහි) | වාදින් (කියන්නා)-වාදී |

'අ' ප්‍රත්‍යයාන්ත කෘදන්ත සමහරක්ද මෙහි දක්වනු ලැබේ.

| ධාතු: | කෘදන්ත: |
|---|---|
| පඨ් (කියවීමෙහි) | පාඨ (පාඩම) |
| ත්‍යජ් (අත්හැරීමෙහි) | ත්‍යාග (අත්හැරීම) |
| භී (භය වීමෙහි) | භය |
| ජි (ජයගැන්මෙහි) | ජය |

'අන' ප්‍රත්‍යයාන්ත කෘදන්ත සමහරක්ද මෙහි දක්වනු ලැබේ.

---

* සංස්කෘත භාෂාවෙහි 'කාරින්' යන කෘදන්ත නාමය ප්‍රථමා විභක්ති ඒකවචනාන්ත කල්හි 'කාරී' කියා වේ. මිශ්‍ර සිංහලෙහි මෙසේ ප්‍රථමා විභක්ත්‍යන්ත පදය මිස 'කාරින්' යන ප්‍රකෘතිය වැඩි ව්‍යවහාර නොවේ. 'ඉන්' ප්‍රත්‍යයාන්තවූ සෙසු පදද මෙසේමැයි.

| ධාතු: | කෘදන්ත: |
|---|---|
| ගම් (යාමෙහි) | ගමන |
| භුජ් (කෑමෙහි) | භොජන |
| ශී (සැතපීමෙහි) | ශයන |
| භූ (වීමෙහි) | භවන |
| ශ්‍රු (ඇසීමෙහි) | ශ්‍රවණ |

## 2. තද්ධිත.

### ශුද්ධ සිංහල

**නැකති:** නකත් දතුයේ යනාර්ථයෙහි 'නකත්' ශබ්දයාහට 'ඉ' ප්‍රත්‍යයකොට 'න'කාරයාවෙහි සිටි 'අ'කාරය 'ඇ'කාරයට පෙරළා සාදනලද්දේය.

**නැව්:** නැව් දුවවනුයේ යනාර්ථයෙහි 'නැව්' ශබ්දයාහට 'ඉ' ප්‍රත්‍යයකොට සාදන ලද්දේය.

**රුවන් මුවා:** රුවනින් මවනලද්දේ (රතනයෙන් කරණලද්දේ) යනාර්ථයෙහි 'රුවන්' ශබ්දයෙන් පරව 'මුවා' ප්‍රත්‍යයකොට සාදනලද්දේය.

**දඹුමුවා:** දඹුයෙන් මවනලද්දේ යනාර්ථයෙහි 'දඹු' ශබ්දයෙන් සිද්ධයි.

**වයඹ:** වාතය මෙදෙසට දෙව්වූයේය යනාර්ථයෙහි 'වා' ශබ්දයෙන් සිද්ධයි.

**සැබි:** සභාවට අභිවූයේ (වඩින්නේ) යනාර්ථයෙහි 'සබ' ශබ්දයෙන් සිද්ධයි.

**පදි:** පාදයන්ට හිතවූයේ යනාර්ථයෙහි 'පද' ශබ්දයෙන් සිද්ධයි.

**තොටි:** තොටෙහි නියුක්ත වූයේ යනාර්ථයෙහි 'තොට' ශබ්දයෙන් සිද්ධයි.

**ගැමි:** ගමෙහි වූයේ යනාර්ථයෙහි 'ගම්' ශබ්දයෙන් සිද්ධයි.

සැඟි: සඟෙහි (සංඝයෙහි) වූයේ යනාර්ථයෙහි 'සඟ' ශබ්දයෙන් සිඬයි.

බිලි: බලඇතියේයනාර්ථයෙහි'බල'ශබ්දයෙන්සිඬයි.

කිරි(ඇතා): කර(අත)ඇතියේ යනාර්ථයෙහිකරශබ්දයෙන් සිඬයි. (කරහෙවත් අත නම් සොඬයි.)

ඇත්: අත් ඇතියේ යනාර්ථයෙහි 'අත්' ශබ්දයෙන් සිඬයි.

දෙනෙතා: දනන් සමූහය යනාර්ථයෙහි 'දන' ශබ්දයෙන් සිඬයි.

ලෝතා: සකල ලොකයා යනාර්ථයෙහි 'ලෝ' ශබ්දයෙන් සිඬයි.

නියවත්: නි (ශූන්‍යය) ඇතියේ යනාර්ථයෙහි 'නිය' ශබ්දයෙන් සිඬයි.

මිශ්‍ර භාෂාවෙහි ව්‍යවහාරවෙන සංස්කෘත තද්ධිත නාම ස්වල්පයක්ද මෙහි දක්වනු ලැබේ.

'අ' ප්‍රත්‍යයාන්ත තද්ධිත.

| නාම: | තද්ධිත නාම: |
| --- | --- |
| (යුවන්)තරුණයා) | යෞවන (තරුණ භාවය) |
| පුත්‍ර | පෞත්‍ර (මුණුබුරා) |
| ව්‍යාකරණ | වෛයාකරණ (ව්‍යාකරණ උගත්තා) |
| කාක (කවුඩා) | කාක (කවුඩු සමූහය) |
| කෂාය (කහව) | කාෂාය (කහටපාට කරණලද) |
| පුරු (එනම් කෙණෙක්) | පෞරව (පුරුහුගෙන් පැවත එන්නා) |
| මගධ (එනම් රටක්) | මාගධ (මගධරට උපන්නේ) |

'ය' ප්‍රත්‍යයාන්ත තද්ධිත.

| | |
| --- | --- |
| රාජන් | රාජ්‍ය |
| වීර | වීර්‍ය |
| දරිද්‍ර (දිළිඳු) | දාරිද්‍ර්‍ය (දිළිඳු බව) |
| ග්‍රාම (ගම) | ග්‍රාම්‍ය (ගමෙහි වූයේ) |
| දන්ත | දන්ත්‍ය (දතට හිතවූයේ) |

### 'ත්ව' 'තා' ප්‍රත්‍යයාන්ත තද්ධිත.

| | |
|---|---|
| දුඃඛ (දුක්) | දුඃඛත්ව, දුඃඛතා (දුක් බව) |
| භීරු (භය) | භීරුත්ව, භීරුතා |
| සාර | සාරත්ව, සාරතා |
| ජන | ජනතා (ජනසමූහය) |

### 'මත්' ('වත්')* ප්‍රත්‍යයාන්ත තද්ධිත.

| | |
|---|---|
| කීර්ත්ති | කීර්ත්තිමත් (කීර්ත්ති ඇති) |
| ශ්‍රී | ශ්‍රීමත් |
| බුද්ධි | බුද්ධිමත් |
| ඥාන | ඥානවත් (නුවණ ඇති) |
| ගුණ | ගුණවත් |
| ප්‍රඥා | ප්‍රඥාවත් |

### 'ඉන්' 'වින්' ප්‍රත්‍යයාන්ත තද්ධිත.

| | |
|---|---|
| ධන | ධනින්-ධනී † (ධනවත් තැනැත්තා) |
| තෙජස් (තෙද) | තෙජස්වින්—තෙජස්වී |
| තපස් | තපස්වින්—තපස්වී |

### 'ඉත' ප්‍රත්‍යයාන්ත තද්ධිත:

| | |
|---|---|
| පුෂ්ප (මල්) | පුෂ්පිත (මල් දරණලද්දේ) |
| ව්‍යාධි | ව්‍යාධිත (ව්‍යාධියෙන් පෙළෙනලද්දේ) |

### 'මය' ප්‍රත්‍යයාන්ත තද්ධිත.

| | |
|---|---|
| ආම්‍ර (අඹ) | ආම්‍රමය (අඹගසින් යුක්තවූයේ) |
| දාරු (ලී) | දාරුමය (ලීයෙන් කරණලද්දේ) |

---

* 'මත්' යන ප්‍රත්‍යය අ ආ නොවහොත් 'ම' කාරයකින් කෙළවරවූ ශබ්දයන්ට හා අනතිම අක්ෂරයට පූර්වයෙන් ඒ අක්ෂර ඇති ශබ්දයන්ටද, (ඞ ඤ, ණ, න, හැර) කණ්ඨජ, තාලුජ, මූර්ධජ, දන්තජ, ඔෂ්ඨජාක්ෂරයන්ගෙන් කෙළවර වෙන ශබ්දයන්ටද එක්කරණ කල්හි 'වත්' යන්නට පෙරළෙයි.

† කෘදන්ත කාණ්ඩයෙහිදී කීලෙස 'කාරින්' 'කාරී' වන පරිදි මෙහිද සැලකියයුතු.

නැගෙණහිර දිගට අධිපතියයි සම්මතවූ ශක්‍රයන් කියන 'ඉන්ද්‍ර' ශබ්දයද, ගිනිකොණට අධිපති යයි සම්මතවූ ගින්න කියන 'අගනි' ශබ්දයද යනාමේ ආදියෙන් කිසිවිටක ඔවුන් අධිපතිවූ දිශාවෝද කියනු ලැබෙත්. කිසිතැනක ඒ ශබ්දයන් ප්‍රත්‍යය වත්කොට ඉන් ඔවුනොවුන්ගේ දිශාවෝ කියනු ලැබෙත්.

| දිශාධිපතීන්ගේ නාම: | ප්‍රත්‍යයවත්කළ කල්හි: |
|---|---|
| ඉන්ද්‍ර | ඓන්ද්‍රී (නැගෙණහිර) |
| අගනි | ආග්නෙයී (ගිනිකොණ) |
| යම | යාම්‍යා (දකුණ) |
| නිඍති | නෛඍති (නිරිත) |
| වරුණ | වාරුණී (බස්නාහිර) |
| වායු | වායව්‍යා (වයඹ) |
| කුවෙර | කෞවෙරී (උතුර) |
| ඊශාන | ඓශානි (ඉසාන) |

වෘක්ෂ ලතාදිය කියන ශබ්දයන්ද කිසිවිටක ප්‍රත්‍යයවත්කිරිමෙන් ඒ ඒ වෘක්ෂ ලතාදිය සම්බන්ධ මූල් මල් පල ආදිය කියනුලැබේ. අන් කිසි තැනෙක ප්‍රත්‍යයවත් නොකොට ඒ ඒ වෘක්ෂයන් කියන ශබ්දයෙන්ම මූල් මල් පල ආදිය කියනු ලැබේ. එසේ ප්‍රත්‍යයවත්නොකොට මූල් මල් ආදිය කියන කල්හි ඊට **'අභෙදෞපචාර'** යයි * කියනු ලැබේ.

අභෙදොපචාරයට සිංහල උදහරණ:

මම පොල් සිටවීමි.
මම පොල් කැඩීමි.
මම පොල් කෑමෙව්මි.

මින් පළමුවෙනි වාක්‍යයෙහි පොල් ශබ්දයෙන් අභෙදෞපචාරයෙන් පොල් ගස්ද, දෙවෙනි වාක්‍යයෙහි පොල් ශබ්දයෙන් පොල් ගෙඩිද, තුන්වෙනි වාක්‍යයෙහි පොල් ශබ්දයෙන් පොල් මදද කියනු ලැබේ.

---

* අභෙදෞපචාර යනු නොබෙදී ලඟ හැසිරීම යනාර්ථයි.

## තර, තම.

**ගුණ** ශබ්දයන්ගේ ගුණ වැඩි බැව් හා ඉතා වැඩි බැව් හඟවන පිණිස ඊට 'තර' 'තම' යන ප්‍රත්‍යය යෝ එකතු කරණු ලැබෙත්.

| | -තර- | -තම- |
|---|---|---|
| ප්‍රිය | ප්‍රියතර (වඩා ප්‍රිය) | ප්‍රියතම (ඉතා ප්‍රිය) |
| උදාර | උදාරතර(වඩා උදාර) | උදාරතම (ඉතා උදාර) |
| ගුරු(බර) | ගුරුතර (වඩා බර) | ගුරුතම (ඉතා බර) |
| ස්ථිර | ස්ථිරතර | ස්ථිරතම |

'ඊයස්' 'ඉෂ්ඨ' යන ප්‍රත්‍යයයෝද එම අර්ථ ප්‍රකාශ කිරීම පිණිස ශබ්දයන්ට එක්කරණු ලැබෙත්.

| | -ඊයස්- | -ඉෂ්ඨ- |
|---|---|---|
| පාප | පාපීයස් | පාපිෂ්ඨ |
| ප්‍රශස්‍ය(ස්තුති කටයුතු) | ශ්‍රේයස් | ශ්‍රේෂ්ඨ |
| මහත් | මහීයස් | මහිෂ්ඨ |
| ප්‍රිය | ප්‍රේයස් | ප්‍රේෂ්ඨ |
| වෘද්ධ | වර්ෂීයස් | වර්ෂිෂ්ඨ |
| | ජ්‍යායස් | ජ්‍යේෂ්ඨ |

## XIV
## GENDER.
## ලිඞ්ග (ලිඟු).

ප්‍රාණ සහිත සත්ත්වයන් කියන ශබ්දයන්ගේ ලිඞ්ග විශේෂය ප්‍රකට වුවත් අප්‍රාණිද්‍රව්‍ය වාචකවූද භාව වාචකවූද ශබ්දයන්ගේ ලිඞ්ග විභාගය දැනගැණීම ඒ ශබ්දයන් බිහිවූ මූල භාෂාවන්හි ලිඟුවෙසෙස් නොදන්නා තැනැත්තන්ට පහසු නොවේ. සංස්කෘත මාගධි භාෂාවන්හි 'පුරුෂ' 'ස්ත්‍රී' 'නපුං

ශක'යයි ලිඞ්ගත්‍රයක් ඇත්තේද සිංහල භාෂාවෙහි ඒ තුනම 'පුරුෂ' 'ස්ත්‍රී' ලිඞ්ගවයෙහි අන්තර්ගත වේ. නපුංසක ලිඞ්ගයක් එහි නොපෙණේ. සංස්කෘත මාගධී භාෂාවන්හි නපුංසක ලිඞ්ගයෙහි වන්නාවූ සියලුම ශබ්ද සිංහලට බිඳෙනකල හෝ තත්සම වශයෙන් ව්‍යවහාරවන කල හෝ පුංලිඞ්ගයෙහි වැටේ. සංස්කෘත මාගධී භාෂාවන්හි පුරුෂ ස්ත්‍රී ලිඞ්ගවයෙහි වන්නාවූ ශබ්ද සිංහල භාෂාවෙහි කිසි වෙනසක් නොව ඒ ඒ ලිඟුවෙහිම වැටෙත්.

සංස්කෘත භාෂාවෙහි පුරුෂ වාචි ශබ්දයන්ගෙන් භිනනාවූ සිංහල භාෂාවෙහිද තල්ලිඞ්ගිකවූ ශබ්ද පාඨයක් භිනනාවූ මාතෘභාෂාවෙහි ශබ්දයන් සමග මෙහි දක්වනු ලැබේ.

| සංස්කෘත: | සිංහල | සංස්කෘත: | සිංහල |
|---|---|---|---|
| අග්නි | ගිනි | බලි | බිලි |
| ආදර | අදර | බාහු | බා |
| ගුනර්ථ | ගත් | මණි | මිණි (මැණික්) |
| ග්‍රාම | ගම් | මාර්ග | මග |
| චන්ද්‍ර | සඳ | මේඝ | මේ |
| තඩාග | තළා (විල්) | මෝක්ෂ | මොක් |
| තරු | තුරු (රුක්) | රශ්මි | රැස් |
| තිල | තල | ලෝක | ලෝ |
| දේශ | දෙස් | වෘක්ෂ | රුක් |
| දීප | දිව් (පහන්) | ව්‍රීහි | වී |
| පර්වත | පව් | සමුද්‍ර | සමුදුර |
| පාද | පා | ශීර්ෂ | හිර |
| පාංශු | පස් | ස්වර්ග | සග |

සංස්කෘත භාෂාවෙහි ස්ත්‍රී වාචි ශබ්දයන්ගෙන් භිනනාවූ සිංහල භාෂාවෙහිද තල්ලිඞ්ගිකවූ ශබ්ද පාඨයක් භිනනාවූ මාතෘභාෂාවෙහි ශබ්දත් සමග මෙහි දක්වනු ලැබේ.

| සංස්කෘත: | සිංහල: | සංස්කෘත: | සිංහල: |
|---|---|---|---|
| ආඥා | අන | මහී | මිහි (පොළොව) |
| කීර්ති | කිත් | රාත්‍රී | රෑ |
| ක්‍රියා | කිරිය | ලජ්ජා | ලද |
| ක්‍රීඩා | කෙළි | ලතා | ලිය |
| ජාති | දෑ | ලේඛා | ලේ (පෙළ) |
| ජිහ්වා | දිව් | විද්‍යුත් | විදු |
| ජ්‍යා | දිය | ශඞ්කා | සැක |
| (දුන්නේ ලනුව) | | ශරද් | සරා (ඍතුවක්) |
| නදී | නී (ගඟ) | ශාලා | සල් |
| නිඥා | නිදි | සභා | සබ |
| නිද්‍රා | නිදි | සම්පත්ති | සැපත් |
| භූමි | බිම් | සේනා | සෙන් |

සංස්කෘත භාෂාවෙහි නපුංසක ලිඞ්ගික ශබ්ද යන්ගෙන් භිනනාවූ සිංහල භාෂාවෙහි පුංලිඞ්ගිකාවූ ශබ්ද පාඨයක් භිනනාවූ මාතෘ භාෂාවෙහි ශබ්දන් සමග මෙහි දක්වනු ලැබේ.

| සංස්කෘත: | සිංහල: | සංස්කෘත: | සිංහල: |
|---|---|---|---|
| අඤ්ජන | අඳුන් | පාප | පව් |
| අරණ්‍ය | අරන්, රන් | ඵල | පල |
| | (වනය) | මාංස | මස් |
| ආසන | අසුන් | මුඛ | මුව |
| උද්‍යාන | උයන් | යෝජන | යොදුන් |
| කාෂ්ඨ | කට (දර) | රූප | රූ |
| තමස් | තම (අඳුර) | ලක්ෂණ | ලකුණු |
| තීර | තෙර | වස්තු | වත් |
| තෘණ | තණ | වස්ත්‍ර | වත් |
| දුඃඛ | දුක් | රජස් | රෙද (ධූලි) |
| ධන | දන | ශත | සිය |
| නගර | නුවර | ශිල්ප | සිප් |
| නයන | නුවන්(ඇස) | සරස් | සර (විල) |
| නේත්‍ර | නෙත් | සුඛ | සුව |
| පර්ණ | පත් | හෘදය | හද |

තා, ම, එ, මෙ, යම්, කිසි, ආදි සර්වනාමද; නිල්, හැලි, දැඩි, උස්, තුරුණු, ආදි ගුණශබ්දද දෙලිඟු සමවෙත්. එනම් ස්ත්‍රී පුරුෂ ලිඞ්ගවයෙහිම ව්‍යවහාර වෙත්. * —— ——

අපිත්‍රියා ශබ්දයන්හට ද ගුණ ශබ්දයන්හට ද 'ඊ' ප්‍රත්‍යය එක්කිරීමෙන් බොහෝවිට ස්ත්‍රීවාචි ශබ්ද සාදනු ලැබේ.

| අපි ක්‍රියා ශබ්ද: | 'ඊ' ප්‍රත්‍යය එක්කොට සෑදු ස්ත්‍රීවාචි ශබ්ද: |
|---|---|
| එන්නේ | එන්නී |
| දුවන්නේ | දුවන්නී |
| බලන්නේ | බලන්නී |

| ගුණ ශබ්ද: | 'ඊ' ප්‍රත්‍යය එක්කොට සෑදු ස්ත්‍රීවාචි ශබ්ද: |
|---|---|
| හෙලලු | හෙලිලී |
| කොමල | කොමලී |
| සුදු | සුද්දී |

පුරුෂවාචි ශබ්දයන්හට ද ස්ත්‍රී අර්ථයක් ප්‍රකාශ කරන්ට වුවමනාකල්හි බොහෝසෙ 'ඊ' ප්‍රත්‍යය එකතුකරණු ලැබේ.

| ශුද්ධ සිංහලෙහි | | මිශ්‍රසිංහලෙහි ව්‍යවහාර සංස්කෘත ශබ්ද: | |
|---|---|---|---|
| පුරුෂවාචිශබ්ද: | ස්ත්‍රීවාචිශබ්ද: | පුරුෂවාචී: | ස්ත්‍රීවාචි |
| කුමර | කුමරී † | කුමාර | කුමාරී |
| බමුණු | බැමිණී | නර | නාරී |
| මහණ | මෙහෙණී | බ්‍රාහමණ | බ්‍රාහමණී |
| මුනුබුරු | මිනිබිරි | දාස | දාසී |
| යහලු | යෙහෙලී | රාක්ෂස | රාක්ෂසී |
| සතුරු | සැතිරී | උපාධ්‍යාය | උපාධ්‍යායී |
| දරු | දැරී | හස්තින් | හස්තිනී |
| දස් | දැසි | | |

* නිපාත උපසර්ග යන අව්‍යයශබ්දයන්ට ලිඞ්ගවිශෙෂ යක් නැති බැව් සැලකියයුතු

† 'ඊ' කාරාන්ත ස්ත්‍රීවාචී ශබ්ද බොහෝවිට හ්‍රස්වවී 'ඉ' කාරාන්තයන් මෙන් පෙණේ. කුමරි, බැමිණි ආදිය මෙනි.

පුරුෂවාචි කිසි ශබ්දයක්හට 'ඉනි' ප්‍රත්‍යය එක් කිරීමෙන් ස්ත්‍රී අර්ථය හඟවනු ලැබේ.

| ශුද්ධ සිංහලෙහි | | මිශ්‍ර සිංහලෙහි | |
|---|---|---|---|
| පුරුෂවාචි: | ස්ත්‍රීවාචි: | පුරුෂවාචි: | ස්ත්‍රීවාචි: |
| යක් | යකිනි (යකින්නි) | රජ | රජිනි |
| ඇත් | ඇතිනි (ඇතින්නි) | භික්ෂු | භික්ෂුණී |
| නා | නැයිනි | ආචාරි | ආචාරිණී |
| පති* | පතිනි† | | |

ස්ත්‍රීවාචි කිසිශබ්දයක් ස්වභාවයෙන්ම ඊකාරාන්තයි.

උදාහරණ:

| ශුද්ධ සිංහල: | සංස්කෘත: |
|---|---|
| ගැහැණි | භාගිණී |
| ඉතිරි | ස්ත්‍රී |
| නී | නදී |

ශුද්ධ සිංහලෙහි 'සොර' 'කොර' ආදි ශබ්ද ස්ත්‍රී ලිඞ්ගයෙහි වනාකල්හි 'සෙර' 'කෙර' ආදි ආකාරයෙන්ද මිශ්‍ර භාෂාවෙහි 'උපාසක' 'චෙටක' ‡ 'මාණවක' § ආදිය ස්ත්‍රීලිඞ්ගයෙහි වනාකල්හි 'උපාසිකා' 'චෙටිකා' 'මාණවිකා' ආදි ආකාරයෙන්ද ව්‍යවහාර කරණු ලැබේ.

පිය ආදී කිසි ශබ්දයක්හට ස්ත්‍රීප්‍රත්‍යය එකතුකරණු නොලැබේ. ඒ ශබ්දයන්ගේ ස්ත්‍රී අර්ථය අන්‍ය ශබ්දයන් විසින් ප්‍රකාශ කරණු ලැබේ.

උදාහරණ:

| පුංලිඞ්ග: | ස්ත්‍රීලිඞ්ග: | පුංලිඞ්ග: | ස්ත්‍රීලිඞ්ග: |
|---|---|---|---|
| පිය | මව් | පුත් | දූ |
| මයිල් | නැදි | සැමි | අඹු |
| රජ | බිසව් | ගොන් | දෙන |
| අස් | වෙළඹ | මොනර | සෙබඩ |

* ස්වාමියා. † ස්වාමියා කෙරෙහි පවත්නා ස්ත්‍රිය. ‡ වැඩකරුවා. § තරුණයා.

කිසි ශබ්දයක් ස්ත්‍රීලිඞ්ගයෙහි යොදන්ට වුවමනා කල්හි ස්ත්‍රී අර්ථ ඇති අන්‍ය ශබ්දයක් ඒ හා සමාස කරණු ලැබේ.

උදාහරණ:

| | |
|---|---|
| එළු | එළුදෙන |
| මී | මීදෙන |
| දෙව් | දෙවිදු |
| ගුරුළු | ගුරුළු මෙණෙවි |
| නා | නාමෙණෙවි |

ස්ත්‍රීවාචී ශබ්ද නිතරම ඊකාරාන්තයායයි සිතා මුළා නොව සමහර ශබ්දයන් අන්‍ය ස්වරාන්ත බැව් හා කිසිවක් හලන්ත බැව්ද සැලකියයුතු.

ලිය, ලද (ලජ්ජා), ආදිය අකාරාන්තයි.

කලා (සඳමඬලින් දහසයින් පංගුව හෝ ගීත වාද්‍යාදි 64 ක් ශිල්පයෝ), සරා (ශරත්කාලය) ආදිය ආකාරාන්තයි.

කෙළි (ක්‍රීඩා), නිදි (නිද්‍රා) ආදිය ඉකාරාන්තයි.

විදු (විද්‍යා) ආදිය උකාරාන්තයි.

දූ (දියණි) ආදිය ඌකාරාන්තයි.

ලේ (පෙළ) ආදිය ඒකාරාන්තයි.

දෞ (දීපතිය) ආදිය ඖකාරාන්තයි.

බිම් (භූමිය), කාත් (ස්ත්‍රිය) ආදිය හලන්තයි.

මළා, ගියා, දුනු (දුන්නි), වුසු (විසූ තැනැත්තිය) ආදි අර්ථක්‍රියාද ස්ත්‍රීවාචකයි.

පුංලිඞ්ගික ශබ්දද ස්වරාන්ත හෝ හලන්ත වෙත්.

උදාහරණ:

දල (දිය, ගිනි හෝ පත්‍ර), රණ (යුද්ධය), රස (රස දිය, වතුර හෝ කසට ආදි රස), ආදිය අකාරාන්තයි.

රා (රාග, වර්ණි හෝ රාහු), පා (පය හෝ කිරි), තළා (විල), ආදිය ආකාරාන්තයි.

ගිරි (පර්වත), අවි (ආයුධ), මුනි (තාපසයා), මැසි (මැස්ස), ආදිය ඉකාරාන්තයි.

නි (නියපොතු හෝ නුවන), සි (සිංහ) ආදිය ඊකාරාන්තයි.

ඇදුරු (පඬිත හෝ ආචාර්ය), තුරු (ගස් හෝ බෙර) මරු (වායු, වැල, හෝ මාරයා), ආදිය උකාරාන්තයි.

බූ (භූත), දූ (කැවුම්), ඤූ (හොඳි), රූ (රූප), ආදිය ඌකාරාන්තයි.

හේ (හෙතු), කේ (කෙස් හෝ වැටකේ ආදිය), මේ (බත් හෝ විලාකුල්), ආදිය ඒකාරාන්තයි.

රෝ (රොග), සෝ (තණ), යෝ (යොග හෝ යොධ) ආදිය ඕකාරාන්තයි.

රුක් (වෘක්ෂ), අත් (හස්ත), කප් (කල්ප), ගැබ් (ගර්භ), දුම් (ධූම), නගුල් (නඟුල), පව් (පාප), මස් (මාංස) ආදිය හලන්තයි.

පුරුෂවාචී කිසිශබ්දයක්හට 'අනු'යන ප්‍රත්‍යයක්ද අන් කිසි ශබ්දයක්හට 'ආන' යන ප්‍රත්‍යයක්ද යොදනු ලැබේ. එසේම ස්ත්‍රීවාචී සමහර ශබ්දයන් හට 'අනි' යන ප්‍රත්‍යයක්ද බොහෝවිට යොදනු ලැබේ.

එබඳු ශබ්දයන්ට විභක්ති යොදනුවුවමනා කල්හි ඊටකී ප්‍රත්‍යයන් අගට යොදනු ලැබේ. උදාහරණ:

| ප්‍රකෘතිය: | අනු' ප්‍රත්‍යය එක්වූ කල්හි: | 'ඕ' විභක්තිය එක්වූකල්හි: |
|---|---|---|
| පුත් | පුතනු | පුතනුවෝ |
| බෑනා | බෑනනු | බෑනනුවෝ |
| මයිල් | මයිලනු | මයිලනුවෝ |
| තෙර | තෙරණු | තෙරණුවෝ |

| ප්‍රකෘතිය: | 'ආන' ප්‍රත්‍යය එක්වූකල්හි: | 'ඕ' විභක්තිය එක්වූකල්හි: |
| --- | --- | --- |
| රජ | රජාන | රජානෝ |
| සිටු | සිටාන | සිටානෝ |
| ගිරං | ගිරාණ | ගිරාණෝ |
| පිය | පියාන | පියානෝ |

| ප්‍රකෘතිය: | 'අනි' ප්‍රත්‍යය එක්වූකල්හි: | 'ඕ' විභක්තිය එක්වූකල්හි: |
| --- | --- | --- |
| දූ | දුවනි | දුවනියෝ |
| යෙහෙළි | යෙහෙලනි | යෙහෙලනියෝ |
| නෑදි | නෑන්දනී | නෑන්දනියෝ |
| මව් | මෑනි | මෑනියෝ |
| අඹු | ඇඹිබනී | ඇම්බනියෝ |

සමහර ශබ්දයකින් කියන වස්තූන් ස්වභාව යෙන් අප්‍රාණි හෙයින් ඔවුන් සම්බන්ධ ලිඞ්ග භෙද යන් අව්‍යක්ත වුවත් ඒ ශබ්දයන් සංස්කෘත මාගධි භාෂානුසාරයෙන් පුංලිඞ්ගයෙහි හෝ ස්ත්‍රීලිඞ්ගයෙහි ව්‍යවහාර කරණ බැව් මේ මතුදක්වන නිදර්ශන යන්ගෙන් පැහැදිලිවේ.

සංස්කෘත භාෂාවෙහි නපුංසකවාචී 'මාණික්‍ය' ශබ්දයෙන් භින්නවූ සිංහලෙහි පුංලිඞ්ගිකවූ 'මැණික්' ශබ්දයහට නිදර්ශන:—

"ශක්‍රදෙවෙන්‍ද්‍රයන් විසින් කුස රජ්ජුරුවන්ට දුන් **මැණික තෙම** අටනෙනකින් වක්වූයේය"

සංස්කෘත භාෂාවෙහි ස්ත්‍රීවාචී 'පුෂ්කරණී' ශබ්ද යෙන් භින්නවූ සිංහලෙහිද ස්ත්‍රීලිඞ්ගිකවූ 'පොකු ණු' ශබ්දයහට නිදර්ශන:—

"**ඒ පොකුණ තොමෝ** පස්පියුමෙන් සැදුම්ලද් දීය"

තවත් අප්‍රාණීන් කියන පුරුෂවාචී ශබ්දයන්ට නිදර්ශන:—

"සමුද්‍රසඞ්ඛ්‍යාතවූ ඒ **සාගරය** තෙමේ අනවරතවූ සියදහස් ගණන් මහත්වූ රළවේග ඇත්තේ වෙරළ ඉක්මනනොගී වෙරළම ගැසී බිඳේද........"

"එහෙයින් ඒ වෙෂ නැමති **වහනියතෙම** තොපගේ චිත්තසන්තානයෙහි හටනොගණිවා."

"මේ **ශිල්පතෙමේ** හෙවත් **නුවන තෙමේ** ධන ධාන්‍යාදීවූ භොග සම්පත් සිඬ නොකරන්නේය."

අප්‍රාණීන් කියන ස්ත්‍රීවාචී ශබ්දයන්ට නිදර්ශන:—

"ඒ ඇළ හෝ ආදීන්ගේ ප්‍රවෙශයට ආධාරත්වයෙන් **ගඞ්ගා තොම** මහ මුහුදට වදනාලබන්නී ගඞ්ගායයන ව්‍යවහාරය නැතිව ගොස් මුහුදහා එක්විමෙන් මූදයයි යන ව්‍යවහාරයට යන්නේද......"

"ඒ **සාලාව තොමෝ** සුධර්මාව හා සමානවිය"

"**ප්‍රඥා තොමෝ** එසේකොට ළියනොනැත්තාය."

"මේ **සෙනා තොමෝ** සිංහ සමාන වික්‍රම ඇත්තිය." "ගියොත් අපට මහා **ලජ්ජා** වන්නිය."

"ඒ මහතානන්වහන්සේගේ **ක්‍රියාව තොමෝ** සියලුතැන්හි පතළේය."

"ඒ **තෘෂ්ණා තොමෝ** තොප නොපෙළාවා."

"සත්වයන්ගේ **බුද්ධි තොම** සකල ශාස්ත්‍ර නමැති ජලයෙන් ශුඬකිරීමෙන් අතිශයින් නිර්මලවූවාද බොහෝසේ කලුෂ බවට පැමිණේයි." *

---

* සංස්කෘත ශබ්දයන්ගෙන් භින්නවූ ශුද්ධ සිංහල ශබ්දයන්ගේ හෝ මිශ්‍ර භාෂාවෙහි ව්‍යවහාරකරණ සංස්කෘත ශබ්දයන්ගේ හෝ ලිඞ්ගව්‍යවහාරය නිසැකයෙන් උගන්නා කැමැත්තන් විසින් 'අමරකොෂය'යි ප්‍රසිද්ධවූ අමරාචාර්යයන් විසින් රචනාකරණලද 'නාමලිඞ්ගානුශාසනය' හදාළ යුතු.

# XV.

# MUTABLE & IMMUTABLE FORMS.

## නියම අනියම විධි.

පදයන් සෑදීමේදී කටයුතු ලොපාදිය හෝ සන්ධි සමාසාදිය හෝ එකම විධියක්ව පවතී නම් එය නියම විධි (නියම් විදි) යයි කියනු ලැබේ.

එසේ නොවන්නේ අනියම විධි (අනියම්විදි) යයි කියනු ලැබේ.

### උදාහරණ:

'නැවත කියනලද' යනාදියෙහි 'පුන' 'උත්' ශබ්දවය සන්ධිකරණකාල සියලු තන්හිම 'ර'කාරාගමයක්ව 'පුනරුත්' කියා සිද්ධවේ. මේ සන්ධිය සැම තැන්හිම එකාකාර බැවින් 'නියමවිධි' වේ.

'රජ' ශබ්දය ප්‍රථමා විභක්ති බහු වචනයෙහි යොදන්ට වුවමනාකල්හි 'ඕ' 'හු' යන විභක්ති රූප අතුරෙන් සැමවිටම 'හු' පමණක් යොදා 'රජහු' යයි කියනුලැබේ 'ඕ' විභක්තිරූප නොයොදනු ලැබේ.

'බලු' ශබ්දය ප්‍රථමාවිභක්ති එක වචනයෙහි යොදන්ට වුවමනාකල්හි සැමතැන්හිම ශබ්දන්තයෙහි 'උ'කාර ලොප හා 'ල්'කාර ද්විත්වරූප ද කොට 'ආ' යන ප්‍රථමා විභක්ති රූප එකතුකොට 'බල්ලා' කියා සාදනුලැබේ. මේ ආදිය නියම්විදි වේ.

කම්විබත් යමක්වූ 'සිත්කරු' යන්නෙහි 'ක'කාරයාහට කිසිවිටෙක 'ව'කාරදෙශ කොට 'සිත්වරු' කියාද, අන් කිසිවිටෙක 'ක'කාරයාහට පූර්වරූප කොට 'සිත්තරු' කියාද ව්‍යවහාර කරණු ලැබේ.

'මෙසේ මේ පදයාගේ සිද්ධියට එක ක්‍රමයක් නියම නොවන බැවින්, 'අනියමවිධි' නම් වේ.

විශෙෂණ සමාසයක්වූ මහාප්‍රාකාර කියන 'මහ' 'උර' යන ශබ්දවය කිසිවිටක ස්වරාදෙශ සන්ධිකොට 'ම'කාරයාහට පිළිපෙරළි කොට 'මොහොර' කියාත්, අන් කිසිවිටක සන්ධිනොකොට 'මහඋර' කියාත් එක ක්‍රමයක් නියම නොව ව්‍යවහාර වන බැවින් එයද 'අනියමවිධි' නම් වේ.

'නර' 'ඉඳු' යන ශබ්දවයෙන් 'නරන්ඉඳු' යන අර්ථයෙහි සම්බන්ධ විභක්ති සමාසයක් කිව්මනා කල්හි කිසිතැනෙක විභක්තිරූපලොපකොට 'නර' යන ශබ්දය 'ඉඳු' යන්න හා ගළපා පිළිපෙරළි කොට 'නිරිඳු' කියාත්, අන් කිසිතැනෙක්හි සම්බන්ධ විභක්තිරූප සහිතවූ 'නරන්' යන පදය අලුප්තසමාස වශයෙන් 'ඉඳු' යන්න හා ගළපා 'නරනිඳු' කියාත් සමාසයාගේ සිද්ධිය විප්‍රකාරවූ හෙයින් 'අනියම්විදි' නම් වේ.

'ගොන්' යන ශබ්දය කර්මවිභක්ති එකවචනයෙහි යොදන්ට වුවමනා කල්හි කිසි තැනෙක 'ආ' යන විභක්තිරූප එක්කොට 'ගොනා' කියාද, අන් කිසි තැනෙක 'උ' යන රූපය එක්කොට 'ගොනු' කියාද ව්‍යවහාර වේ. මේ ආදිය අනියම්විදි වේ.

## EXCEPTIONAL FORMS.
## අවිද්‍යමාන විධි.

විභක්ති ආශ්‍රයකොට විභක්තිරූප නොගන්නා ශබ්දද, අව්‍යය ශබ්දද, සංස්කෘතාදි භාෂාවලින් සිංහලට ශබ්ද බිඳී එන ක්‍රමය ඉක්ම යෑදී තිබෙන්නාවූ ශබ්දද අවිද්‍යමාන විධි (අවිදුමන්විදි) නම් වේ.

ගුත්තිලදවෙහි:

"ඉඳ ඉඳ එක වෙහෙ ර
විඳ විඳ දහම් මනහ ර
සිඳ බිඳ දුක් සස ර
අනේ දෙව්දත් නුදුටි මොක්පු ර"*

---

* දෙව්දත්, දෙවදත්තතෙරණි; එකවෙහෙර, එක විහාරයෙහි; ඉඳඉඳ, වෙසෙමින්ම; මනහරදහම්, මනොහර ධර්ම (රස)ය; විඳවිඳ, විඳිමින් හෙවත් ලබමින්ම; සසර දුක්, සංසාරදුඃඛය; සිඳබිඳ, ඡින්නභින්නකොට; මොක්පුර නුදුටි, නිර්වාණපුරය නුදුටුවෙය්ය; අනේ. අද්‍යෙමය.

කව්සේකරයෙහි:

"දැක වෙදු ලෙඩ තර ම්
කරණ විලසින් ගිනිය ම්
එසොරුට හිමි උතු ම්
කරවි වරදට සුදුසු දඬුව ම්"*

මේ කවි දෙකින් පළමුවෙනි කවෙහි වෙහෙර, දහම්, දුක්, සසර, දෙව්දත්, මොක්පුර, යනා පද හා දෙවෙනි කවෙහි ලෙඩ තරම්, ගිනියම්, හිමි, දඬුවම් යනා පදත් විභක්ති ආශ්‍රයකොටද කිසි විභක්ති රූපයක් නොගෙණ ප්‍රකෘතියෙන් සිටිනා බැව් පෙණේ. එබැවින් අවිද්‍යමාන විධි වේ.

'සුදඅන්' ආදිය සිංහලට ශබ්ද බිදෙන විදිය ඉක්ම සෑදී තිබේ.

අන්තඃපුර කියන 'ශුද්ධාන්ත' ශබ්දය සිංහලට බිදෙනකල 'හ'කාරාගමයක්ව 'සුදහන්' කියා හෝ ස්වර ලොපකොට 'සූදන්' කියා හෝ සිඬනොව 'සුදඅන්' කියා සෑදුන බැවින් අවිද්‍යමාන විධි නම් වේ.

ශක්‍රයන්ගේ පාණ්ඩුකම්බල ශෛලාසනය කියන 'පඬු ඇඹුල්' ශබ්දය සෑදෙනකල්හි 'පඬු' ශබ්දය හා 'ඇඹුල්' ශබ්දය පූර්වස්වරලොපසන්ධි කොට 'පඬැඹුල්' කියා නොසෑදුන බැවින් එයද අවිද්‍යමාන විධිනම් වේ.

---

* වෙදු, වෛද්‍යයා; ලෙඩතරම්, රෝගයාගේ ප්‍රමාණය; දැක, දර්ශනයකොට; ගිනියම්, අග්නිකර්මය; කරණ විලසින්, කරන්නාවූ පරිද්දෙන්; එසොරුට, ඒ චොරයාට; උතුම්, උත්තමවූ; හිමි, ස්වාමිතෙම; වරදට සුදුසු, වැරද්දට යොග්‍යවූ; දඬුවම්, දණ්ඩකර්මයක්; කරවි, කරවූයේය.

# XVI.

## THE USE OF

# THE LETTER 'හ' (H)

# 'හ'කාර ව්‍යවහාරය.

ආදෙශ හකාරය, ආගම හකාරය, ප්‍රකෘති හකාරයයි සිංහල භාෂාවෙහි 'හ'කාරයාගේ ව්‍යවහාරය ත්‍රිවිධ වේ.

'ආදෙශ හකාරය' නම් භාෂාවෙහි බොහෝතැන පෙණෙන 'ස'කාරය වෙනුවට ආදෙශවූ 'හ'කාරයයි.

උදාහරණ:

සතුරු = හතුරු
සල් = හල් (එනම් ගසක්)
සැලි = හැලි(භාජනවිශෙෂයක්)
සැමි = හැමි (ස්වාමියා)
සාවා = හාවා
සිටි = හිටි
සිඹ = හිඹ
සිස් = හිස්
පසන් = පහන්(සතුටු) ආදියයි.

'ආගම හකාරය' නම් සංස්කෘත මාගධී භාෂාවලින් බින්නාවූ සමහර ශබ්දයන්ට ආගම වශයෙන් ලැබී තිබෙන මාතෘභාෂාවන්හි නැති 'හ' කාරයෙකි. ආගම වශයෙන් 'හ'කාරයක් සමහර සිංහල ශබ්දයන්ට ලැබී තිබෙන්නේ ඒ ශබ්දයන් බිනානාවූ මූලශබ්දයන්ගේ යම් කිසි මහාප්‍රාණාක්ෂරයක් * නිසායි.

* මහාප්‍රාණාක්ෂර සෑදී තිබෙන්නේ අල්ප ප්‍රාණාක්ෂරයට 'හ'කාරයක් එක්වීමෙනි. උදාහරණ:—

ඛ = ක්+හ්+අ
ඝ = ග්+හ්+අ
ඡ = ච්+හ්+අ
ඣ = ජ්+හ්+අ

උදාහරණ:

| සංස්කෘත: | සිංහල: |
|---|---|
| අන්තර්ධාන | අතුරුදහන් (නොපෙණීයාම) |
| රාජධානි | රජදහන් |
| ධ්‍යාන | දහන් |
| ධාරා | දහර |
| මධ්‍යස්ථ | මැදහත් |
| ශ්‍රද්ධා | සැදැහැ |
| සිද්ධාර්ථ | සිදුහත් (එනම් කුමරු හෝ අබ) |
| සද්ධර්ම | සදහම් |
| භස්මන් | බහස්ම (අලු) |

| මාගධී: | සිංහල: |
|---|---|
| අජ්ඣාසය | අදහස් |
| කම්මට්ඨාන | කමටහන් |
| ඵස්ස | පහස් |
| සණ්ඨාන | සටහන් |

'නිදීස' ශබ්දයෙන් බිනානාවූ 'නිදහස්' ආදි කිසි ශබ්දයෙක්හි 'හ'කාරය මූලභාෂාවෙහි ශබ්දයාගේ මහාප්‍රාණාක්ෂරයක් හේතුකොටගෙණවූ ආගමයක් නොව ස්වරය නිසාවූ ආගමයි.

'ප්‍රකෘති හකාරය' නම් ආදේශ විධියෙන්වත් ආගම විධියෙන්වත් නොලැබුනාවූ ප්‍රකෘතියෙන්ම සිටිනා 'හ'කාරයයි. 'හල' යනු මීට උදාහරණයි. කෘදන්තයක්වූ මෙහි 'හ'කාරය 'හර' යන ධාතුවෙහි පටන් සිටින්නේය.

තවත් උදාහරණ: මහත්, හඬ, හොරු, හිවි (උෂ්) ආදියයි. හඬ, හොරු, ආදි කිසි ශබ්දයෙක්හි 'හ'කාරය ලොප්කොට ඇතම් තැන අඬ, ඔරු නියාද ව්‍යවහාර කරණු ලැබේ.

'අඤ්ජන' ශබ්දයෙන් බිනානාවූ 'අඳුන්' ශබ්දයද, 'ආරුඪ' ශබ්දයෙන් බිනානාවූ 'අරුණු' ශබ්දයද, 'අද්‍ය' (මේ දවස්හි) ශබ්දයෙන් හෝ 'ආද්‍රී' (තෙත්වූ) ශබ්දයෙන් බිනානාවූ 'අද' ශබ්දයද, 'ඔජස්' ශබ්දයෙන්

භින්නවූ 'ඔද' ශබ්දයද යන මේ ආදිය 'අඩ' 'ඔරු' ආදිය මෙන් 'හ'කාරයක් තිබී ලොප්වූ ශබ්දයයි නොසිතියයුතු. ප්‍රකෘතියෙන්ම ප්‍රාණාක්ෂර සහිත ශබ්දයි.

හමු, අමු; හැකිල, ඇකිල; හසර, අසර; ආදියෙහි 'හ'කාර රහිත ශබ්ද 'හ'කාර සහිත ශබ්දයන්ගේ 'හ'කාරය ලොප්වීමෙන් සෑදෙනලදැයි නොසිතිය යුතු. 'හ'කාර සහිත ශබ්දයන්ගේ 'හ'කාරය 'ස' කාරයටවූ ආදේශයෙකි. 'හ'කාර රහිතව 'අ'කාරය මුල්කොට පෙණෙන 'අමු' ආදි ශබ්දයන්ගේ 'අ' කාරය උපසර්ගයෙකි. ඒ බව මතු දක්වන පාඨයෙන් පැහැදිලිව පෙණේ.

| සිංහල: | සංස්කෘත: | සිංහල: | සංස්කෘත: |
|---|---|---|---|
| හමු (සමු) | = සම්මුඛ | අමු | = ආමුඛ* |
| හැකිල(සැකිල) | = සඞ්කුචිත | ඇකිල | = ආකුංචිත |
| හසර (සසර) | = සංචාර | අසර | = ආචාර |
| හැරුඹ (සැරුඹ) | = සංරම්භ † | ඇරුඹ | = ආරම්භ |
| හසල (සසළ) | = සංචරිත | අසළ | = ආචරිත |

කිසි තැනෙක්හි සංස්කෘතාදියෙහි 'හ'කාරයක් නැති ශබ්දයන්ගෙන් භින්නවූ සිංහල ශබ්ද 'හ'කාර සහිතවද, 'හ'කාරයක් ඇති ශබ්දයන්ගෙන් භින්නවූ ශබ්ද 'හ'කාර රහිතවද, භාෂාවෙහි ව්‍යවහාර වේ.

උදාහරණ:

| සිංහල: | සංස්කෘත: |
|---|---|
| හත් (අවරගිර) | අස්ත |
| අත් | හස්ත |
| හුණු ‡ | උෂ්ණ |
| හුණ ‡ | වෙණු |

* ප්‍රස්තාවනා හෙවත් නාටකාරම්භය.

† කෝපය වේගය හෝ උත්සාහය.

‡ හුණු, හුණ යන ශබ්ද ව්‍යභිචාර නොව 'උණු' 'උණ'යයි කියාද බොහෝවිට ව්‍යවහාර කරණු ලැබේ.

මේ විධිය පිළිබඳව 'සිදත් සඟරා' නම් ව්‍යාකරණ කර්තෘහු විසින් ව්‍යක්තයන්ගේ පාඨයන්හි '**ව්‍යභිචාර දර්ශනයෙන්**' (වියබිසර දස්නෙන්) **අනියම්විදී** ද සලකාණ පිණිස උගන්වනලදී.

## XVII.

### PROPER USE OF

# NASALS, LINGUALS &c.

# අනුනාසික මූර්ධජාදි

### අක්ෂරයන්ගේ යෝග්‍ය ව්‍යවහාරය.

### අනුනාසික.

ඞ්, ඤ්, ණ්, න්, ම්, යන අනුනාසිකාක්ෂර ඒ ඒ වර්ගයේ අක්ෂරයන්ට පූර්වයෙහිද, අනුස්වාරය අන්තඃස්ථ සහ ඌෂ්මාක්ෂරයන්ට පූර්වයෙහිද ලියනු ලැබෙත්.

යම් වර්ගයක අක්ෂරයකට පූර්වයෙහි අනුරූප ලෙස එම වර්ගයේ අන්ත්‍යාක්ෂරය මිස අන්‍ය වර්ගයක අනුනාසිකාක්ෂරයක් සංයෝග නොකටයුතු.

උදහරණ:

| ඞ් | ඤ් | ණ් |
|---|---|---|
| ලඞ්කා | කාඤ්චන (කාචන) ‡ | කකණ්ටක ‖ |
| පඞ්ක්තිය | සඤ්චාර (සචාර) | නිඝණ්ටු ** |
| චඞ්ක්‍රමණය* | ලාඤ්ඡන (ලාඡන) | කණ්ඨය |
| සඞ්ඛ්‍යාව | සඤ්ඣනන (සඣනන) § | කාණ්ඩය |
| අඞ්ගය † | අඤ්ජන (අජන) | මණ්ඩලය |
| ගඞ්ගාව | කුඤ්ජය (කුජය) ¶ | භාණ්ඩාගාරය |
| සඞ්ඝයා | විඤ්ඤාණ | පණ්ඩිත |

* සක්මණ — † ශරීරය
‡ රත්රන් — § වැසුනාවූ
¶ ලතාගුම්බ හෝ ඇත්දත එක්කෝ හස්තින්ගේ හනුව — ‖ කටුස්සා
** ශබ්දකෝෂ හෙවත් නිඝණ්ඩු

| න් | ම් | ං |
| --- | --- | --- |
| අනන්ත | චම්පක † | සංයෝග |
| කාන්තා | සම්පූර්ණ | සංරක්ෂණ |
| ග්‍රන්ථය | සම්ඵුල්ල § | සංලක්ෂණ |
| සුන්දර | සම්බන්ධ | සංවත්සර ‖ |
| සුගන්ධ | කුම්භකාර | වංශය |
| බන්ධන | ගම්භීර | හිංසාව |
| භින්න * | සම්මාන ¶ | සිංහයා |

අනුස්වාරය පමණක් කිසිවිටක අන්‍ය අනුනාසිකාක්ෂරයක් වෙනුවටද ලියනු ලැබේ. එබැවින් ‘ලංකා’ ‘සංචරිත’ ආදිය කිසිතැනෙක්හි ව්‍යවහාර වෙයි.

ගංතෙර, උමංද, රන්වන්, දන්වැට, ගිම්කල්, ගම්දැරි, දුම්කොල, බිම්ගේ ආදි සිංහල සමාස පදයන්ගේ පූර්ව පදාන්තයෙහි අනුනාසිකාක්ෂරය පසු පෙදෙහි මුලකුර බලා ඒ වර්ගයෙහි අනුනාසිකාක්ෂරයට නොපෙරළෙයි.

## ‘ණ’කාරය.

පදාන්ත නුවූ ‘න’කාරයට පූර්වයෙහි එම පදයෙහි ඍ, ඎ, ර්, ෂ්, යන මොවුන්ගෙන් කිසි අක්ෂරයක් ඇති කල්හි ඒ ‘න’කාරයට ‘ණ’කාරාදේශවෙයි. ඍ, ඎ,, ර්, ෂ්, යන මොවුන් නිසා ‘න’කාරයට ‘ණ’ කාරාදේශ වනකල්හි ඒ අතරට පැමිණෙන යම් ප්‍රාණාක්ෂරයක් හෝ කණ්ඨජාක්ෂරයක් හෝ ඔෂ්ඨජාක්ෂරයක් හෝ ‘ය’කාරයක් ‘ව’කාරයක් හෝ අනුස්වාරය හෝ ඊට බාධා නොකෙරේ. නුමුත්

* බිඳුනාවූ
† සපුගස්
§ පිපුනාවූ
¶ ගෞරව
‖ අවුරුද්ද

තාලුජ දන්තජාදි අක්ෂරයක් අතරට පැමිණි කල්හි එසේ 'න'කාරයට 'ණ'කාරාදෙශ නොවේ. *

උදාහරණ:

| | | |
|---|---|---|
| කාරණ | තෘණ | ප්‍රමාණ |
| කාණ්ණ(කණ) | තෘෂ්ණා | ප්‍රාණ |
| කෘෂ්ණ(කළු) | දර්පණ(කැඩපත) | බ්‍රාහ්මණ |
| කර්ණ | දූෂණ(දෝෂය) | රණ |
| ගෘහිණී(ගැහැණී) | පුෂ්කරණී(පොකුණ) | ලක්ෂණ |
| ග්‍රහණ | පොෂණ | ශ්‍රවණ(කණ) |

'අර්චනා'(පූජාව),'දර්ශන'(දැකීම), ආදියෙහි 'ර'කාර 'න'කාරයන්ගේ අනන්තරයෙහි තාලුජාක්ෂර ඇති හෙයින්ද 'වර්ණන' 'අනුවර්තන' ආදියෙහි 'ර'කාර 'න'කාරයන්ගේ අනන්තරයෙහි දන්තජාක්ෂර ඇති හෙයින්ද 'න'කාරයට 'ණ'කාරාදෙශ නොවේ.

පදාන්තයෙහිවූ හල් 'න'කාරයටද 'ණ'කාරාදෙශ නොවෙයි.

උදාහරණ:—නුවරින්, ඇඳුරුන්, මැඳුරෙන්.

ගුණ, ගණ (සමූහය), මණි (මැණික), කොණ, ගණිකා(වෙශ්‍යාව), පාණි(අත), වාණිජ(වෙළඳා), ආදියෙහි 'ණ'කාරය ප්‍රකෘති 'ණ'කාරයයි සැලකියයුතු.

සංස්කෘතාදි භාෂාවන්හි 'ණ'කාර සහිතවූ ශබ්දයන්ගෙන් සිංහලට භිනනාවූ ශබ්දයන්හි මාතෘභාෂාවෙහිවූ 'ණ'කාරයම ව්‍යවහාර කරණු ලැබේ.

---

* ඇතම් කෙනෙක් මේ නියොගය සංස්කෘත වචනයන්ට පමණය, සිංහල වචනයන්හි එපරිද්දෙන් නකාරයට ණකාරාදෙශ නොකටයුතුයයි කියා 'කරණ' 'වපුරණ' යනාදියෙහි ණකාරය දන්තජකොට ලියත්. එසේම ඔව්හු කර්මකාරක අතීතකාලයෙහි යෙදෙන 'බිඳුනේ' 'සැඳුනේ' යනාදි ක්‍රියාවන්හි නප්‍රත්‍යය මූර්ධජකොට ලියත්.

උදාහරණ:

සංස්කෘත බ්‍රාහ්මණ ශබ්දය බමුණු කියා වේ.<br>
,, ප්‍රමාණ ,, පමණ ,,<br>
,, පුෂ්කරණී ,, පොකුණු ,,<br>
,, ග්‍රහණ හෝ ඝ්‍රාණ ගහණ ,,<br>
,, ලක්ෂණ ,, ලකුණු ,,<br>
,, ලවණ ,, ලුණු ,,<br>
,, මණී ,, මිණී ,,<br>
,, තෘණ හෝ තෘෂ්ණා තණ ,,<br>
,, ව්‍රණ හෝ වර්ණ වණ ,,<br>
,, ප්‍රාණ ,, පණ ,,<br>
,, ගෘහිණී ,, ගැහැණී ,,<br>
මාගධී භාණ ,, බණ ,,

## 'ශ'කාරය.

'ච'කාර 'ශ'කාරයන්ට පූර්වයෙන් 'ශ'කාරය මිස 'ෂ'කාර 'ස'කාරයෝ සංයොග නොවෙත්.

උදාහරණ: පශ්චාත්තාප, ආශ්චර්ය, පශ්චිම, නිශ්චල, නිශ්ශෙෂ, දුශ්ශීල.

## 'ළ,කාරය.

ව්‍යවහාර සංස්කෘත භාෂාවෙහි නැති මේ 'ළ'කාරය ඒ භාෂාවෙහි අන්‍ය මූර්ධජාක්ෂර සහිතවූ ශබ්ද වලින් භින්නවූ ශබ්දයන්හි මාතෘ භාෂාවෙහි මූර්ධජාක්ෂරය වෙනුවට ව්‍යවහාර වේ.

උදාහරණ:

සංස්කෘත විඩාල ශබ්දය බළල් කියා වෙයි.<br>
,, ෂොඩශ ,, සොළොස් ,,<br>
,, කිරීට ,, කිරුළු ,,<br>
,, චත්වාරිංශත් ,, සතළිස් ,,<br>
,, තටාක(විල්),, තළා ,,

| | | | | |
|---|---|---|---|---|
| සංස්කෘත | කූටකූට | ශබ්දය | කැකුළු | කියාවෙයි. |
| ,, | ද්‍රවිඩ | ,, | දෙමළ | ,, |
| ,, | කවාට | ,, | කවුළු | ,, |
| ,, | කූට | ,, | කුළු | ,, |
| ,, | කොට්ට | ,, | කොළ | ,, |
| ,, | ක්‍රීඩා | ,, | කෙළි | ,, |
| ,, | දෘෂ්ටිම | ,, | දෙළුම් | ,, |
| ,, | වඩවා | ,, | වෙළඹ * | ,, |

මාගධී භාෂාවෙහි 'ළ'කාර සහිතවූ ශබ්දයන්ගෙන් හා අන්‍ය මූර්ධජාක්ෂර සහිතවූ ශබ්දයන්ගෙන් ද භිනනවූ සිංහල ශබ්දයන්හිද 'ළ'කාරය ව්‍යවහාර කරණු ලැබේ.

| මාගධී ශබ්ද: | ඉන් භිනනවූ සිංහල ශබ්ද: |
|---|---|
| පඨවී | පොළෝ |
| පඨම | පළමු |
| පටිපාටි | පිළිවෙළ |
| පාළි | පෙළ |
| චූළ | සුළු |

'ර'කාර සහිතවූ ධාතුවකින් අතීතකාල ක්‍රියාද සමහර කෘදන්ත පදද සෑදෙන කල්හි බොහෝවිට 'ර'කාරයට 'ළ'කාරාදෙශ වෙයි.

උදාහරණ:

| ධාතුව: | අතීතකාලක්‍රියාව: | කෘදන්ත පදය: |
|---|---|---|
| කර | කෙළේ | කළ |
| හර | හළේ | හළ |
| මර | මෙළේ | මළ |
| අතුර | අතුළේ | අතුළ |
| ප'හර | පහළේ | පහළ. |

* සිංහල භාෂාවේ සමහර ශබ්දයකට අනුනාසිකාක්ෂරයක් කිසිවිට අගම වශයෙන් පැමිණේ. 'වෙළඹ' 'වයඹ' ඊට උදාහරණයි.

| ධාතුව: | අතීතකාලක්‍රියාව: | කෘදන්ත පදය: |
|---|---|---|
| විචර | විචාළේ | විචාළ |
| ගුගුර | ගුගුළේ | ගුගුළ |
| විදුර | වදුළේ | වදුළ |
| වපුර | වපුළේ | වපුළ |
| සමර | සෙමෙළේ | සමළ |

'ණ'කාර 'න'කාරයන් සහ 'ළ'කාර 'ල'කාර යන් මාරුකොට වරද්ද ලිවීමෙන් ශබ්දයන්ගේ අර්ථ විරුද්ධ වේ.

එබැවින් මූර්ධජ දන්තජාක්ෂර මාරුවීමෙන් අර්ථ විරුද්ධවිය හැකිවූ ශබ්දයන් ලියනකල ඒවා භින්න වූ මාතෘ භාෂාවේ ශබ්ද සලකා ඒ අනුසාරයෙන් මූර්ධජ දන්තජාක්ෂර තැබියයුතු.

ඊට උදාහරණ සමහරක් මෙහි දක්වනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| තණ | = | තෘණ හෝ තෘෂ්ණා | අර්ථයි. |
| තන | = | ස්තන (පයොධර) | ,, |
| වණ | = | වර්ණ හෝ ව්‍රණ | ,, |
| වන | = | වනය (කැලෑව) හෝ වන්නාවූ | ,, |
| පණ | = | ප්‍රාණ | ,, |
| පන | = | පුන (නැවත) | ,, |
| කණ | = | කර්ණ හෝ කණවූ | ,, |
| කන | = | කන්නාවූ | ,, |
| ගණ | = | සමූහ | ,, |
| ගන | = | වලාපටලයහෝ ඝනාවූ හෙවත් දැඩිවූ | |
| දළ | = | දෘඪ හෝ දෘඪා | ,, |
| දල | = | ජල හෝ ජ්වාල | ,, |
| කළ | = | කරණලද | ,, |
| කල | = | කාලය හෝ කාලවර්ණවූ | ,, |
| මළ | = | මැරෙණලද | ,, |
| මල | = | කුණු හෝ කුසුම් | ,, |

**ස**මහර ශබ්දයන් මූර්ධජ දන්තජ විශෙෂයක් නො සලකා ව්‍යවහාර කිරීමෙන්ද දොෂයක් නොවේ.

සංස්කෘත භාෂාවෙහි 'ගොල' ශබ්දය සිංහලට භිනාවූ කල 'ගුලි' කියාද මාගධි භාෂාවෙහි එම අර්ථ ඇති 'ගොළ' ශබ්දය සිංහලට භිනාවූ කල 'ගුළි' කියාද වේ. එසේම සංසකෘත භාෂාවෙහි 'එලක' ශබ්දය සිංහලට 'එලු' කියාද, මාගධි භාෂාමෙහි එම අර්ථ ඇති 'එළක' ශබ්දය සිංහලට 'එළු' කියාද කියදෙයි.

කිසි සංසකෘත ශබ්දයෙක්හි 'න'කාර 'ල'කාර ඒ ශබ්ද ප්‍රාකෘත* භාෂාවන්හි ව්‍යවහාරවන කල්හි 'ණ'කාර 'ළ'කාරයන්ට පෙරළෙයි. එබැවින් ඒ ශබ්දයන්ගෙන් සිංහලට භිනාවූ ශබ්දයන් ලියන කලද අනියම වශයෙන් දන්තජ හෝ මූර්ධජ හෝ ලියහැක්කේය.

උදාහරණ:

| | | |
|---|---|---|
| ගුලි = ගුළි | සුලු = සුළු | අන = අණ |
| එලු = එළු | පෙල = පෙළ | නැන = නැණ |

'සවර්ණ' ශබ්දයෙන් භිනාවූ 'රණ' ශබ්දයද 'වර්ණ' ශබ්දයෙන් භිනාවූ 'වණ' ශබ්දයද යනා මේ ආදියෙහි අග වණ හල් වන කල්හි බොහෝ විට 'ණ'කාරය වෙනුවට 'න'කාරය ලියනුලැබේ. 'ළ'කාරය හල්වන කල්හිද එසේමැයි. තවද 'ණ' කාරය හෝ 'ළ'කාරය සාමාන්‍යයෙන් පදයක් පටන්ගන්නා මුල් අකුරක් මෙන් නොපැණේ.

---

* ප්‍රාකෘත භාෂා නම් සංසකෘත භාෂාවෙන් භිනාවූ මහාරාෂ්ට්‍රි ආදි ඒ ඒ දෙශ භාෂායි.

# PARSING

## IN DETAIL.

වාක්‍යයක් ගෙණ එහි සම්බන්ධය හා පදසිද්ධිය දක්වන ක්‍රමය මෙහි උගන්වනු ලැබේ.

සද්ධර්මාලඞ්කාරයෙහි:

"එවේලෙහි වෙළඳුනෝ කියන්නාහු 'එම්බා දිය
"නියෙනි මේ තෙම සෛන්ධව කුලයෙහි උපන් බල
"සම්පන්න අස්පැටවෙක. එබැවින් මොහු අප්‍රමාදව
"පොෂ්‍යයකරව'යි කියා ඒ අස්පැටවා සිටුදියනියන්
"ටම දී තමා යන අස්වෙළඳාමට ගියහ."—

මේ සඞ්කීර්ණ වාක්‍යයෙහි

### ක්‍රියාකාරක සම්බන්ධය.

වෙළඳුනෝ ගියහ.

මේ සඞ්කීර්ණ වාක්‍ය ගර්භයෙහි ඇති අසඞ්කීර්ණ වාක්‍යයන්ගේ ක්‍රියාකාරක සම්බන්ධය.

මේ අස්පැටවෙක් (වේ).

මොහු (ති) පොෂ්‍යය කරව.—

මේ වාක්‍යයෙහි

### විශෙෂණ විශෙෂ්‍ය සම්බන්ධය.

එ=වේලෙහි

කියන්නාහු=වෙළඳුනෝ

1. සෛන්ධව කුලයෙහි උපන් } =අස්පැටවෙක්.
2. බලසම්පන්න }

ඒ=අස්පැටවා

තමා යන=අස්වෙළඳාමට.—

### පද විභාග.

එ: 'වේලෙහි' යන්නට විශෙෂණවූ සර්වනාම පදයි.

වේලෙහි: ස්ත්‍රීලිඞ්ග ආධාරවිභක්ති එකවචනාන්ත නාමපදයි. 'වේල' යනු ප්‍රකෘතියි. 'එහි' යනු ආධා-

ර විභක්ති ඒකවචන රූපයි. 'වේල' යනු 'වෙලා' යන සංස්කෘත කෘදන්ත පදයෙන් භින්නාවූ හෙයින් තද්භව ශබ්ද ප්‍රකෘතියි.

වෙළඳුනෝ: පුංලිඞ්ග ප්‍රථමා විභක්ති බහුවචනාන්ත නාමපදයි. 'ගියහ' යන අපර ක්‍රියාවෙහි උක්ත කර්තෘයි. 'වෙළඳ' යනු ප්‍රකෘතියි. 'ආන' යනු ගෞරව හෝ ආදරාර්ථයෙහි ප්‍රත්‍යයයි. 'වෙළඳ'+'ආන' යනු පූර්වස්වරලොප සන්ධි විධියෙන් 'වෙළඳුන'යි සිද්ධයි. 'ඕ' යනු ප්‍රථමා විභක්ති බහුවචන රූපයි. 'වෙළඳුන'+'ඕ' යනු එම සන්ධි විධියෙන් 'වෙළඳුනෝ'යි සිද්ධයි. 'වෙළඳ' යනු 'වනිජ්' යන සංස්කෘත ශබ්දයෙන් භින්නාවූ තද්භව ශබ්ද ප්‍රකෘතියි.

කියන්නාහු: පුංලිඞ්ග ප්‍රථමා විභක්ති බහුවචනාන්ත අර්ථක්‍රියා පදයි. 'කී' කීමෙහි යන සකර්මක ධාතුයි. 'අන්නා' යනු කර්තෘකාරක කෘදන්ත ප්‍රත්‍යයයි. 'කී'+'අන්නා'='කියන්නා'යි ආගම සන්ධියි. ආගම වූයේ 'ය'කාරයි. ශබ්දධර්මයෙන් ධාත්වන්තයෙහි 'ඊ'කාර හ්‍රස්ව වෙයි. 'හු'යනු ප්‍රථමා විභක්ති බහුවචන රූපයි. 'කී' සංස්කෘත භාෂාවෙහි 'ඛ්‍යා' කථාවෙහි, එක්කෝ 'කථ්' කථාවෙහි යන ධාතුවෙන් භින්නාවූ තද්භව ධාතු ප්‍රකෘතියි.

එම්බා: ආමන්ත්‍රණයෙහි නිපාතයි. 'අමෙහා' යන මාගධී අව්‍යය ශබ්දයෙන් භින්නාවූ තද්භව ශබ්ද ප්‍රකෘතියි.

දියනියෙනි: ස්ත්‍රීලිඞ්ග ආලපන විභක්ති බහුවචනාන්ත නාමපදයි. 'දියනි' යනු ප්‍රකෘතියි. 'එනි' යනු ආලපන විභක්ති බහුවචන රූපයි. 'දියනි'+'එනි'='දියනියෙනි'යි ආගම සන්ධියි, ආගම වූයේ 'ය'කාරයි. ශබ්දධර්මයෙන් 'දියනි' යන

ශබ්දානුශාසනයෙහි 'ඊ'කාර හ්‍රස්ව වෙයි. 'දියනී' යනු සංස්කෘත 'දුහිතෘ' ශබ්දයෙන් බිඳුනාවූ තද්භව ශබ්ද ප්‍රකෘතියි.

මේ: පුංලිඞ්ග ප්‍රථමා විභක්ති ඒකවචන සර්වනාම පදයි.

තෙම: පුංලිඞ්ග ප්‍රථමෛකවචනාද්‍යෝතක නිපාතයි.

සෛන්ධව කුලයෙහි: ආධාරවිභක්ති ඒකවචනාන්ත සමාස නාමපදයි. 'සෛන්ධවකුල' යනු ප්‍රකෘතියි. 'එහි' යනු විභක්ත්‍යාරූපයි. ආගමසන්ධි විධියෙන් 'සෛන්ධව කුලයෙහි'යි සිඬයි. 'කුල' ශබ්දය සංස්කෘත භාෂාවෙහි නපුංසක ලිඞ්ගයි. සිංහල ශබ්දයක් මෙන් සලකණ කල්හි පුංලිඞ්ගයෙහි වැටේ. සෛන්ධවයන්ගේ කුලය='සෛන්ධව කුල'යි. සම්බන්ධ විභක්ති සමාසයි. 'සෛන්ධව' යනු තද්ධිතයි. සින්ධුදෙශයෙහි උපන්නේය යනාර්ථයෙහි 'සින්ධු' ශබ්දයා තද්ධිත ප්‍රත්‍යය වත් කළ කල්හි 'සෛන්ධව'යි සිඬයි.

උපන්: කර්ත්‍රාකාරක ප්‍රත්‍යයෙන් නිෂ්පන්නාවූ කෘදන්ත පදයි. 'අස්පැටවෙක්' යන්නට අභියමින් තබනලද විශෙෂණයි. 'උ'යන උපසර්ගය පූර්වවූ 'පද' ගමන්හි යන ධාතුවෙන් සිඬයි. 'පද' යන ධාතුව සංස්කෘත 'පද්' යන ධාතුව හා සමාන හෙයින් තත්සම ධාතු ප්‍රකෘතියි.

බලසම්පන්න: සමාස නාමපදයි. 'අස්පැටවෙක්' යන්නට අභියමින් තබනලද විශෙෂණයි. 'බලසම්පන්න' යනු කරණ විභක්ති තත්පුරුෂ සමාසයි.

අස්පැටවෙක: පුංලිඞ්ග ප්‍රථමා විභක්ති ඒකවචන සමාස නාමපදයි. 'වේ' යන අධ්‍යාහාර ක්‍රියාවෙන් උක්තයි. 'අස්පැටි'යනු ප්‍රකෘතියි, 'එක්'

යනු එකෙක් හැඟවීමෙහි ප්‍රත්‍යයයි. 'අස්පැටි' + 'එක්' = 'අස්පැටවෙක්' යනු ආගමසන්ධි හා 'ට'කාරයාහට පිළිපෙරළියි. පදන්තයෙහි 'අ'කාරය වාක්‍යසමාප්තිය හැඟවීම පිණිසයි. අසුන්ගේ පැටි='අස්පැටි'යි සම්බන්ධ විභක්ති සමාසයි. 'අස්' යනු සංස්කෘත 'අශ්ව' ශබ්දයෙන් බිනානාවූ තද්භව ශබ්ද ප්‍රකෘතියි. 'පැටි' යනු සංස්කෘත 'පොත' ශබ්දයෙන් බිනානාවූ තද්භව ශබ්ද ප්‍රකෘතියි.

එ: 'බැවින්' යන්නට විශේෂණවූ සර්වනාම පදයි.

බැවින්: පුංලිඞ්ග කරණ විභක්ත්‍යන්ත නාම පදයි. 'බැව්' යනු ප්‍රකෘතියි. 'ඉන්' යනු කරණවිභක්ති රූපයි. 'බැව්+'ඉන්'='බැවින්' කියා ස්වරසන්ධි වේ. 'බැව්' යනු සංස්කෘත භාෂාවෙහි 'භාව' ශබ්දයෙන් හිනානාවූ තද්භව ශබ්ද ප්‍රකෘතියි.

මොහු: පුංලිඞ්ග කර්මවිභක්ති එකවචනාන්ත සර්ව නාම පදයි. 'කරව' යන විධික්‍රියාවෙහි ප්‍රකෘති කර්මයි. 'මෙ' යනු ප්‍රකෘතියි. 'හු' විභක්ති රූපයි. පදය 'හු' විභක්ත්‍යන්ත කල්හි 'ම'කාරයට පිළිපෙරළි වෙයි.

අප්‍රමාද: පුංලිඞ්ග එක වචන සමාස නාමපදයි. 'ව' යන පූර්වක්‍රියාවෙහි කර්තෘයි. 'අ'යනු අව්‍යයයි, 'ප්‍රමාද' යනු කෘදන්ත නාමයි. ප්‍රමාද නොවන්නේ='අප්‍රමාද'යි. තත්පුරුෂ සමාසයි, එක්තෝ සිංහලෙහි අව්‍යය සමාසයි. 'ප්‍රමාද' යනු 'ප්‍ර'යන උපසර්ගය පූර්වවූ 'මද්' මත්වීමෙහි හෝ මුළාවීමෙහි යන ධාතුව කෘදන්ත ප්‍රත්‍යයවත් කොට සිඩයි.

ව: කර්තෘකාරක පූර්වක්‍රියායි. 'අප්‍රමාද' යනු කර්තෘයි. 'වූ'වීමෙහි යන අකර්මක ධාතුහට පූර්වක්‍රියා 'අ' ප්‍රත්‍යය එක්කොට පූර්වස්වරලෝප සන්ධිකළ කල්හි 'ව' කියා සිඩයි. 'වූ' සංස්කෘත

භාෂාවෙහි 'භූ' වීමෙහි යන ධාතුවෙන් භිනනවූ තද්භව ධාතුප්‍රකෘතියි.

පොෂ්‍යය: පුංලිඞ්ග කර්ම විභක්ති ඒකවචනාන්ත කෘදන්ත නාම පදයි. 'කරව' යන විධික්‍රියාවෙහි විකෘති කර්මයි 'පොෂ්‍ය' ප්‍රකෘතියි. 'අ' විභක්ති රූපයි. 'ය'කාරය ආගමයි.* 'පුෂ්' පොෂණයෙහි යන සංස්කෘත ධාතුව කෘදන්ත ප්‍රත්‍යයවත් කොට 'පොෂ්‍ය'යි සිද්ධයි.

කරව: මධ්‍යම පුරුෂ කර්තෘකාරක ඒකවචන විධි ක්‍රියායි. 'නුඹ' අධ්‍යාහාර කර්තෘයි. 'කර' කිරීමෙහි යන සකර්මක ධාතුයි, 'අ' විධික්‍රියා ප්‍රත්‍යයයි. ධාතු ප්‍රත්‍යය මධ්‍යයෙහිවූ 'ව'කාරය ආගමයි, 'කර' යන ධාතුව මෙහි විකර්මකයි. මේ ධාතුව මාගධී භාෂාවෙහි 'කර' කිරීමෙහි යන ධාතුව හා සමානවූ හෙයින් තත්සම ධාතු ප්‍රකෘතියි.

සි: සඞ්කීර්ණ වාක්‍යගර්භයෙහි අන්‍ය වාක්‍යයන් ගැළපීමෙහි නිපාතයි.

කියා: කර්තෘකාරක පූර්වක්‍රියායි. 'වෙළඳනෝ' මෙහි කර්තෘයි. 'එම්බා' යන තැන පටන් 'කරව' යන තැන් දක්වා වෙළඳනන්ගේ කථාව මේ ක්‍රියාවෙහි කර්මයි. 'කී' කීමෙහි යන සකර්මක ධාතුයි. 'ආ' පූර්ව ක්‍රියා ප්‍රත්‍යයයි. 'කී' යන ධාතුවට 'ආ' යන ප්‍රත්‍යය එක්කාරණ කල්හි ශබ්ද ධර්මයෙන් ධාතුවෙහි ඊකාර හ්‍රස්වවීම හෙවත් මාත්‍රා හානියද 'ය'කාරාගමද වෙයි. 'කී'

---

* සංස්කෘත මාගධ ශබ්ද සිංහල භාෂාවෙහි ව්‍යවහාරවන කල්හි බොහෝවිට ශබ්දාන්තයට 'ය'කාර හෝ 'ව'කාර ආගම වෙත්.

උදාහරණ: යක්ෂ, යක්ෂයා; පණ්ඩිත, පණ්ඩිතයා; ආචාර්ය, ආචාර්යයා; ගෘහ, ගෘහය; රාජ්‍ය, රාජ්‍යය; භූත, භූතය.

මාතෘ, මාතෘව; දුහිතෘ, දුහිතෘව; ක්‍රියා, ක්‍රියාව; ශාලා, ශාලාව; සේනා, සේනාව.

යන ධාතුවෙහි ප්‍රකෘති විභාග යට දක්වනලද ජේමැයි.

ඒ: 'අස්පැටවා' යන්නට විශේෂණවූ සර්වනාම පදයි.

අස්පැටවා: පුංලිංග කර්මවිභක්ති ඒකවචනාන්ත සමාස නාමපදයි. 'දී' යන පූර්වක්‍රියාවෙහි කර්ම කාරකයි. 'අස්පැටි' යනු ප්‍රකෘතියි. 'ආ' යනු කර්මවිභක්ති ඒකවචන රූපයි. විභක්ති රූප එක්කරණ කල්හි ශබ්ද ධර්මයෙන් 'ට'කාරයා හට පිළිපෙරළි හා 'ව'කාරාගමද වේ. අසුන්ගේ පැටි='අස්පැටි'යි සම්බන්ධ විභක්ති සමාසයි. 'අස්' හා 'පැටි' යන ශබ්දයන්ගේ ප්‍රකෘති විභාග යට දක්වනලද ජේමැයි.

සිටුදියණියන්ට: ස්ත්‍රී ලිංග සම්ප්‍රදාන විභක්ති බහුවචනාන්ත සමාස නාමපදයි. ගෞරවාර්ථයෙහි බහුවචනයි. 'දී' යන පූර්වක්‍රියාවට සම්ප්‍රදාන කාරකයි. 'සිටුදියණි' යනු ප්‍රකෘතියි. 'අන්ට' යනු විභක්ති රූපයි. විභක්තිරූප එක්කිරීමෙහිදී ශබ්ද ධර්මයෙන් 'සිටුදියණි' යන ශබ්දාන්තයෙහි 'ඊ'කාර හ්‍රස්වවීමද 'ය'කාරාගමද වේ. සිටුහුගේ දියණි='සිටුදියණි'යි සම්බන්ධ විභක්ති සමාසයි. 'සිටු' සංස්කෘත භාෂාවෙහි 'ශ්‍රේෂ්ඨින්' යන ශබ්දයෙන් භිනානවූ තද්භව ශබ්දප්‍රකෘතියි. 'දියණි' යන ශබ්දයාගේ ප්‍රකෘති විභාග යට දක්වනලද සේමැයි.

ම: අවධාරණයෙහි හෙවත් නිශ්චයාර්ථයෙහි නිපාතයි.

දී: කර්තෘකාරක පූර්වක්‍රියායි. 'වෙළඳුනෝ' මෙහි කර්තෘයි. 'අස්පැටවා' යනු කර්මයි. 'ද' දීමෙහි යන සකර්මක ධාතුයි. 'ඊ' පූර්වක්‍රියා ප්‍රත්‍යයයි. 'ද' යන ධාතුවට 'ඊ' ප්‍රත්‍යය එක්කරණ කල්හි පූර්වස්වරලෝප සන්ධිව 'දී' කියා සිඩයි. 'ද' යන

ධාතුව සංස්කෘත මාගධ දෙක්හි 'දා' ද්‍රමෙයේ යන ධාතූන් හා සමාන හෙයින් තත්සම ධාතු ප්‍රකෘතියි.

තාමා: පුංලිඞ්ග කර්තෘවිභක්ති ඒකවචනාන්ත නාමපදයි. 'යන' යන කෘදන්තයාගේ කර්තෘයි. 'තාම' යනු ප්‍රකෘතියි. 'ආ' යනු විභක්ති රූපයි. පූර්වස්වරලොප සන්ධි විධියෙන් 'තාමා'යි සිද්ධයි. 'තාම' යනු සංස්කෘත භාෂාවෙහි 'ආත්මන්' ශබ්දයෙන් බිඳුනාවූ තද්භව ශබ්ද ප්‍රකෘතියි.

යන: කර්මකාරක ප්‍රත්‍යයෙන් නිෂ්පන්නවූ කෘදන්ත පදයි. 'අස්වෙළඳුමට' යන්නට අනියමින් තබනලද විශෙෂණයි. 'යා' යාමෙහි යන සකර්මක ධාතුවෙන් පරව කර්මකාරකයෙහි 'අන' ප්‍රත්‍යය කොට පූර්වස්වරලොප සන්ධිකළ කල්හි 'යන'යි සිද්ධවේ. 'යා' යන ධාතුව සංස්කෘත මාගධ දෙක්හි 'යා' යාමෙහි යන ධාතූන් හා සමාන හෙයින් තත්සම ධාතු ප්‍රකෘතියි.

අස්වෙළඳුමට: පුංලිඞ්ග සම්ප්‍රදාන විභක්ති ඒකවචනාන්ත සමාස නාමපදයි. 'පිණිස' යන නිපාතය යොග්‍යස්ථානයෙහි සම්ප්‍රදානයි. 'අස්වෙළඳුම්' යනු ප්‍රකෘතියි. 'අට' යනු විභක්තිරූපයි. 'අස්වෙළඳුම්'+'අට='අස්වෙළඳුමට'යි ස්වරසන්ධියි. අසුන්ගේ වෙළඳුම්='අස්වෙළඳුම්' සම්බන්ධ විභක්ති සමාසයි. වෙළඳුන්ගේ කම් (කර්ම)= 'වෙළඳකම්' මෙයද සම්බන්ධ විභක්ති සමාසයි. 'වෙළඳ'+'කම්' යනු ගාත්‍රාක්ෂර ලොපසන්ධි විධියෙන් ගළපන කල්හි ශබ්ද ධර්මයෙන් 'ද' කාරයා වෙත සිටි 'අ'කාරයාහට මාත්‍රාවෘද්ධි වෙයි. 'අස්' ශබ්දයෙහි හා 'වෙළඳ' ශබ්දයෙහිද ප්‍රකෘති විභාග යට දක්වනලද සේමැයි. 'කම්' යන ශබ්දය සංස්කෘත භාෂාවෙහි 'කර්මන්' යන ශබ්දයෙන් බිනනාවූ තද්භව ශබ්ද ප්‍රකෘතියි.

ගියහ: 'ප්‍රථම පුරුෂ කර්තෘකාරක අතීතකාල බහුවචන* අපරක්‍රියායි.† 'වෙළඳුනෝ' යනු මේ ක්‍රියාවෙන් උක්තකර්තෘයි. 'ගියහ' යන ක්‍රියා පදනතයෙහි 'හ' යන්න බහුවචන දක්වන පිණිසයි. 'යා' ගමන්හි හෝ 'ගම්'ගමන්හි යන ධාතුවෙන් සිඩයි.† 'යා' හෝ 'ගම්'යන ධාතු තානම ධාතු ප්‍රකෘතියි.

ගුත්තිලදවෙහි:—

මෙන් රිවිසඳ කිර ණ
දවරැ දිලෙන මෙදෙර ණ
ඔහු තෙදණ සොමිගු ණ
කෙළෙ මුළු ලොවට වැඩ අපම ණ ‡

යන කවෙහි පද විභාගාදිය මෙහි මතු දක්වනු ලැබේ.

## ක්‍රියා කාරක පද සම්බන්ධය.

'තෙදණ සොමිගුණ වැඩ කෙළේ.'

## විශෙෂණ විශෙෂ්‍ය සම්බන්ධය.

දවරැ මෙදෙරණ දිලෙන—රිවිසඳ
රිවිසඳ—කිරණ
ඔහු— { 1 තෙදණ / 2 සොමිගුණ }
මුළු—ලොව
අපමණ—වැඩ

---

* ආදර හෝ ගෞරව පිණිස යම් නාමයක් බහුවචනයෙහි යෙදුවහොත් ඔහු සම්බන්ධ ක්‍රියාව හා එම අප්‍රධාන ව්‍යාචාර්‍ය්‍යවූ අන්‍ය නාමද බොහෝසෙයින් බහුවචනයෙහි යොදනු ලැබෙත්.

† 'ගම්' ගමන්හි යන ධාතුවෙන් සිඩවූ 'ගත' යන සංස්කෘත කෘදන්තයා සමහර ප්‍රාකෘත භාෂාවෙක්හි 'ගයා'යි ව්‍යවහාරවන බැවින් සිංහලෙහි 'ගියා' යන්න එයින් සෑදී බහුවචන දක්වන්ට 'හ' ප්‍රත්‍යය එක්කරණලදැයි සිතන්ටද අවකාශ තිබේ.

‡ මෙහි අන්වය:—දවරැ, දිවාරාත්‍රී දෙක්හි; මෙදෙරණ, මේ පොළොවෙහි; දිලෙන, දිලියෙන්නාවූ; රිවිසඳකිරණමෙන්, සූර්‍ය්‍ය චන්ද්‍ර රශ්මීන් පරිද්දෙන්; ඔහු, ඒ බඹදත් රජහුගේ; තෙදණ සොමිගුණ, තෙජසින් යුක්ත ආඥා හා සෞම්‍යගුණ; මුළු ලොවට, සකල ලෝකයාට; අපමණ වැඩ කෙළේ, අප්‍රමාණවූ අභිවෘද්ධිය කෙළේයි.

# APPENDIX.

## GRAMMATICAL TERMS.

# උපග්‍රන්ථය.

සිංහල ව්‍යාකරණයෙහි ව්‍යවහාරවූ

## සංඥා නාම.

අක්‍ෂර (අකුරු):—අප විසින් නගන්නාවූ නොයෙක් ආකාර ශබ්ද හැඟවීමට ව්‍යවහාර කරණ නොයෙක් ආකාර රූප හෙවත් ලකුණු අක්‍ෂර නම් වෙත්. උදාහරණ: අ, ආ, ඉ, ඊ.

අනියම විධි (අනියම් විදි):—එකම විධියකට ව්‍යවහාර නොවන්නාවූ සන්ධි, සමාස, විභක්ති ආදිය අනියම විධි නම් වේ. උදා: සිත්තරු=සිත්වරු: නිරිඳු=නරනිඳු.

අව්‍යය (අවිය):—වර නොනැගෙන නිපාත හා උපසර්ග අව්‍යයයි කියනු ලැබේ. උදා: හෝ, යලි, අනු, ඒ.

අවිද්‍යමානවිධි (අවිදුමන්විදි):—විභක්තිරූප නැතිව විභක්ත්‍යර්ථයෙහි යෙදෙන ශබ්දද, අව්‍යයද, සංස්කෘතාදි භාෂාවලින් සිංහලට ශබ්ද බිඳිඑන ක්‍රමයට වෙනස්ව සෑදී තිබෙන ශබ්දදියද අවිද්‍යමානවිධි නම් වේ. උදා: සුදඅත්, පඬු ඇඹුල්.

ආගම (අගම්):—ප්‍රාණක්‍ෂරයක් ආශ්‍රය කොට එය ලොප් නොකොට ගාත්‍රාක්‍ෂරයක් පැමිණීම ආගම නම් වේ. උදා: නොඑක්=නොයෙක්, ගෙඋයන්=ගෙවුයන්.

ආදෙශ (අදෙස්):—වර්ණයක් නොතියා හැර ඒ වෙනුවට අන්‍ය වර්ණයක් තීම ආදෙශ නම් වේ. උදා: සුගඳ=සුවඳ; සොරු=හොරු.

උක්තවීම:—ක්‍රියාවකින් එහි කර්තෘභූ හෝ කර්මය කීම උක්තවීමයි. උදා: **රන්කරුවා** රන්දමක් සාදයි, රන්කරුවා විසින් **රන්දමක්** සාදනු ලැබෙයි

උපසර්ග (උපසග):—ධාතුවක අර්ථය අලඞ්කාරකිරීමටද, බාධාකිරීමටද, එම අර්ථයටම අනුගතවීමට හෝ එය වෙනස්කිරීමටද එහි මුලට එක්කාරණ කුඩා පදයි. උදා: ආ'කාර, ප්‍ර'කාර, වි'කාර, අධි' කාර, උප'කාර, ප්‍රති'කාර.

කාරක (කරු):-යමෙක් හෝ යමක් ක්‍රියා නිෂ්පත්තියට හේතුවූයේද ඒ කාරක නම් වේ. උදා; කුරුල්ලා අත්තෙන් අත්තට පනී.

කර්තෘප්‍රයොග, කර්මප්‍රයොග, භාවප්‍රයොග යන ක්‍රියා ප්‍රභෙදයන්ටද මේ නාම කියනු ලැබේ. උදා: දෙයි, දෙනු ලැබෙයි, දීම.

ක්‍රියා සම්බන්ධ පුරුෂයටද කිසිවිටක මේ නාම කියනු ලැබේ.

කෘදන්ත:—ධාතුවක අගට ප්‍රත්‍යය යොදා සාදාගත් නාමය කෘදන්ත නම් වේ. උදා: පැන්, වැදි, නහනු, පුර.

ක්‍රියා (කිරිය):—යමකින් කිසි පදාර්ථයක් සම්බන්ධ කිරීමක් හෝ විඳීමක් හෝ වීමක් හැඟේද එය ක්‍රියා නම් වේ. උදා: සිටිමි, කරයි, යන්නෙහි.

ක්‍රියා ශබ්ද (කිරියා සද):—ක්‍රියාවෙන් සෑදුණු නාමයෝ ක්‍රියා ශබ්දයි. උදා: නටන්නා, නැටීම.

ගුණ:—යම් ශබ්දයෙකින් නාමාර්ථයක් වර්ණනා කරණු ලැබේද ඒ ගුණ නාම් වේ උදා: සුදු, උස්, මහත්.

ජාති (දූ):—ඉපදීමෙන් ලැබෙන්නාවූ නාමය එක් හෝ බොහෝ දෙනෙක් හෝ බොහෝ දෙයක් අන්තර්ගත වන්නාවූ වර්ගයක නාමය ජාති නාම් වේ. උදා, ඈත්, පොල්.

තද්ධිත:—නාමයක අගට ප්‍රත්‍යය යොදා සාදගත් අන්‍ය නාමය තද්ධිත නම් වේ. උදා: තොපි, නැවි, නැකති.

ද්‍රව්‍ය (දැව්):—ගුණ ආදියට ආධාරවූයේ ද්‍රව්‍ය නම් වේ. උදා; රෙදි, තේ, සිනි.

ද්විත්වරූප (දෙරූ):—එක් වර්ණයක් හෝ පදයක් දෙකක් කිරීම ද්විත්වරූප නම් වේ. උදා: වත්ත (වතු): මල්ල (මලු); සිට සිට; සිටු සිටු.

ධාතු (දා):—ක්‍රියා සෑදෙන මූල ධාතු නම් වේ. උදා: පා (බීමෙහි), කර (කිරීමෙහි).

නාම (නම්):—ප්‍රාණ ලත් නොලත් වෙන වෙන දේ හඳුන්වන ශබ්දයෝ නාම නම් වෙත්. උදා: මිනිස්, වතු, ගල්.

නිපාත (නිපා):—වාක්‍ය සුඛාවබෝධය ආදි කිසි කරුණක් පිණිස එහි මූලට මැදට හෝ අගට වැටෙන්නාවූද නාම හෝ ක්‍රියා නොවූද විචිත්‍රාර්ථ පද නිපාත නම් වේ. උදා: **නැවත** ඇමතියා **ද** රජුකරා ගියේ **ලු**.

නියමවිධි (නියම්විදි):—එකම විධියට ව්‍යවහාර වන්නාවූ සන්ධි සමාස විභක්ති ආදිය නියම විධි නම් වේ. උදා: පුනරුත්, දමෝර.

පද:—විභක්ති හෝ ප්‍රත්‍යයන්ට ආශ්‍රයව වාක්‍යයෙක්හි යොදනලද වචන පද නම් වේ. වාක්‍යයෙක්හි ගැළපූ අව්‍යයයෝ ද පදනාමයට අන්තර්ගත වෙත්. උදා: දරුවෝ, මව්පියන්ගේ, අව'වාද, නො,පිළි'ගණිත්,ද ?

පර රූප (පරරූ):—යම් කිසි ගාත්‍රාක්ෂරයක් ඊට පසු ඇති ගාත්‍රාක්ෂරයේ රූපය ගැණීම පරරූප නම් වෙයි. උදා: දුක්පත්=දුප්පත්, ගොබ්කොල=ගොක්කොළ.

පූර්වරූප (පෙරරූ):—යම් කිසි ගාත්‍රාක්ෂරයක් ඊට පූර්වයෙන් ඇති ගාත්‍රාක්ෂරයේ රූපය ගැණීම

උක්තවීම:—ක්‍රියාවකින් එහි කර්තෘහු හෝ කර්මය කීම උක්තවීමයි. උදා: **රන්කරුවා** රන්දමක් සාදයි, රන්කරුවා විසින් **රන්දමක්** සාදනු ලැබෙයි

උපසර්ග (උපසග):—ධාතුවක අර්ථය අලඞ්කාර කිරීමටද, බාධාකිරීමටද, එම අර්ථයටම අනුගතවීමට හෝ එය වෙනස්කිරීමටද එහි මුලට එක්කාරණ කුඩා පදයි. උදා: ආ'කාර, ප්‍ර'කාර, වි'කාර, අධි' කාර, උප'කාර, ප්‍රති'කාර.

කාරක (කරු):-යමෙක් හෝ යමක් ක්‍රියා නිෂ්පත්තියට හේතුවූයේද ඒ කාරක නම් වේ. උදා; කුරුල්ලා අත්තෙන් අත්තට පනී.

කර්තෘප්‍රයෝග, කර්මප්‍රයෝග, භාවප්‍රයෝග යන ක්‍රියා ප්‍රභෙදයන්ටද මේ නාම කියනු ලැබේ. උදා: දෙයි, දෙනු ලැබෙයි, දීම.

ක්‍රියා සම්බන්ධ පුරුෂයටද කිසිවිටක මේ නාම කියනු ලැබේ.

කෘදන්ත:—ධාතුවක අගට ප්‍රත්‍යය යොදා සාදගත් නාමය කෘදන්ත නම් වේ. උදා: පැන්, වැදි, නහනු, පුර.

ක්‍රියා (කිරිය):—යමකින් කිසි පදාර්ථයක් සම්බන්ධ කිරීමක් හෝ විඳීමක් හෝ වීමක් හැඟේද එය ක්‍රියා නම් වේ. උදා: සිටිමි, කරයි, යන්නෙති.

ක්‍රියා ශබ්ද (කිරිය සද):—ක්‍රියාවෙන් සෑදුනු නාමයෝ ක්‍රියා ශබ්දයි. උදා: නටන්නා, නැට්ම.

ගුණ:—යම් ශබ්දයෙකින් නාමාර්ථයක් වර්ණනාකරණු ලැබේද ඒ ගුණ නම් වේ උදා: සුදු, උස්, මහත්.

ජාති (දූ):—ඉපදීමෙන් ලැබෙන්නාවූ නාමය එක්කෝ බොහෝ දෙනෙක් හෝ බොහෝ දෙයක් අන්තර්ගත වන්නාවූ වර්ගයක නාමය ජාති නම් වේ. උදා, ඇත්, පොල්.

තද්ධිත:—නාමයකා අනට ප්‍රත්‍යය යොද සාදගත් අන්‍ය නාමය තද්ධිත නම් වේ. උදා: තොටි, නැවි, නෑකති.

ද්‍රව්‍ය (දැව්):—ගුණ ආදියට ආධාරවූයේ ද්‍රව්‍ය නම් වේ. උදා; රෙදි, තෙල්, සිනි.

ද්විරූප (දෙරූ):—එක් වර්ණයක් හෝ පදයක් දෙකක් කිරීම ද්විරූප නම් වේ. උදා: වත්ත (වතු): මල්ල (මලු); සිට සිට; සිටු සිටු.

ධාතු (දා):—ක්‍රියා සෑදෙන මූල ධාතු නම් වේ. උදා: පා (බිමෙහි), කර (කිරීමෙහි).

නාම (නම්):—ප්‍රාණ ලත් නොලත් වෙන වෙන දේ හඳුන්වන ශබ්දයෝ නාම නම් වෙත්. උදා: මිනිස්, වතු, ගල්.

නිපාත (නිපා):—වාක්‍ය සුඛාවබෝධය ආදි කිසි කාරණක් පිණිස එහි මූලට මැදට හෝ අගට වැටෙන්නාවූද නාම හෝ ක්‍රියා නොවූද විචිත්‍රාර්ථ පද නිපාත නම් වේ. උදා: **නැවත** ඇමතියා **ද** රජුකරා ගියේ **ය**.

නියමවිධි (නියම්විදි):—එකාම විධියට ව්‍යවහාර වන්නාවූ සන්ධි සමාස විභක්ති ආදිය නියම විධි නම් වේ. උදා: පුනරුත්, දමෝර.

පද:—විභක්ති හෝ ප්‍රත්‍යයන්ට ආශ්‍රයව වාක්‍ය යෙක්හි යොදනාලද වචන පද නම් වේ. වාක්‍ය යෙක්හි ගැළපූ අව්‍යයයෝ ද පදනාමයට අන්තර්ගත වෙත්. උදා: දරුවෝ, මව්පියන්ගේ, අවවාද, නොපිළිගණිත්,ද ?

පර රූප (පරරූ):—යම් කිසි ධාත්‍වාක්ෂරයක් ඊට පසු ඇති ධාත්‍වාක්ෂරයේ රූපය ගැණීම පරරූප නම් වෙයි. උදා: දුක්පත්=දුප්පත්, ගොබ් කොල=ගොක්කොළ.

පූර්වරූප (පෙරරූ):—යම් කිසි ධාත්‍වාක්ෂරයක් ඊට පූර්වයෙන් ඇති ධාත්‍වාක්ෂරයේ රූපය ගැණීම

පූර්වරූප නම් වේ. උදා: සිත්කරු=සිත්හරු, පන්කම්=පන්හාම්.

ප්‍රකෘති (පියවි):—විභක්ති ඈදියට ආශ්‍රවන්ට පෙර පදයන්ගේ මූල ස්වභාව ප්‍රකෘතියයි කියනු ලැබේ. උදා: පා (බිමෙහි); පැන් (වතුර).

ප්‍රත්‍යය (පස):—ප්‍රකෘතියක අගට අර්ථයක් සඳහා එකතුකරණ අකුරු ප්‍රත්‍යය නම් වේ. උදා: කර + ඉ (කරයි); මිනිස් + ආ (මිනිසා), පා + ඇන් (පැන්); තොට + ඉ (තොටි).

ප්‍රත්‍යයාන්ත ශබ්ද (පසරුත්සද):—ධාතුවක හෝ ශබ්දයක අගට ප්‍රත්‍යය එක්කොට සාදගත් නාම ප්‍රත්‍යයාන්ත ශබ්ද නම්වෙත්. උදා: පැන්, තොටි.

ලක්ෂණ (ලකුණු):—යමක් පැහැදිලිකිරීමට එහි ගුණාඞ්ග දැක්වීම ලක්ෂණ නම් වේ.

ලිඞ්ග (ලිගු):—නාමයෙකින් කියනු ලබන්නේ පුරුෂයෙක් ද නොහොත් ස්ත්‍රියක්දැයි වෙනස හැඳිනවීම ලිඞ්ග නම් වේ. උදා: සතුරා, සැතිරි.

ලොප (ලොප්):—පදයක මුල මැද හෝ අග අකුරු නොකියා හැරීම ලොප නම් වේ. උදා: (අ) රන්; ර(ද)දු; පා(ද).

වාක්‍යය (වැකිය):—යම් කිසි සම්පූර්ණ අදහසක් හැඟවීම පිණිස ගළපනලද නාම හා ක්‍රියා සහිත පද සමූහය වාක්‍යය නම් වේ. උදා: ශිෂ්‍යයෝ ගුරුවරයාගේ අණ පිළිපදිත්.

විපර්යාස (පෙරළි):—පදයක එක් ස්වරයක් වෙනුවට අන්‍ය ස්වරයක් ආදේශකිරීම, පදයක ඇති ව්‍යඤ්ජනාක්ෂර දෙකක් ස්ථාන මාරුකිරීම, සමාසවූ පද දෙකක පිළිවෙළ මාරුකිරීම ආදිවූ මූල ස්වභාවයෙන් වෙනස්කිරීම විපර්යාස නම් වේ. උදා: ඉඟෙණ (=උඟෙණ); කොරවළ (=කොළවර): දම්පතී (=පතිදම්).

විභක්ති (විබත්):—නාමයක අගින් සිට එහි අර්ථය නොයෙක් අතට හරවන්නේ නොහොත් බෙදන්නේ විභක්ති නම් වේ. උදා: මිතුරා, මිතුරාට, මිතුරාගෙන්, මිතුරාගේ.

විශේෂණ (වෙසෙසුන්):—යම් කිසි පදාර්ථයක් අවශේෂ පදාර්ථයන්ගෙන් වෙන්කොට දක්වන ගුණවචන විශේෂණ නම් වේ. උදා: **නැණවත්** ඇමතියා.

වෘද්ධි (වැඩි):—පදයක හ්‍රස්ව ස්වරයක් දීර්ඝකොට කිම මාත්‍රාවෘද්ධි නම් වේ. නවාම් (=නවම්)

ව්‍යඤ්ජන:—ස්වරයක උපකාර නැතිව තනිව ශබ්ද කරන්ට අපහසු අකුරු ව්‍යඤ්ජන නොහොත් ගාත්‍රාක්ෂර නම් වෙත්. උදා: ක්, ඛ්, ග්, ඝ්.

ශබ්ද (සද):—විභක්තීන්ට ආශ්‍රයවන්ට පෙර නාමයෝ ශබ්ද නම් වෙත්. උදා: ඇත්, හස්, දිය, රැ.

සන්ධි (සඳ:—ලංවූ පද දෙකකින් මුල පදේ අගයත් අග පදේ මුලත් එකට ගැළපීම සන්ධි නම් වේ. සන්ධි විධියෙන් ලංවූ කෙරවල්වල ඇති අකුරු වලින් පදයන් එකට සංසන්දනය කරණු ලැබේ. උදා: නිලුපුල් (නිල් උපුල්), හිඟුරල (හිඟුරු අල), කාවුවල (කාවු අල).

සමාස (සමස්):—නොයෙක් අර්ථ ඇති පද දෙකක් හෝ වැඩිගණනක් එක්කොට එකාර්ථයක් වන පරිද්දෙන් ගැළපීම සමාස නම් වේ. සමාස විධියෙන් අර්ථය කරණකොටගෙණ පදයන් එකට සංසන්දනය කරණු ලැබේ. උදා: නිලුපුල්, ඇත් දත්, සුන්තුරු.

සර්වනාම:—සියල්ලන්ටම ව්‍යවහාරකළහැකි නාම සර්වනාමයයි කියනුලැබේ. උදා: අපි, තොපි, ඔව්හු.

සඞ්ඛ්‍යාව:—නාම හා ක්‍රියා සම්බන්ධ ඒකාර්ථ භාවය හෝ බහ්වර්ථ භාවය හඟවන්නේ සඞ්ඛ්‍යා නම් වේ. උදා: මිනිසා, මිනිස්සු; කරයි, කරත්.

සංඥා (සන්):-යමෙක් හෝ යමක් අවශේෂ වස්තූන්ගෙන් වෙන්කර දැක්වීම පිණිස දෙනලද නාමය සංඥා නම් වේ. උදා: පින්හාමි, ගම්පල.

ශාස්ත්‍රයක් විස්තරකොට ඉගැන්වීමෙහිදී ඊට අවශ්‍යවූ විශේෂාර්ථයන් හඟවන පිණිස ව්‍යවහාර කරණ විශේෂ නාමයෝද සංඥා නම් වෙත්. උදා: ක්‍රියා, සන්ධි, සමාස, ආදි නාම ව්‍යාකරණ ශාස්ත්‍රයෙහි සංඥායි.

නාමය හා ලක්ෂණය දන්වා හෝඩියේ අකුරු හැඳින්වීම පවා සංඥා විධියයි.

සංයෝග:—ස්වර රහිත යම් ව්‍යඤ්ජනයක් අන්‍ය ව්‍යඤ්ජනයකට පූර්වයෙන් සිටින කල්හි එය **සංයෝග** නම් වේ. උදා: ග[**න්**]ධ, කු[ම්]භ, ශු[**ද්**]ධ.

ස්වර (සර):—හුදකලාව ශබ්දකළහැකි අක්ෂරයෝ ස්වර නොහොත් ප්‍රාණාක්ෂර නම් වෙත්. උදා; අ, ආ, ඉ, ඊ.

හල්:—ස්වර රහිත ව්‍යඤ්ජනාක්ෂර හල් නම් වෙත්. උදා: ක්, ග්, ජ්.

හානිය (අඩු):—පදයක දීර්ඝස්වරයක් හ්‍රස්ව කොට කීම මාත්‍රාහානි නම් වේ උදා: මගේ (මාගේ)

---

KOLLUPITIYA PRESS, COLOMBO:



